ශ්‍රී ලංකාවේ දැනට පළවන ඉපැරණිම සිංහල පුවත්පත

ආරම්භය: 1866 ජුනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

2013 විශේෂ නත්තල් අතිරේකය

## ලේඛක, පාඨක ඔබ සැමට සුබ නත්තලක් !

ක්‍රි.ව. 2013 ක් වූ දෙසැම්බර් 22 ඉරිදා 148 වෙළුම 30 කලබ සතිපතා පත්‍රය - පිටු 32 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

03 අභියෝගයක් වන නත්තල

07 අභියෝගවලින් පිරි කිතු උපත

11 නත්තල දේශපාලනය හා මිනිස් ඝාතන

## ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ නත්තල් පණිවුඩය - 2013

නත්තලේ දී අප සමරනුයේ, මාංශගත වීමේ අභිරහස තුළ දෙවියන් වහන්සේ මනුෂ්‍ය ඉතිහාසයට ඇතුළු වීමයි. ඉමහත් ආනන්දයකින් ඉපිලී අපි දෙව් පියාණන් වහන්සේ පසසන්නට හා තුති පුදන්නට ස්වර්ගීය සේනා සමඟ එකතු වෙමු. "දෙවියන් වහන් සේ ලෝකයට කෙතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලෝකයට එවා වදාළ සේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිසය" (ජුවාම් 3:16). ඒ අනුව නත්තලේ දී අප සමරනුයේ දෙව් මහෝත්තමයාණන් වහන්සේ මනුෂ්‍ය වර්ගයා කෙරෙහි වූ ප්‍රේමයේ මහත් ගැඹුරය.

ජේසු සමිඳාණන් වහන්සේ අප මධ්‍යයට පැමිණීම අප හට සුපැහැදිලි ලෙස පෙන්වා දෙන්නේ උන්වහන්සේගේ දිව්‍යමය ජීවිතය බෙදා ගැනීමට අපට මඟ සලසා ඇති බවය. "මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිසය: සපුරාම එය ලැබෙන පිණිසය" (ජුවාම් 10:10). උන්වහන්සේට අවැසි වන්නේ අපගේ මෙලෝ ජීවිතය හැකි තරම් අර්ථාන්විතව ගෙවීම මඟින් උන්වහන්සේ හා අනන්ත ජීවිතයට ඇතුළු වීමයි. මාංශගතවීමේ අභිරහස සැමරීම තුළින් ජේසු සමිඳාණන් වහන්සේ දානය කරන ඒ කැඳවීම අප හට විවෘත වෙයි. එහෙයින් අපගේ නත්තල් සැමරුම හුදෙක් ඓතිහාසිකව උන්වහන්සේගේ උපත සිහි කිරීමක් නොවිය යුතු හා නොකළ යුතු දෙයකි. මන්ද උන්වහන්සේ අදහස් කරනුයේ අප එකිනෙකාගේ පුද්ගලික ජීවිතය තුළ "උපත" ලැබීමයි.

ජේසුස් වහන්සේගේ උපත මනුෂ්‍ය ජීවිතය තුළ පරිවර්තනයක් ඇති කළ සිද්ධියක් විය. ඒ උපත වනාහි යුක්තිය, සාමය හා සහෝදරත්වයේ යුගයක ඇරඹුම විය. එය නාසරතයේ ගවහලක සිදුවූ සරළ උපතක් පිළිබඳ ලෝ පුරා නින්නාද දෙන පණිවුඩය වෙයි. අපි 2013 වසරේත් නත්තල සැමරුව ද ජේසු සමිඳාණන් තමන් වහන්සේගේ උපත තුළින් ගෙනා පණිවුඩය ලෝකය විසින් තවමත් අවබෝධ කොට ගත යුතුව ඇත. අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් මතක් කර දෙන්නේ, ජනතාව අතර යුක්තිය, සාමය හා සහයෝගිතාවය ළඟා කර ගැනීමට නම් ජීවිත පරිවර්තනයේ හා බාධක පරයා යෑමේ අවැසිතාවය පවතින බවයි. තවදුරටත් ශුද්ධෝත්තම පියාණන් අපට මතක් කරන්නේ, ජේසු සමිඳාණන්ව අපගේ "උදාසීන ඉගැන්වීම්"හි සිර නොකොට "ආරම්භක ධර්මධානයේ තිබූ ඒ මූලික නැවුම්භාවය යළි අත්පත්කොට ගැනීම" අවැසි බවයි. විශ්ව එඬේරාණන් ලෙස උන්වහන්සේ නඟන ඒ කාහල නාදය අප කැඳවන්නේ අපගේ ජීවිතවල පූර්ණ වෙනසක් ඇති කර ගන්නටයි. මේ නත්තල ඒ සඳහා ආත්ම සෝදිසියක යෙදෙන්නට කාලයක් විය යුතුය. ඒ තුළින් ජේසු සමිඳාණන් හා අපගේ සබැඳියාව ගැන විමසන්නට හා ධර්මදානයේ සැබෑ ස්ප්‍රීතුව ආශ්‍රණය කොට ගනිමින් මිනිස් දිවිය හා එහි ගරුත්වය ශුද්ධවන්ත ලෙස සලකන, වඩා යුක්ති සහගත හා සාමකාමී මිනිස් සමාජයක් නිර්මාණය කිරීමට අපට ආරාධනය කෙරේ.

සෑම නත්තලක්ම අපගෙන් අයදින්නේ අප ජීවත් වන සමාජය දෙස සැබෑ යථාර්ථවාදී දෘෂ්ඨියක් යොමු කරන්නටයි. අප සමාජය තුළ පවතින විවිධාකාර මිනිස් දුක, වේදනාව ගැන සංවේදී වන්නටත් අප අතර වෙසෙන දිළින්දන් කෙරෙහි දැඩි අවධානයක් දෙන්නට ද නත්තල අපට කැඳවීමක් දානය කරයි. වචනයෙන් විසිතුරු කළ නොහැකි ජීවිතයේ වටිනාකම පහත හෙළන්නට හේතු වන අප තැති ගන්වන විවිධ කාරණා හා අසීමාන්තික නිදහසේ සංස්කෘතියක් අප වසා ගෙන ඇති සේ පෙනෙන්නා වූ තත්ත්වය ගැන අපි අවදි වෙමු. විවිදාකාර දයාවේ ක්‍රියාවන්හි අප නියුක්ත වන අතරම, නත්තල අපට ආරාධනා කරන්නේ දිළින්දන් සැමවිටම පහත හෙළන කාරණා ගැන අපගේ සැලකිල්ල තවදුරටත් ඉදිරියට ගෙන යාමයි. අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් මෑත දී නිකුත් කෙරුණ "ධර්මදානයේ සොම්නස" නම් වූ අපෝස්තලික අනුශාසනා පත්‍රය තුළ "ව්‍යුවහගත පාපය" ගැන සඳහන් කෙරේ. දෙවිඳුන්ගේ ශුද්ධවූ කැමැත්තට එකඟ නොවන සියළු දේ වෙනස් කරන්නට අප මුළු මෙන් කැප වෙමින් සාමය හා සංහිඳියාව ජනිත කරවන මෙහෙකරුවන් බවට පත් වෙමු. ශ්‍රී ලාංකික ජන සමාජය අප සැමට එකාවන් ව ජීවත් වන්නට හැකි වඩා යහපත් තැනක් කිරීමේ කාර්යයට වඩ වඩා කැප වෙමු. ජේසු සමිඳුන් වෙනුවෙන් අපි දෙවිඳුන්ට තුති දෙන අතරම යාච්ඤා කරමු. අප හැමට නැවුම් වූ ආනන්දයක් හා ජේසු සමිඳාණන් යළිත් වරක් අනාවරණය කර ගන්නට හැකි වන ලෙස අයදිමින් අපගේ සියළු විශ්වාසකයින් හට ද අප සහෝදර පුරවැසි සියල්ලනට හා හොඳ හිත් ඇති සියළු දෙනා හට ද ආශිර්වාද ලත් නත්තලක් වේවා යි අපි ප්‍රාර්ථනා කරමු.

✠ **අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ**
සභාපති
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

✠ **අති උතුම් දෙවිශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ**
මහ ලේකම්

## නව ජීවනයෙන් සපිරි නත්තලක් !




**ගෝහල පවසන අම අබිදහමේ රස රහසේ තතු මතු වේවා**
**වෙහෙසෙන බර උසුලන සෝබර දන අබියස රන් තරු බැබලේවා**
**යහපත මනුගත වී ලොවැ දස අත සාමයෙ චාමර සලවේවා**
**නව ජීවනයෙන් සැම දන ජනිතව සැබෑම සුබ නත්තල් වේවා**

**සිතුවම: මර්සලින් හීන්කෙන්ද පැදි රචනා: ගරු මොල්ලිගොඩ මෝසස් පෙරේරා පියතුමා**

**අති උසස් තැන්හී දෙවිඳුන්ට මහිමයද, මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා !**



## මරිමව් තුළින් බිළිඳු සොයා යමු

# අසිරිමත් කිතු උපත පිළිබඳ දිවැසිවරයන් කී අනාවැකි

අප ගැලවුම්කරුවාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අසිරිමත් උත්පත්තිය පිළිබඳව පවතින සුවිශේෂ වූ මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ ශුද්ධවූ බයිබලයයි. ඒ සුපුවත සත්‍ය සිදුවීමකි. නමුත් කිතු උපත සිදුවූ වසර පිළිබඳව විද්වතුන් අතර මතභේද පවතී. ශුද්ධවූ බයිබලයේ පවා දින වකවානු නිශ්චිතව දක්වා නොමැත. හෙරෝද් රජ දවසේ යුදයාවේ බෙත්ලෙහෙම් නගරයේ ජේසු තුමා උපන් බව ශුද්ධවූ මතෙව් තුමා සුවිශේෂයේ සඳහන් කරයි. කිතු උපත පිළිබඳව සඳහන් වන්නේ ශුද්ධවූ මතෙව් හා ශුද්ධවූ ලූක් සුවිශේෂවල පමණි. විශේෂඥයින් බහුතරයකගේ අදහස වන්නේ ක්‍රි. පූ. හයවන වසරේදී පමණ ජේසු උපත සිදු වූ බවයි. කෙසේ වුවද එදා සිට අද තෙක්ම සව්සිරි සපිරි කිතු උපත සැමරීම සඳහා දෙසැම්බර් 25 වන දින යොදා ගෙන ඇත.

දිවැස්වරයන් විසින් දෙවියන් වහන්සේගේ දේව අනාවරණයන් මෙලොවට ප්‍රකාශ කරනු ලැබූ අතර දේව උත්පත්තිය පිළිබඳවද ඊට පෙර දිවැසිවරුන් විසින් අදහස් ප්‍රකාශ කර තිබුණි. දේව පුත්‍රයා මෙලොව ජනිත වූ අති රමණීය කිතු උපත පිළිබඳව සසොබන අනාවරණයක් යෙසායා දිවැස්වරයා විසින් කර ඇත. "සමිඳාණන් වහන්සේ නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න කන්‍යාවක් ගර්භනීව පුත්‍රයකු ලැබ එම්මානුවෙල් යන නාමය ඔහුට තබන්නීය. ඔහු නපුර එපා කොට යහපත තෝරා ගන්ට දැන ගන්නා කල දී කිරිත් මී පැණිත් වළඳන්නේ ය. (යෙසායා 7:14-15) ..... මක්නිසාදයත් ඔහුගේ බර වූ විය ගසද කර මත තැබූ විය දණ්ඩ ද ඔබවහන්සේ කඩා දැමූ සේක.. .... අපට ළදරුවෙක් උපන්නේ ය. එතුමා අපේ රජු වන සේක. උන්වහන්සේගේ නාමය අපූරුය. එතුමාණෝ අසිරිමත් උපදේශකයාණෝ ය. පරාක්‍රමවත් දෙවියන් වහන්සේ ය. සදාතන පියාණෝ ය. සාමයේ කුමාරයාණෝ යැයි කියනු ලබන්නෝය. (යෙසායා 9:4-7) යෙසායා දිවැසිවරයා විසින් එහි එම්මානුවෙල් නමින් සඳහන් කරන්නේ ක්‍රිස්තු තුමාණෝ ය. එම්මානුවෙල් යන්නෙහි අර්ථය නම් දෙවියන් වහන්සේ අප සමඟය යනුය. කිතු දහමේ මූලික හරය ලෙස සැලකෙන සාමය හා පරිත්‍යාගය සමඟින් ජේසු සමිඳාණන්ගේ උත්පත්තිය පිළිබඳව එසේ ප්‍රකාශ විය.

අනාගත බලාපොරොත්තුව පිළිබඳව දිවැසිවර ජෙරමියා ද ප්‍රකාශ කර ඇත. ස්වාමින් වහන්සේ කියන සේක් "පැළැටියක් නැගිටුවන සේ දාවිත්ගේ පෙළපතින් දැහැමි රජ කෙනෙකු නැගී එන කාලය පැමිණෙන්නේ ය.

එතුමාණෝ නැණ නුවණින් රජකරමින් දැහැමි බවත් යුක්තියත් දේශය මුළුල්ලේ ඉටු කරනු ඇත. උන්වහන්සේගේ දවස් වලදී යුදා ගලවනු ලබන්නීය. ඊශ්‍රායෙල් ද සුවසේ වසන්නේ ය. අපේ ධර්මිෂ්ඨකම වූ ස්වාමින් වහන්සේය යන නාමය උන්වහන්සේට කියනු ලබන්නේ ය. (ජෙරමියා 23:5-6)

දිවැසිවර මීකා ද ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය පිළිබඳව ප්‍රකාශ කර ඇත.

"මතු දවස සමිඳුන්ගේ මාලිගාව පිහිටි කන්ද ඉතාම උස කන්ද මෙන් ද සියලු කඳු හෙල් වලට වඩා ඉහළින් ද පිහිටුවනු ලබන්නේ ය. ජනයෝ එය කරා වැල නොකැඩී ගලා එන්නෝ ය. එතුමාණෝ බොහෝ ජනයා විනිශ්චය කොට දුරින් සිටින බලවත් ජාතින් අතර නඩු හබ විසඳන සේක.

ජාතියක් ජාතියකට විරුද්ධව කඩු ගන්නේ නැත. යුද්ධය පුහුණු වන්නේ නැත. ඔවුන්ට කිසි කෙනෙකුගෙන් බියක් නැත. එකිනෙකා තම තමාගේ මිදි වැල යට ද අත්තික්කා ගස යට ද වාසය කරනවා ඇත. (මීකා 4:1-4).

මලාකි දිවැසිවරයා ද ක්‍රිස්තෝත්පත්තිය පිළිබඳව අනාවැකි ප්‍රකාශ කළ අතර ක්‍රිස්තුස් වහන්සේ ජලයෙන් බෞතිස්ම කළ ස්නාවක ජුවාම් තුමා පිළිබඳව එහි සඳහන් වේ. "මෙන්න මාගේ දූතයා එවමි. ඔහු මට පෙරටුව මාර්ගය පහදන්නේ ය. එවිට නුඹලා සොයන ස්වාමින් වහන්සේ හදිසියෙන් තමන් මාලිගාවට එන සේක. නුඹලා ආශා වන ගිවිසුමේ දූතයා එන්නේ යයි සේනාවල ස්වාමින් වහන්සේ කියන සේක....

උන්වහන්සේ රිදී උණු කර පිරිසිදු කරන කෙනෙක් මෙන් සිට ලෙවී පුත්‍රයන් ධර්මිෂ්ඨකමින් ස්වාමින් වහන්සේට පූජා ඔප්පු කරන්නන් ද සිටින පිණිස ඔවුන් පිරිසිදු කර රන් රිදී මෙන් ඔවුන් පවිත්‍ර කරන සේක. (මලාකි 3:1-3)

ශුද්ධවූ මාක් තුමා ගේ සුවිශේෂයේ ද මලාකි දිවැසිවරයා ක්‍රිස්තෝත්පත්තියට පසු බිම සැපයූ ස්නාවක ජුවාම් තුමාගේ ආගමනය පිළිබඳ ඉහත අනාවැකිය සිහිපත් කරයි. "බලව මාගේ දූතයා නුඹට පෙරටුව යවමි. හෙතෙම නුඹේ මාර්ගය සාදන්නේ ය. ස්වාමින් වහන්සේගේ මාර්ගය පිළියෙළ කරව්. උන්වහන්සේගේ මාවත සමතලා කරව් යැයි වනාන්තරයේ හඬ ගසන්නන්ගේ ශබ්දය යැයි කියා අනාගත වක්තෘ වූ යෙසායා ගේ පොතේ ලියා තිබෙන ආකාරයට යොහාන් ආවේය.

ඔව්හු වනාන්තරයේ දී බෞතිස්ම කරමින් පව් කමාව පිණිස පසුතැවිල්ලේ බෞතිස්මය ප්‍රකාශ කළේ ය. ඔහු දේශනා කරමින් මට වඩා බලවත් කෙනෙක් මට පසුව එන සේක. මම නැමී උන්වහන්සේගේ වහන්වල පටිය මුදන්නට වත් නොවටිමි. මම නුඹලා වතුරෙන් බෞතිස්ම කළෙමි. නමුත් උන්වහන්සේ නුඹලා ශුද්ධාත්මයාණන්ගෙන් බෞතිස්ම කරන සේකැයි කීයේය. (ශු. මාක් 1:2-8)

මීට අමතරව ශුද්ධවූ ස්නාවක ජුවාම් තුමාණන්ගේ ආගමනය පිළිබඳ අනාවැකිය (ශු. මතෙව් 3:1-12) (ශු. ලූක් 3:1-17) (ශු. යොහාන් 1:23-27) සුවිශේෂයන්හිද සිහිපත් කර තිබේ.

දිවැසිවර සෙකරියාගේ පොතෙහිද කිතු උපත පිළිබඳව අනාවැකි ඉදිරිපත් කර ඇත. සමාදානයේ කුමාරයාගේ පැමිණීම පිළිබඳව එහි අන්තර්ගතව ඇත.

"සියොන් දියණියනි ප්‍රීති ප්‍රමෝද වන්න,

ජෙරුසලම් දියණියනි, සොම්නස් හඬ නගන්න."

නුඹේ රජ නුඹ වෙතට වඩින සේක. උන්වහන්සේ ධර්මිෂ්ඨය. ගැලවීම ඇත්තාය. උන්වහන්සේ ජයාන්විතව විජයශ්‍රීයෙන් පැමිණෙන සේක.

යටහත් සිතින් කොටළු දෙනකගේ පැටවකගේ පිට නැඟ පැමිණෙන සේක. අශ්වයා ද යුද්ධ දුන්නද සිඳනු ලබන්නේ ය. උන්වහන්සේ ජාතින්ට සමාදානය ප්‍රකාශ කරන සේක. උන්වහන්සේගේ ආණ්ඩුව මුහුදෙන් මුහුදටත් ගංගාවේ පටන් පොළොවේ සීමා දක්වාත් වන්නේ ය. (සෙකරියා 9:9-10)

දිවැස්වරුන්ගේ අනාවැකි සම්පූර්ණ විය. දිව්‍ය ගැලවුම්කාර ජේසු සමිඳුන්ගේ අසිරිමත් උපත මෙසේ සිදු විය. "අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා" (ශු. ලූක් 1:14)

**කැනීෂියස් පලිහවඩන**

# මරිය වසරින් උදාවන නත්තල

නත්තලේ වඩාත් කැපී පෙනෙන දීප්තිමත් චරිතය වනුයේ දිරිය මවක් ලෙස හඳුන්වා දෙන්නට හැකි මරිමවුන්ය. මරි මවුන්ගේ ජීවිතය හරියට කැඩපතක් වැනිය. ජීවිතය වෙත නිවැරදි ආකාරයට බලන්නට, ජීවිතය ගොඩනගා ගන්නට එතුමියගෙන් උකහාගත හැකි දෘෂ්ටිය හා ජීවිත අරුත ඉතා විශාලය.

ගැලවීමේ කාර්යය ක්‍රියාවට නැංවීම සඳහා දෙවියන් වහන්සේ තෝරා ගත්තේ මරි මවුන් ය. මරිය තුමිය ජුසේ තුමා සමඟ විවාහ බස් දී සිටියදී ඇය වෙත පැමිණි දේව දූතයා "මරියාණෙනි, බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ලද්දෙහිය. මේ බලන්න ඔබ පිළිසිඳගෙන පුතකු ලබන්නෙහිය. උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න. කන්‍යාවක් වූ මරියා තම කුසෙහි වැඩෙන බිළිඳකු ගැන කෙසේ අදහා ගන්නද? දේව දූතයාගේ පැහැදිලි කිරීම හමුවේ ඇය දෙවියන් වහන්සේගේ පාරිශුද්ධ පුත්‍රයා ත ම කුසෙහි පිළිසිඳීම වෙනුවෙන් සිත එකලස් කර ගත්තාය. "මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසටම මට ඉටුවේවා. මෙලෙස දෙව් මව්ගේ බැහැපත්කම, ඉවසීම, දෙව් අණට කීකරු වීම කැපී පෙනෙන ලක්ෂණයන් ය. මරිය තුමිය සැමවිටම තමන්ගේ කැමැත්ත මුළුමනින්ම අමතක කොට දේව කැමැත්තට මුල් තැන දුන්නාය. දේව වචනය විශ්වාස කළ ඇය විශ්වාසය තුළම පිළිසිඳ ගත්තීය. මෙලෙස නව ගිවිසුම තුළ දේව සැලැස්ම ක්‍රියාවට නැංවීමේදී මැදහත්කාරිය ලෙස කටයුතු කරන්නේ විමුක්තිදායකයාණන් මෙලොවට ගෙන ඒමටය. මෙලෙස කිතු උපතේ මරිය තුමියගේ භූමිකාව කිසිවකුටත් අමතක කළ නොහැකිය.

මරිය වසරින් උදාවන නත්තල අපට ලැබුණ ඉමහත් භාග්‍යවන්ත අවස්ථාවකි. මරිය තුමිය නිතැතින්ම කිතුනු අපගේ ජීවිතය හා බැඳුන සුවිශේෂී චරිතයකි. එතුමිය ජේසුස් වහන්සේට සවන් දෙමින් දේව කැමැත්ත සොයා ඉටු කරන්නට උත්සාහ කළ ප්‍රථම කිතුනු ශ්‍රාවිකාවිය ද, අපෝස්තුළුවරිය ද බව කිව හැකිය. සභා ආරම්භයේ දී ජේසු සමිඳුන්ගේ අපෝස්තුළුවරු සමඟ ගැඹුරු යාච්ඤාවල නිරත විය. ඔවුන්ගේ ඇවෑමෙන් පත් වූ සභා මූලිකයෝ මරියතුමිය සමඟ එක්ව සිටිමින් යාච්ඤා කළහ. දේව පිහිට ඉල්ලා යැදීය. මේ බව සභා ඉතිහාසය තුළ මරිය තුමිය කළ උතුම් සේවාව අදටත් ඒ ආකාරයෙන්ම වර්තමාන සභාව තුළ කටයුතු කිරීම දැකගත හැකිය. වර්තමාන සුදොතුම් පියා වන අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සිය එඬේරික ජීවිතයේ සෑම සන්ධිස්ථානයක දීම මරි මවුන් යදිමින් හා මරි මවුන් හා බැඳෙමින් ඉතා සාර්ථක ගමනක නිරත වීම පෙන්වා දිය හැකිය. සුදතුම් පියාණන් විසින් "මරිය වසර" ප්‍රකාශයට පත් කිරීම සමස්ත කතෝලික ජනතාව ලැබූ භාග්‍යයකි. ඒ මන්දයත් මරි මවුන් තුළින් ජේසු සමිඳුන් ළඟට යාමට ඇති මාර්ගය ඒ නිසාය. මරිය වසරේ තේමා පාඨය වන්නේද "ගෙන යනු මැන දෙව් මවුනේ අප සමිඳාණන් වෙතේ" යන්නය.

මරිය තුමියගේ ඉල්ලීමකි. අපේ පව්වලට මනස්ථාපනය වී ජපමාලය කීම. ජපමාලය කීම අප ජීවිත පැවැත්ම කරගත යුතුය. එකට යදින පවුල එකට ජීවත් වේ යන කියමන සිතට ගෙන ජපමාලයට නව පණක් දී අප සැම පවුලක්ම මරියතුමියගේ දැතට භාර කරමු.

තරුණියක් ලෙස, මවක් ලෙස තම කුළුඳුල් පුතනුවන් ලොකු මහත් කිරීමේදී සෑම මොහොතක්ම රිදී රේඛාවෙන් සමන්විත වූවා නොවේ. බොහෝ විට ජීවිතයේ හැලහැප්පීම්, ජීවිත ගැටලු, සිය මනසින් හා කායික ශක්තියෙන් නිනව් කර ගැනීමට නොහැකි වූ අවස්ථා ද එමට තිබුණි. එහෙත් ඒ ජීවිත අවස්ථාවන්ට මුහුණ දුන්නේ එඩිතරවය. නම්‍යශීලීත්වයෙනි. ඉවසීමෙනි. ඉමහත් ධෛර්යයෙනි. මරියතුමිය නොයෙකුත් ආශාවන් බලාපොරොත්තු තිබුණත් දේව කැමැත්ත හමුවේ හිස නැමුවාය. අපගේ ආශාවන් බලාපොරොත්තු සුන්වී යද්දී දේව කැමැත්ත සොයන්නට එය මෙනෙහි කරන්නට සිත්හි නිදන් කරගන්නට අපටත් කොතෙක් දුරට හැකිවේද? මේ නත්තල් සමයේ මරියතුමියගේ සැබෑ ජීවිතය වැළඳ ගන්නට හැකි නම් මොනතරම් වාසනාවක් ද?

*අදහස් දැක්වීම - වත්තල ශා. ජෝශප් විදුහලේ අදියුරු ගරු රංජිත් අන්ද්‍රාදි පියතුමා*

**සටහන :**
**පද්මිණී නානායක්කාර**

# සලෝමි, ජේසු සමිඳුන් උපන් තිඹිරිගෙට එබී බැලුවාද?

"සලෝමි" යනු කිතුනුවනට හොඳට හුරුපුරුදු නමකි. ඒ නමින් සුභාරංචි කථා පුවත්වල සිද්ධීන් දෙකක් හා සම්බන්ධ කාන්තාවන් දෙදෙනෙකු හැඳින්වේ.ඉන් එක් කාන්තාවක් වන්නේ ක්‍රි.පූ 4 සිට ක්‍රි.ව. 39 අතර කාලයේදී රෝම අධිරාජයා වෙනුවෙන් ගලීල ප්‍රාන්තය පාලනය කළ හෙරෝද් ඇන්තිපස් හා ඔහුගේ බිරිඳ වූ හෙරෝදියස්ගේ දියණිය ය. දක්ෂ නාට්‍යාංගනාවක් වූ ඇය සිය නැටුමෙන් තම පිය රජු වසඟ කොට ලබා ගත් පොරොන්දුවකට අනුව සිය මවගේ සිත තුළ වූ වෛරය සන්සිඳුවමින් ස්නාවක ජුවාම් තුමා ඝාතනය කිරීමට මඟ පෑදුවුවාය. (මතෙව් 14:1-21).

"සලෝමි" නම් වූ අනෙක් කාන්තාව වනුයේ ගලීල වෙරළේ ප්‍රමුඛ ධීවරයකු වූ "සෙබදි" නමැත්තාගේ බිරිඳය. වැල්ලේ හැදුන වැඩුන තරමක් කර්කශ ගති පැවතුම් තුබූ ඇය නාසරෙත් හී කන්‍ය මරිය තුමියගේ හා එතුමියගේ ඥාති පවුල් වලට හිතවත් කාන්තාවක් ද වූවාය. මරිය තුමියගේ දෙමාපියන් වූ ජුවකීම් තුමා හා ආනා තුමිය ද එතුමියගේ ඥාතින් වූ සෙකරියා පූජක තුමා හා ඔහුගේ බිරිඳ වූ එලිසබෙත් තුමිය ද හොඳින් දැන සිටි ඇය බොහෝ විට කන්‍ය මරිය තුමියගේ "තනි නොතනියට සිටි" වැඩිහිටි කාන්තාවක් ලෙසද කටයුතු කළ බවද පෙනේ. වරක් එවකට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයෝ ලෙස තෝරාගෙන තිබූ තම පුතුන් වූ ජාකොබ් හා ජුවාම්ට උන්වහන්සේ විසින් පිහිටුවනු ලබන "දිව්‍ය රාජ්‍යයේ දී" උන්වහන්සේගේ වම් පසින් හා දකුණු පසින් අසුන් ගැනීමට අවස්ථාව ලබා දෙන මෙන් ද ඉල්ලා සිටියාය. එහි අදහස වූයේ අනිකුත් ගෝලයින් අතරින් ඔවුන් දෙදෙනා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ "අග සව්වන්" වශයෙන් සලකන ලෙස ඉල්ලීමය. මෙය අනිකුත් ගෝලයන් අතර මහත් අප්‍රසාදයටත් , භේදයකටත් තුඩු දුන් බවද මතෙව් සුභාරංචියේ (20:20-24) සඳහන් වේ.

කෙසේ වෙතත් ජේසුස් වහන්සේගෙන් මෙවැනි ඉල්ලීමක් කිරීමට තරම් "සලෝමිට" හේතු කාරණා තිබූ බවද තතු දත් අය ප්‍රකාශ කරති. ඒ මුලින් සඳහන් කළ පරිදි මේ පවුල් පිළිබඳ බොහෝ දේ ඇය දැන සිටි බැවිනැයි කිතු දහම පිළිබඳ වියතුන් ද විශ්වාස කරති.

ඒ අනුව "දේව පුත්‍රයාගේ පිළිසිඳ ගැනීම" හෙවත් කන්‍ය මරිය තුමියගේ කුස තුළ "වචනය තුමාණන්ගේ මාංශගතවීම" යන අවස්ථාවේ සිටම සලෝමිගේ සම්බන්ධය පැවති බවට සාධක තිබේ. කිතුනු බයිබලයට ඇතුළත් නොකරන ලද පැරණි ලියකියවිලි හා මුඛ පරම්පරාගත කථා අනුව කන්‍ය මරියතුමියගේ බාල කාලය ගත වූයේ සෙකරියස් පූජක තුමා භාරයේ එතුමාගේ ආරාමයේ දේව කන්‍යාවක් ලෙසය. මේ තොරතුරු බයිබලයට - සුභාරංචි පොත් වලට ඇතුළු නුවූවත් ක්‍රි.ව. 500 දී පමණ සංගෘහිත වූ "ශුද්ධ කුර්ආනයේ" සුර 111-37 වෙනි පදයේ සඳහන් වේ. ඒ අනුව වචනය තුමාණන්ගේ මාංශගතවීම සිදුවී ඇත්තේ මරිය තුමිය මිනිස් ඇසුරින් සම්පූර්ණයෙන් ඈත්ව සිටියදීය. පූජක සෙකරියස් තුමා එහි ප්‍රධාන සාක්ෂිය වුවද අනික් අයගේ පිළිගැනීම කෙසේ වී දැයි කිසිවෙකුට කිව නොහැකිය. සලෝමිද මෙම අභිරහස්‍යමය සිද්ධිය සවිස්තරව අසා දැනගන්නට ඇත. කෙසේ වෙතත් එතැන් සිට "සලෝමි" මරිය තුමී පිළිබඳ විශේෂ අවධානයකින් පසුවූ බවද පෙනේ.

### තනි නොතනියට

රෝම අධිරාජයා යටතේ "කුරේනියස්" සිරියාවේ (ගලීලය ද ඇතුළුව) ආණ්ඩුකාරයාව සිටි කාලයේදී ප්‍රථම වරට ජුදා වැසියන් පිළිබඳවද මහා සංගණනයක් පවත්වන ලදී. එහි ප්‍රධාන අදහස වූයේ යුධ හමුදාවට අලුතින් සෙබළුන් බඳවා ගැනීමත් අයබදු එකතු කිරීම විධිමත් කිරීමත් ය. මේ සඳහා ගලීලයේ නාසරෙත් හි විසූ ජුදා මෑණියන්ටද ජුදෙයාවේ බෙත්ලෙහෙමේ පිහිටි සංගණන මධ්‍යස්ථානයකට යායුතු විය. නාසරෙත් හි සිට කිලෝමීටර් දෙසීයකටත් වැඩි දුරකින් දකුණු දෙස පිහිටි බෙත්ලෙහෙමට යාම සඳහා නිසි පරිදි පිළියෙළ වූ පාර තොටක් හෝ යාන වාහන ආදියත් නොවීය. එසේම කුළුඳුල් දරු ප්‍රසූතියකට ළංව සිටි මරියතුමියට මේ ගමන වඩාත් දුෂ්කර එකක් ලෙස දැනුණ වග කිව හැකිය. ඒ නිසාම ජුසේ තුමා හා මරිය තුමිය සමඟ මේ ගමනට සලෝමි ද එක් වී ඇති බව අනුමාන ඓතිහාසික සාක්ෂි වලින් තහවුරු වී ඇත.

ඉදිරි කලාපයට... »

**පමුණුගම ඇන්. එම්. පෙරේරා**

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2013 දෙසැම්බර් 22 වැනි ඉරිදා

# සාමය හඳුනන්නෝ "නත්තල" අරුත් ගන්වති

නැවතත් නත්තල් සිරියෙන් ශ්‍රී ලංකාද්වීපය මහත් පෙළහරක් පාමින් සතුටු සිනා රැළි නංවා එකිනෙකා පිළිගන්නට සූදානම් වී ඇති සෙයක් සැබවින්ම සතර කොනින් පෙනේ. අපි නත්තල් පවත්වමු. කිතුනුවන් පමණක් නොව දේශයේ බහුතරයක් ජනතාව දැන් නත්තල් පවත්වති. සමාදානය මඟින් නවෝදය ලැබීම, සංහිඳියාව තුළින් නැවත උපත ලැබීම මේ කාල වකවානුවේ කවුරුත් කථා කරන තේමා පාඨයන් බවට පත්වී ඇත. දකුණු රටේ නත්තල් සිරිය මවන සංස්කෘතික ලක්ෂණ උතුරු රටේ නත්තල් සිරියාවටත් උකහා ගෙන ඇති අයුරු නම් අපූරුයි.

මේ කිතුනු පරමාදර්ශී දැක්ම ඇරුණු කොට වෙන කොයියම් දර්ශනයකට මෙවන් මහා පෙළහරක් දකුණු කොනේ සිට උතුරු කොන දක්වා පෙන්වාලිය හැකිද? නත්තල ගෙවී සතියක් ඉක්බිති ලෝක සාම දිනය ද උදා වෙනු ලබයි. නත්තල් උපතේ අසිරිය මැද උදා වන සිත් සන්තොසින් බැඳි සාමයේ හසරැළි අර්ථ ගන්වන ලෝක සාම දිනය දා නත්තල පරිපූර්ණ වන බවක් වසරක් වසරක් පාසා ලබන අත්දැකීමෙන් අපට හැඟී යනු ලබයි. එය සැබැවින්ම නත්තලේ සාමය ජනේරු දා සාම සංස්කෘතියක් කරා ගෙන යන බැවින්මයි. සාම සටනේ පරම අවිය සමාදානය බව අප සසුන් පියවරුන් විසින් මෙතුවක් නිකුත් කර ඇති සාම සංදේශවල සඳහන් වේ. ඒ සාම සංදේශ වල සභාවේ පිළිවෙත සිය පුරෝගාමී පැවැත්මෙන් ජීවං කළ ලෝක ජනතා නායකයන් පිළිබඳව ද මේ දිනවල නිරන්තරයෙන්ම කතාවට ලක් කිරීම අගයාලිය යුත්තකි. ඒ අතරින් මහත්මා ගාන්ධි, තෙරේසා මව්තුමිය මෙන්ම නෙල්සන් මැන්ඩෙලා වැනි විශ්ව මානව ප්‍රේමීන්ගේ ජීවිතාදර්ශය ලෝක ජනතාවට නත්තලේ සැබෑ කිතුනු ලීලාව ගැන කදිමට පාඩම් උගන්වනු ලබයි.

අප සමිඳුන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කළ කී දෙයින් මෙන්ම මහත්මාගාන්ධි, නෙල්සන් මැන්ඩෙලා වැනි අහිංසාවාදීන්ගේ පැවතුම් චර්යාවෙන් ද ඔප් නැංවෙන සමා දහම අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් විසින් මේ පරිදි තහවුරු කෙරෙන අතර සමාවට පදනම වන සහෝදරත්වයේ හා සාංඝික සහභාගිත්වයේ අරුමය මෙරට මෙන්ම අන් රටවල ද සසුන් පත් රදගුරු හිමිපාණන්ගේ පණිවුඩ වලින් ද මතු කෙරේ. දෙවිඳුන් වෙතින් ලද සම්පත් සහෝදර ජනතාව හා බෙදා ගැනීමේ කිතුනු වගකීම එම පණිවුඩ වලට මූලික තේමා පාඨයක් වී ඇත.

සමාදානය - සාමය - සහෝදරත්වය යනුවෙන් මෙකී සටහනින් ඉස්මතු කරවන විවරණයන් මෙවර ද මුද්‍රිත මාධ්‍යය හරහා පලවන ලිපි වලට පසුබිම් වූ කේන්ද්‍රීය තේමාව බවට පත්වී ඇති බව පෙනේ. සමාදානය, සාමය, සහෝදරත්වය ජීවත් කෙරෙන්නට නම් තමා කව්දැයි කිතුනුවා දත යුතුයි. එමෙන්ම තමා ගැන සහෝදර ජනතාව කුමක් සිතන්නේ දැයි දැන ගත යුතුයි. සසුන් මඟත් සසුන හා නත්තල නමැති සසුනේ මහා මංගල්‍යය පිටතට පෙනෙන ආකාරයත් විදහා පෑමට ලියැවෙන කියැවෙන දෑ අතුරින් මේ සමය තුළ මහත් ඉඩහසරක් අවංකත්වයක් ඇති විය යුතුමයි.

පිටතට පෙනෙන දෑට වඩා හරයක් නත්තලේ හා කිතු දහමේ ඇති බව කියන විදැහුමක් ද ඒ සියල්ල වටා තිබිය යුතුයි. අද ඇතිවෙමින් පවතින්නේ ද එවැන්නක් බව සිත් ප්‍රබෝධයෙන්ම පවසාලිය හැකියි.

වෙළෙඳ වාදයේ හා පාරිභෝගික අර්ථක්‍රමයේ ග්‍රහණයට හිර වී හුදෙක් භෞතික අංශයට සීමා වූ ලෞකික උත්සවයක් වශයෙන් සමහර අය මෙකී මංගලෝත්සවය සිරකර තබන්නට ගන්නා උත්සාහයන් ද අද ගිලිහී යමින් පවතී. ලෝකෝත්තර ධර්මතාවය අද ඉහළින්ම පැන නැගී ඇත. එය හුදෙක්ම තමන්ගේ දුකින් මිදීමේ මමත්වයේ පටු දැක්මක දර්ශනයට වඩා අනුන් වෙනුවෙන් සිතා පරහට දයා වෙන් ක්‍රියා කරවන ධර්මතාවයකට අප මංගලෝත්සවය කැඳවා ඇති බැවිනි. දුක්ඛ දෝමනස්සයේ පැරැණි කඩා ඉහිරෙන ජරා ජීරණ සිත්තමක් නොව නත්තල ප්‍රීති සන්තෝෂයේ අනුන් පිළිග න්නා පිරිපුන් දහමක මංගල්‍යයක් නිසා කිතුනු, නොකිතුනු ජනයා අතර මහා වෙනසක් ඇති කිරීමට අද මෙය සමත් වී ඇත.

දරු උපතක් කේන්ද්‍ර කොටගත් නත්තල, පවුලේ උත්සවයකි. එනමුත් එහි යථාර්ථය හඳුනා ගැනීමට බැරිවන තරමට එය නූතන පවුලේ ගිජු පාරිභෝගික දර්ශනයට ගොදුරු කරගන්නට මාන බලන බලවේග ද නැත්තේ නොවේ. නත්තලේ යථාර්ථය මතු කිරීම යනු සියවස් ගණනාවක් පුරා එය වටා ගොඩනැගුණු සංස්කෘතික සම්ප්‍රදායන් ඉවතලීම නොව විකෘත ආදේශනයන් ඉවත ලීමයි. එනම් නත්තලේ මූලික පණිවුඩයට පටහැනි දේ දුරලා දහම් හරය මතු කිරීමයි.

මනු බව හා දෙවි බව යා කරන නත්තල මනු බව දෙවි බවට ළං කරවන උදාර කිතුනු දැක්ම වෙත වීරෝදාර කැපවීමකට ආරාධනයකි. පූර්ණ මානව සංවර්ධනය යනුවෙන් අද හැඳින්වෙන එම නත්තල් විමුක්ති දැක්මට පදනම් වූ සැබෑ සාම ආරාධනාව සීමිත දෑ වලට ලඝු කරවන්නේ නැතිව නිරතුරුවම ජීවත් කළ යුතුවේ. කිතු සමිඳුන් පටන්ගත් මානව විමුක්ති මෙහෙය අඛණ්ඩව ගෙන යමින් සැබෑ, සදා විමුක්තිය උදා කරගන්නට අපි කොයි කවුරුත් පෙරමුණ ගනිමු නම් කාටත් කොතැනත් "නත්තල්" වෙනවා නිසැකයි.

මනුෂ්‍යත්වය දේවත්වයට යා කරමින් කිතු සමිඳුන් විදහා පෑ සහෝදරත්වයේ දහම අද ලෝ පුරා ජීවත් කරවීමේ වගකීමෙන් කිතුනු රැස බැඳී සිටිති. මේ සහෝදරත්වය අප සසුනට කිතු ජනතාවට පමණක් සීමා වූවක් නොවේ. එය මුළු මනුෂ්‍යත්වයටම පොදුය. මුළු මානව වර්ගයා වෙත පිරීතිරී යන දයා ප්‍රේමයකින් සාම විමුක්ති මඟට යොමු කිරීමට අප සමිඳුන් මිනිසත් බව ගත් දිනය සමරන මේ නත්තල ඉහත සඳහන් අයුරින් සැමට සැමදා සැම තැන නත්තල උදා කරන අවස්ථාවක් කර ගත යුතුව ඇත.

විශේෂකොට මේ අප දේශය තුළ සැබෑ ලෙසින්ම මෙකී උදාරතර පණිවුඩය මාංශගත කරලීමට වෙහෙස වීම සඳහා දකුණු කොනේ සිට උතුරු කොන දක්වා කිතුනුවා පෙරමුණ ගත යුතුව ඇත. එයට කාලය ළං වී තිබේ. එකී කාලය තුළ එළි දැක්වී ඇති සලකුනු කියවීම තවත් ප්‍රමාද කළ යුතු නොවේ. තමන් ගැන නොව අන් අය ගැනම සිතන දහමක පෝෂණය ලබන්නන් එකී සිතිවිල්ල පසක් කර ගත යුතු වන්නේ මානුෂික ධර්මතාවය වඩවන තැන "උපත" ද සිහිගන්වන බැවිනි. ඒ උපත නත්තල නම් "සාමය" අරුත් ගන්වන්නෝ නත්තල අර්ථවත් කරති යන්න පැවසීමට තවත් පසුබට විය යුතු නැත.

# මිනිසාට අභියෝගයක් වන නත්තල

විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා
ජාතික දෙව්සත්හල - අම්පිටිය

නත්තල යනු දේවත්වය, මිනිසත්බව හා සම්බන්ධවීමේ අභිරහස සිහිපත් කරන මංගල්ලයයි. දෙවිබව මිනිස් බව සමග යාවීමේ අන්දරය හා බැඳුණු චරිතයන් මගින් මිනිසත්බවේ උත්කෘෂ්ඨ බව හා උදාරත්වය පිළිබඳවත් එසේම ඒ ශ්‍රේෂ්ඨත්වය හා ජීවිතය විනාශකරන උදාසීන හා අනර්ථකාරී බලවේගයන් පිළිබඳවත් අනාවරණය කෙරේ.

මුලින්ම අපට හමුවන්නේ මරියෝත්තමාවන්ගේ චරිතයයි. මරියෝත්තමාවන් නම් කුස තුළ දරා සිටින දේවත්වයට වඩා තමා සිය එකඟත්වය පළ කළ දූත මෙහෙවරේ අභිරහස තමා තුළ දරා සිටි වගක් අපට පෙනේ. තමාගේම ශරීරය හා තමාව දානය කිරීම මගින් ජීවිත අභිරහස නොකඩවා ඉදිරියට ගෙන යාමේ සම්භාවිතාව වෙනුවට හැම ගැහැනියක් තුළම උපදින සන්තාපය හා චිත්තප්‍රමෝදය ඕතොමන් නියෝජනය කරනු ලබයි. උසස් බව ලබන්නට, සිය සීමාවන් අභිබවා යන්නට සෑම මිනිසෙක් හා ගැහැනියන් තුළම ස්වභාවිකව පිහිටා ඇති සහජ හැකියාව මරියෝත්තමාවන් විසින් සංඛේතවත් කරනු ලබයි. සත්‍යවශයෙන්ම තමා කවුද යන වග හෙළිකර ගන්නට තරම් අවකාශයක් නැතිව තැවෙන ලතවෙන හැම ගැහැනියක්ම හා මිනිසෙක්ම ඕතොමන් නියෝනජය කරයි. තම කුස තුළ හොත් දරුවා බිහිකිරීමට සුදුසු තැනක් සොයා යෑම මගින්, සිය නියෝජනයන් හා බලපෑම් මගින් මිනිසාගේ අභ්‍යන්තර හා බාහිර අවකාශය විනාශවෙන සියළු ක්‍රමයන්, ව්‍යුහයන්, රාජ්‍යයන්, ආගම්, චාරිත්‍ර හා සම්ප්‍රදායන් වලට අභියෝග කරයි. අපේ නගරයන් හා ගම් අද්දර මං මාවත් වල හා පැල්පත් වල, පාලම් යට හා අනාථ කඳවුරු වල දිවි ගෙවන දස දහස් ගණන් අසරණයන් ඕතොමන් නියෝජනය කරයි.

තම අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා අවකාශය පැතීම හෝ යුද්ධය හා විනාශකාරී බලවේගයන් නිසා තර්ජනයට ලක්වීම නිසා තම කුළුපග වටපිටාවන් හැරදමා සංක්‍රමණය වන්නට බලපාන තත්ත්වයන් ඇති කරන සියළු ක්‍රමයන්ට ඕතොමන් අභියෝග කරනු ලබයි.

ක්‍රිස්තු උපත ගැන කියැවෙන මෙම අන්දරය තුළ ඊලඟට අපට හමුවන්නේ සිය බිරිඳට කැපවුන හා තමාට භාරවුනු දූත මෙහෙවර වෙනුවෙන් කැප වුන ජුසේ තුමායි. ගැබ්ගත් කාන්තාවක් සිය බිරිඳ වශයෙන් බාරගන්නට ඉදිරිපත්වීම තුළින් ඔහු විශ්වාස කරන හැටියට සමාජය ඔහු කෙරේ තබා තිබූ විශ්වාසයට පාඩුවක් විය හැකි බව පවා ඔහු නොතකයි. රජ කෙනෙකුගේ අණ පිළිපදිනු වස් සිය ගැබ්ගත් බිරිඳ සමග දිගු ගමනක් යැමට

> **සෑම නත්තලක්ම, ජීවත් වන සමාජය වෙත යථාර්ථවාදීව බැල්මක් හෙලන්නට අපිට ඇරියුමක් කරයි. එලෙසම අප අතර ජීවත් වන දරිද්‍රතාවයෙන් පෙලෙන ජන කොටස් වෙත විශේෂ අවධානයක් යොමුකරන්නට නත්තල ඇරියුම් කරන අතරම විවිධාකාර පැති තලයන් තුළ ජීවත්වන එලෙසම මානුෂ්‍ය වේදනාවනට පත් වූවන් කෙරෙහිද සංවේදි වන්නට සිහි ගැන්වීමක් කරයි.**

ඉදිරිපත්වීම තුළින් සිය නෑදෑ පරපුරෙන් එල්ලවිය හැකි පිළිකුල පවා නොතකයි. කෙසේ වෙතත් තමා වෙත පවරන ලද වගකීමෙන් බැහැර යාමට ඒ කිසිවකට ඉඩ නොදෙයි.

සිය දරුවා බිහි කිරීමට සුදුසු අවකාශයක් ඇයට සොයාදීමට ඔහු සමත් වෙයි. තමකම අමතක කිරීම තුළින් තමාවම සොයාගන්නට සමත්වග ගැහැනිය හා මිනිසා ඔහු විසින් නියෝජනය කරනු ලබයි.

මී ලඟට අපගේ අවසානය යොමුවන්නේ තානායම්කරුවන් හා ගෙවල් හිමිකරුවන් වෙතයි. ඔවුන් දේපල වලට හා නිවෙස් වලට හිමිකරුවන් වූවත් මිනිසත් බවේ උපත වෙනුවෙන් තමන් අයිති දෙයින් සුළු අවකාශයක් හෝ බෙදාගන්නට අකමැති වෙයි. නත්තල් අන්දරයේ පැහැදිලි චරිතයන් ලෙස ඔවුන් හමු නොවේ. ඔවුන් ක්‍රියාත්මක වන්නේ තිරය පිටුපස සිටය. තමන් විසින් නිර්මාණය කරනු ලබන ක්‍රමවේදයන්ට පිටුපසින් සිට ක්‍රියාත්මක වන අදෘශමාන බලවේගයන් ඔවුහු වෙති.

බහුතරය අධම දරිද්‍රතාවයෙන් ජීවත්වීම ඔවුන්ගේ සැලකිල්ලට යොමු නොවේ. දූෂණයන් ව්‍යසනයන් හමුවේ සිය ජීවිත රැක ගන්නට පවා අපහසුවෙන තත්ත්වයක් ඔව්හු විසින් නිර්මාණය කරනු ලබති. අන් මිනිසුන් තමන්ගේම සහෝදර සහෝදරියන් බව හඳුනා නොගෙන ඔවුන්ගේ සංතාපයට අසංවේදීව ජීවත් වෙති. මෙම දුඃඛිතයන් හා කොන්වූවන් වෙනුවෙන් ඔවුන් තනන ප්‍රතිපත්තීන් හා ඔවුන්ගේ ආකල්පයන් හා හැසිරීම් රටාවන් තුළ තම සීමාවන්ට ඇතුළු වීමට දුප්පතුන්ට ඉඩ ප්‍රස්ථා නැත. එසේම උදාර මිනිසුන් ලෙස ජීවත් වීම සඳහා ඒ අයට අවකාශයක් නැත. දුප්පත් හා හිමිකම නොමැතිවූවන් ඔවුනට කොහෙත්ම අවශ්‍ය නැත. බහු ජාතික සමාගම්වල ලෝක වෙළඳ සංවිධානවල හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන එම සාකච්ඡාවන් සංස්කෘතික අවකාශයන් තුළ වැජඹෙන අය තවතවත් ඉඩකඩ අත්පත් කර ගනු සඳහා හැකි සෑම ක්‍රමයන් හා ව්‍යුහයන් අයථා උපක්‍රමයන් මගින් හසුරුවා ගනු ලබයි. මෙම සුළුතරය ඇත්තවශයෙන්ම සකල අවකාශය අත්පත් කර ගනු සඳහා ගෝලීයකරණය. සංවර්ධනය, ලෝක බැංකු සහණාාරය හා බැඳුණු සංවිධාන වැනි වක්‍රෝතික මාර්ගයන් භාවිත කරනු ලබයි.

## මරමව් තුළින් බිලිඳු සොයා යමු

ගව ඔරුවේ ඉපදුන දරුවා නොසිටින්නට ගැබ් දැරූ කාන්තාවගේ හා ඇයගේ සැමියාගේ මේ කථාන්දරය, සකල මිනිස් සංහතියට එතරම් වැදගත් වූ කථාවක් නොවන්නට ඉඩ තිබුනි. දස දහස් ගණන් දරුවන් මෙලොවට බිහිවූවත් ඔවුන්ගේ පළමු උපන් දිනය සමරන්නට තරම් වත් ඔවුන් ජීවත් නොවේ. තම කුස හොත් දරුවන් මෙලොව බිහි කිරීමේදී දහස් ගණන් කාන්තාවන් මිය යති. තවත් දහස් ගණනින් කාන්තාවන් සිය කුස දරුවන්ට සොහොන බවට පත්කර ගනිති. ළමුන්ගේ ජීවිත හා මරණ පිළිබඳ මෙවන් වේදනාකාරී අන්දරයන් මැද, හීලෑ සතුන් මධ්‍යයේ ලොවට බිහිවුනු දරුවෙක් ගැන පවසනු ලබයි. මවගේ කුසයේ ආරක්ෂාව හැරුනු කොට දරුවෙක් බිහිකිරීමට තරම් සදුසු පරිසරයක් නොවේ එතැන. නමුත් මෙම වාතාවරණය තුළ සැබවින්ම ලෝකය කනපිට හරවන දරුවෙක් අපට මුණ ගැසේ. තමාට අවශ්‍ය කුමක් ඇයි කියා පැවසීමට තරම් වත් හැකියාවක් නැති මෙම දරුවා අභියස, සීමාන්තය හා අනන්තය, සැසඳිය නොහැකි වග කියැවෙන සියළු දාර්ශනික ක්‍රම කඩා වැටේ; දෙවියන් වහන්සේගේ සීමාරහිත පරමෝත්කෘෂ්ඨ බව, උන්වහන්සේගේ නිත්‍යතාව හෝ වෙනස් නොවන ගතිය පිළිබඳ දේවධාර්මික තර්කයන් බිඳ වැටේ; බලය හා බල රහිත බව අතර පවතින පරස්පර විරෝධිබව පලුදු වේ; ලෝකය, මිනිසා හා දෙවිඳුන් අතර ඇති නියෝජනය අතුරුදන් වේ. මෙම දරුවා අපේම මාංශය හා රුධිරය බවට පත්වේ. එහෙත් ඔහු දෙවියන් වන සේක.

ඉදිරි කලාපයට...








“කතෝලිකයෝ සිංහලයෝ නොවෙති. ඔවුහු පරංගින්ට, රෝමානුවන්ට ගැති පිරිසක්ම වෙති. ඔවුහු අපරදිග සිරිත් විරිත් පර ගැතියෙන් අනුග මනය කරති. හෙළබස ගැන කැක්කුමක් නැත්තෝය.” මේ මෙරට කතෝලිකයන් ගැන ඇතැමුන් දරන්නාවූ මතයයි. එහෙත් මේ සාධාරණ උපකල්පනයක් නොවේ. සිරිලක කතෝලිකයෝද දේශයේම දරුවෝ ය. දේශයේ, ජාතියේ භාෂාවේ සංස්කෘතියේ ප්‍රගමනයට දායක වන්නෝ ය.

බෞද්ධාගම හා බෞද්ධ සංස්කෘතිය ඇසුරින් අපේ භාෂාව පෝෂණය වූවා සේම ශුද්ධ බයිබලය හා කතෝලික සංස්කෘතිය ඇසුරින් ද සිංහලය පෝෂණය වී තිබේ. මේ කෙටි විමසුම කතෝලික යෙදුම් සිංහලයේ පෝෂණයට දායක වූ අයුරු සම්බන්ධයෙනි.

# හැමදාමත් නත්තල් නැහැ



කතෝලිකයන්ගේ වැදගත්ම ආගමික උලෙළ පාස්කුව වුවද මහත් වූ උත්සවශ්‍රීයෙන් හා සතුටක් දිස්වන්නේ නත්තලෙහිය. එම නිසා “හැමදාමත් නත්තල් නැහැ” යන යෙදුම අපේ භාවිතයට එක් වී තිබේ. මෙහි අරුත වන්නේ නත්තල සතුට සොම්නස ගෙන දෙන බවයි. “නත්තල් සීයා වගේ ලෝස් නැහැ” අත දිග හැර තෑගි බෝග දෙන කෙනකු දකින විට එසේ කියනු අසන්නට ලැබේ. දිළින්දන් වෙනුවෙන් කැපවූ ශාන්ත නිකුලස් ශුද්ධවරයාණන් මේ කියමන පසු පස සිටී.

“යහපත් එඬේරා වගේ” මේ ශුද්ධවූ බයිබලය ඇසුරින් එක්වූ කියමනකි. ශුද්ධ බයිබලය පුරාම අපට ජේසු සමිඳාණන් හඳුන්වා දෙන්නේ යහපත් එඬේරා වශයෙනි. දේව දරුවන් එතුමන්ගේ බැටළු රැළයි.

“ඇසට ඇසක් - දතට දතක්” මේ ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුම ඇසුරින් වහරට එක්වූවකි. පළිගැනීම පිළිබඳ වූ දහම ප්‍රේමයේ සමාව දීමේ දහමක් බවට පත් කළේ නත්තල් දා මනුලොව වැඩි ජේසු සමිඳාණන් ය. එකට එක කිරීම හෙවත් පළිගැනීම සම්බන්ධව මෙම බයිබල් යෙදුම භාවිතයට පැමිණ තිබේ.

ජේසු සමිඳුන් සතුරන්ට පාවා දුන්නේ ජුදාස් ඉස්කාරියොත් නම් වූ එතුමන්ගේම ශ්‍රාවකයා විසිනි. එබැවින් එකට සිට පාවා දෙන මිතුරකු හඳුන්වා දීම සඳහා “ජුදාස් කෙනෙකු වගේ” යන යෙදුමට වඩා අපූරු යෙදුමක් තිබේ ද?

සමිඳුන් මරණයට තීන්දු කළේ පොන්ටියුස් පිලාත් ආණ්ඩුකාරයා විසිනි. එහෙත් තමන් වරදක් නොකළ බව කීම සඳහා ඔහු මරණ දඬුවම නියම කර දිය බඳුනක් ගෙන්වා ගෙන දෑත් සෝදා ගත් බව බයිබලය සඳහන් කරයි. මේ නිසා “අත සෝදා ගැනීම” යන යෙදුම අපේ වහරට එක්විය.

සමිඳාණන්ගේ දේශනා ඇසුරින් ද අපේ වහරට එක්වූ යෙදුම් රැසකි. “යහපත් සමරිතානුවරයකු වෙන්න”, මෙය සමරිතානුවරයා පිළිබඳ උපමා කතාවෙනි. මාගේ අසල්වැසියා කවරෙක් දැ?යි කරන ලද විමසුමට පිළිතුරු ලෙස සමිඳුන් වදාළ මෙම උපමා කතාවෙන් දුකේ දී විපතේ දී උපකාර කිරීමේ වටිනාකම පහදා දෙයි.

“අකීකරු පුත්‍රයා” පිළිබඳ උපමාවෙන් අපේ වහරට එක්වූ යෙදුමකි. සමිඳාණන් පව්කාරයාට වැරදිකරුවාට සමාව දානය කරන බවත් ඔවුන් අත්නාරින බවත් මේ උපමාව අපට පැහැදිලි කරයි.

“පව්කාරයාට ගල් ගැසීම” මේ බයිබලයේ වන මග්දලාහි මරියා පිළිබඳ සිදුවීම ඇසුරිනි. එම පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමට සූදානම් වූ අයට සමිඳු වදන වූයේ ඔබ අතරින් පාපයක් නොකළ තැනැත්තා පළමු ගල ගසන්න” යනුවෙනි. මාටින් වික්‍රමසිංහ සූරින් මේ නමින් කෙටිකතා සංග්‍රහයක් නිකුත් කර ඇත.

“සොයන්නාට සම්බ වේ, තට්ටු කරන්නාට දොර අරිනු ලැබේ.” මේවා සමිඳු දෙසුමින් කෙළින්ම අපේ වහරට එක්වූ යෙදුම් ය. “සුදු හුණු ගෑ සොහොන් කොත් වගේ” ඇතුළතින් කිළිටි පිටතින් පිරිසිදුවට පෙනෙන අය හඳුන්වා දීමේදී භාවිත වන සමිඳු වදනකි.

“තමන්ගේ ඇසේ පරාලයක් තිබියදී අනුන්ගේ ඇසේ රොඩ්ඩ ගැන කළබල වන අයද සිටින බව බයිබලයේ ප්‍රකාශයකි. “දකුණතින් දෙන දේ වම් අතට දැනෙන්න නොදිය යුතුය” යන්න දන්දීම රහසිගතව සිදුවිය යුතු බවත් එය අනුනට ප්‍රදර්ශනය කිරීම සඳහා නොකළ යුතු බවත් පැහැදිලි කරන අපේ වහරට එක්වූ බයිබලීය ප්‍රකාශයකි.

“තහනම් ගහේ ගෙඩි කනවා” මෙය පුරාණ ගිවිසුමේ උත්පත්ති පොතේ එන සිදුවීමකි. අපවිත්‍ර ඇසුර සඳහා මෙය නිතර යෙදේ. “ඔබේ දකුණු කම්මුලට ගහන කෙනාට වම් කම්මුලත් හරවන්න” මෙයද බයිබලයේ එන එකට එක නොකිරීම පිළිබඳ හොඳම කියමනකි. “බෞතිස්මය ලබනවා” මෙය යම් කෙනෙකු කතෝලිකයකු බවට පත් කිරීමේ පිළිවෙතයි. එහෙත් “ටෙස්ට් ක්‍රිකට් පිටියේ බෞතිස්මය ලැබීම” වැනි යෙදුම් ඒ ඇසුරින් වහරට එක් වී තිබේ. “බයිබලය වගේ” මෙය අපේ ධර්ම පුස්තකය වුවද ක්‍රීඩකයකු වැරදි ආකාරයේ පහරක් එල්ල කළ විට ක්‍රිකට් බයිබලයේ නැති පහරක් එල්ල කළා යැයි විස්තර ප්‍රකාශකයන් කියනු අසන්නට ලැබේ.

“අවි ගත්තෝ අවියෙන්ම නැසෙන බව” සත්‍යයකි. එහෙත් එය බයිබලයෙන් ලබා ගත් යෙදුමකි. “උකුත් වෙනවා” යනු කිතුනු ව්‍යවහාරයේ සමිඳුන් ස්වර්ග ස්ථ වීමකි. එහෙත් “උඩට උකුත් වෙන්න ගහනවා” යයි කෙනෙකු කියන්නේ තරහටය.

“එල්ලල කන්තාරු කරන්න වටිනවා” යැයි සමහර අම්මලා අකීකරු දරුවන්ට කියන්නේ ඇත්තටම එසේ කරන්නට හිතාගෙන නොවේ. “මම අද උඹව ක්‍රිස්තියානි කරනවා” යැයි කියන්නේ ද දඬුවම් දෙනවා යැයි යන අදහසිනි.

ඇති හැකි අය ඉහළ වටිනාකම ඇති පඬුරු පුදද්දී වැන්දඹුව තමා සතු වූ තුට්ටුව දෙවිඳුනට පුද කිරීම සමිඳුන් මහත් සේ අගය කළ බව ශුද්ධ බයිබලය සඳහන් කරයි. “වැන්දඹුවගේ තුට්ටුව වගේ යන යෙදුම අප වහරට එක්ව ඇත්තේ ඒ අනුවය. “ජෙයලලිතා ද ශ්‍රී ලංකාණ්ඩුවට අභියෝග කරමින් උතුරේ ජනයා එක්තරා “නික්මයාමකට” දිරිමත් කළාය. (ප්‍රදීපය 2013, 10 / 27, 12 පිටුව) නික්මයාම පැරැණි ගිවිසුමේ ග්‍රන්ථයකි. එය වත්මන් වහරට එසේ එක් වී ඇත.

**කැලිස්ටස් ජයමාන්න**

# ලෝක හිතකාමී විප්ලවයයි නත්තල

ලෝක ඉතිහාසය යනු විප්ලවීය නව යුගවල සවිස්තරාත්මක කථාන්තරය වේ. විප්ලවය යන්නෙහි නිර්වචනය ලෙස බෙහෙවින්ම මනසගතව තිබෙන්නේ අවි ප්‍රහාරයෙන් හෝ වාග් ප්‍රහාරයෙන් හෝ කැලෑ නීති ප්‍රහාරයෙන් හෝ සිදු කෙරෙන ආක්‍රමණශීලි සමාජයීය උඩු යටි කරලීමකි. එහෙත් සාමකාමී යහ පැවැත්මක චිරස්ථිතිය වෙනුවෙන් නිරායුධව අවිහිංසකව සංවාදාත්මකව සිදු කරනු ලබන වෙනසක් පිළිබඳ වූ දූත කාර්යය හෙවත් ධර්මානුගත ව්‍යාපෘතිමය අධ්‍යයනය විප්ලවය ලෙස වටහා ගන්නා පුද්ගලයෝ විරල වෙති. එවන් ලෝක හිතකාමී විප්ලවයක ප්‍රභවය වූ නත්තලට ය. අප දැන් පිවිසී සිටිනුයේ.

විප්ලවයක වස්තු බීජය උද්ගත වන්නේ උත්පත්තියක් හා සමඟය. එම උත්පත්තිමය වස්තු බීජය වැවී වැඩි එලදායි වෙන්නේ උත්පත්තිය ලැබූ පුද්ගල ජීවිත පැවැත්ම තුළය. බහුතරයක් දෙනා හරිහැටි වටහා නොගන්නේ නත්තලේ විප්ලවීයත්වය නමෝ විත්තියෙන් ම ප්‍රකාශ වී තිබෙන්නේ ශුද්ධවර ලූක් ශුභාරංචියේ 1 වැනි පරිච්ඡේදයේ වගන්ති 31 - 33 හි ඇතුළත් පරිදි නත්තල් දා උපත ලැබූ ජේසුස් වහන්සේ ගේ පිළිසිඳ ගැනීම පිළිබඳ පුවත දැන්වීමට දේව දූත ගාබ්‍රියෙල් තුමා ගලීල දේශයේ නාසරෙත් නුවර විසූ කුමරි මරියාණන් වෙත පැමිණි අවස්ථාවේදීය.

දේව දූත ගාබ්‍රියෙල් තුමාගේ වචන වූ “මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතකු ලබන්නෙහිය. ඔවුන් වහන්සේට ජේසුස් යන නාමය තබන්න. ඔවුන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. ඔවුන් වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ ඔවුන් වහන්සේට ප්‍රදානය කරන සේක; ඔවුන් වහන්සේ ජකොබ්ගේ වංශය කෙරේ සදහටම රජකම් කරන සේක. ඔවුන් වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නොවන්නේ ය” යන ප්‍රකාශය අනුව ඉශ්‍රායෙල් ජනතාව බලාපොරොත්තුව සිටි ගැළවුම්කරුවාණන්ගේ මවු පදවිය



සඳහා රජ මාලිගයක නොව, සිටු මැදුරක නොව ධනවත් ප්‍රාසාදයක නොව සාමාන්‍ය ගැමි නිවෙසක තරුණියක තෝරා ගනු ලැබීම විප්ලවීය ආරම්භය විය. ශුද්ධවර පාවුළු තුමා යැවූ සන්දේශයෙහි මේ උපත සම්බන්ධයෙන් ඇතුළත් වී තිබෙන්නේ “ඔවුන් වහන්සේ (ජේසුස් වහන්සේ) දෙවියන් වහන්සේගේ රූපය දැරූ නමුත් දෙවියන් වහන්සේගේ සමානත්වය තමන් විසින් බදාගෙන තබා ගත යුතු වස්තුවකැයි නොසිතා එය ඉවතලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මනුෂ්‍යයකු වූ සේක” යනුවෙනි.

මෙම උදෘතය අනුව දෙවියන් වහන්සේ මනුෂ්‍යයා සොයාගෙන පැමිණ මනුෂ්‍ය තත්ත්වයෙන් උපත ලැබීම නිහතමානීත්වයේ විප්ලවීය සුලක්ෂණය විය. උද්ධච්ච කමින් ඔද්දල් වී සාරධර්ම අහේනියෙන් බෙලසුන් වූ සමාජයකට සාමය උදාකර දීමේ නිහතමානී විප්ලවීය පියවර ගන්නා ලද්දේ මේ ලෙසටය; දේවත්වය සහ මනුෂ්‍යත්වය අතර පරතරය අහෝසි කර සමානාත්මතාවයේ සහජීවනය තුළින් සාමය ස්ථාපිත කිරීමේ සාධනීයත්ව පදනම දමන ලද්දේ මේ ලෙසටය.

ස්වකීය උපත සිදුවුණු ගෝලෙන දුගී එඬේරුන්ට මෙන් ම රාජකීය පඬිවරුන්ට ද පොදු දේව මාලිගාවක් බවට පත්කර ලීමේ දේව දරුකම විෂයෙහි වූ සහෝදරත්ව විප්ලවය දියත් කරන ලද්දේ මුල් නත්තලේ දී ය.

උපන් කුළුඳුල් පුත්‍රයා දිව්‍ය පුත්‍රයාණන් වූ නමුත් මෝසෙස්ගේ ව්‍යවස්ථාව අනුව ජෙරුසලමේ දේව මාලිගාවට ගෙන එනු ලැබීමෙන් පවත්නා සම්මත නීතියට ගරුසරුව පක්ෂපාතීත්වය දැක්වීමේ ප්‍රගාමී විප්ලවීය පියවර ඉස්මතු කරනු ලැබේ.

ජුදා වංශයට උපන් රාජකුමාරයකුගේ ආරංචිය කනවැකුණු හෙරෝද් රජ උපන් ජේසු බිළිඳාණන් මරා දැමීමට පිඹුරු පත් සකස් කළ අවස්ථාවේදී ස්වකීය දේව බලය නො පෙන්වා රැකවරණය පතා රහසිගතව මිසරයට යෑමෙන් ඔවුන් වහන්සේගේ විප්ලවයෙහි අහිංසකත්වය පිළිබිඹු වේ.

ජේසු උපත වූ නත්තල විප්ලවීය නවයුගයක උදාව බව සනිටුහන් වෙන්නේ ඒ අවධියේ රජයු ධනය, බලය, තානාන්තරය දඩ මීමා කරගෙන සාමාන්‍ය ජනයා තළා පෙළා ඉහළින් වැජඹීමේ දූෂිත සමාජ ස්ථරය විධ්වංසනය කිරීමේ ලා ජේසුස් වහන්සේ දියත් කළ දූත කාර්යය තුළින් ය.

පවත්නා සම්මත නීතිය රකින්නවුන් විසින් එය ස්වකීය බඩ ගෝස්තර වාදය කරගනිමින් නීතියට යටත් අහිංසකයන් තළා පෙළා දැමීම සාධාරණීය කරගෙන තිබුණු අවධියේ ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක් නීතියේ අකුර නොව දයාව ඉස්මතු විය යුතු බවය. නීතිය දුබලයන් වැනසීමේ නොව ඔවුන් සැනසීමේ හේතු සාධකයක් විය යුතු බවය. එය දේශනයකට අනුශාසනයකට පමණක් සීමා නො කළ ඔවුන් වහන්සේ ජුදා ආගමික නීතිය විසින් වැඩ කිරීමෙන් වැළකී සිටීමට නියම කරන ලද සබත් දවසේ දී පවා රෝගීන් සුවපත් කළ සේක. අසරණයන්ට සහන සැලසූ සේක.

ප්‍රසිද්ධ වෛශ්‍යාවකැයි චෝදනා කරනු ලැබ ගල් ගසා මරා දැමීමට නීතියේ ආරක්ෂකයාණන් විසින් තීන්දු කරන ලද අසරණ ස්ත්‍රිය තමන් හමුවට ගෙන ආ විට වරදක් කර නැති පුද්ගලයකු ඇයට පළමු වැනි ගල ගසන්නැයි පවසමින් පැමිණිලිකාර ධර්මිෂ්ඨයන්ගේ දෙබිඩි ජීවිත රටාව අනාවරණය කළ ජේසුස් වහන්සේ සමාජය විසින් පව්කාරයන් ලෙස කොන් කර දමන ලද අහිංසකයන් ඇසුරු කළ සේක. ඔවුන්ගේ අසහනය දුරු කළ සේක; ඔවුන් සමඟ ආහාර වැළඳීමට තරම් නිහතමානී වූ සේක.

එයට අමතරව එදා පැවති දඬුවම් පැමිණවීමේ සහ පළිගැනීමේ සාම්ප්‍රදායික චාරිත්‍රය අභියෝගයට ලක් කරමින්

“මම ඔබට කියමි. ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න; ඔබට වෛර කරන්නන්ට යහපත කරන්න; ඔබට ශාප කරන්නන්ට සෙත් පතන්න. ඔබට ගැරහුම් කරන්නන් සඳහා යාච්ඤා කරන්න; ඔබේ එක කම්මුලකට පහර දෙන අයට අනෙක් කම්මුලත් හරවන්න; අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්තහු ද ඔබත් ඔවුනට ඒ දේ කරන්න” යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ සේක.

ජුදා ජාතිය හිස් මුදුනින් පිළිගත් මෝසෙස්ගේ ව්‍යවස්ථාවලිය පිළිබඳ බලය ලත් විනයධරයන් සහ පරිසිවරුන් එම ව්‍යවස්ථාගත නීතිය විකෘති කර පොදු ජනයා පෙළන තත්ත්වයට පත් කිරීමේ වරද පෙන්වා දුන් ජේසුස් වහන්සේ යුක්ති ගරුත්වය, සාධාරණත්වය සහ සමානාත්මතාවය වෙනුවෙන් අභීතව කතා කළ සේක. ඔවුන් වහන්සේගේ උගැන්වීම්වල සහ අනුශාසනාවල හරය වුණේ වෛරය සහෝදර දයාවෙන් ජය ගැනීමේ, වස්තු තණ්හාව ත්‍යාගශීලිත්වයෙන් ජය ගැනීමේ සමාජ අසාධාරණය ඇප උපකාරයෙන් ජයගැනීමේ, පන්ති භේදය සමානාත්මතාවෙන් ජය ගැනීමේ විප්ලවීය චින්තනයයි.

අවසානයේ දී දේශපාලන සහ ආගමික බලධරයන් පවතින රජයටත් ස්ථාපිත ආගමටත් විරුද්ධ වූ විප්ලවවාදියකු ලෙස චෝදනා එල්ල කරනු ලැබූ ජේසුස් වහන්සේ කුරුසයේ ඇණ ගසා මරනු ලැබීමට හේතුකාරකය වුණේ මේ සාමකාමී විප්ලවය වේ.

එහෙත් නත්තල් දා උපන් ජේසුස් වහන්සේ දියත් කළ එවන් විප්ලවය තුළින් උදා වූ සාමකාමී නව යුගය අදත් ලෝක වාසීන්ගේ ඉෂ්ටාර්ථ සුභ සිද්ධිය අමරණීයව පවත්නා බව දැකගත හැකිය.

සාමකාමී නවයුගයක් උදාකරන නත්තලකට සුබ පැතුම් ඔබට

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**

# "මරන් අතා"
# ස්වාමිනී වැඩිය මැනව

ඔබවහන්සේ අප අතරට පැමිණ සිටියත් තවමත් අප ඔබවහන්සේව සොයා යන්නේ ඇයි? මෙවර නත්තලෙත් අප ඔබවහන්සේ වඩින තුරු උනන්දුවෙන් බලා සිටින්නේ ඇයි? ඔබවහන්සේ අප හදවත් තුළ නිරන්තරයෙන් වාසය කරන බව අප හොඳාකාරව දැන සිටියත්, හදවත වෙනත් දේවල් ද ඉල්ලා සිටින්නේ ඇයි? එක අතකින් අප ඔබවහන්සේගේ සපැමිණීම ඉතා උවමනාවෙන් බලාපොරොත්තු වූවත් අනෙක් අතින් අප හදවත් තාවකාලික දේවල් වනලින් පුරවාගෙන ඉතාමත් අසතුටෙන් කාලය ගත කරන්නේ ඇයි?

ඔබවහන්සේගේ සපැමිණීම අපි සැම වසරකම බලාපොරොත්තු නොවන්නේ නම්, ඔබවහන්සේ අප අතරට පැමිණ සිටින බව අපට අමතක විය හැකිය. මනුෂ්‍යයාට ඇත්තේ කෙටි මතකයන් ය. ඔබවහන්සේ වසර දෙදහකට පෙර අප අතරට මනුෂ්‍යයෙක් ලෙස පැමිණි බව අප සැම වසරකම සිහිපත් නොකරන්නේ නම් ඔබවහන්සේගේ මාංශගතවීමේ ගැඹුරු අර්ථය අපට ගිලිහී යා හැකිය. ඔබවහන්සේගේ අප අතරට පැමිනීම අප සැම වසරකම සැමරුවත් ආගමන කාලය අවසන් වූ විගස අපට ඒ බව ඉතා ඉක්මනින් අමතක වී යන හැටි! මනුෂ්‍ය වූ අපට ඇත්තෙන්ම ඇත්තේ ඉතා කෙටි මතකයන් ය.

අප අතරට පැමිණ සිටින පුද්ගලයකුව අපි නැවත නැවතත් පිළිනොගන්නේ නම්, එම පුද්ගලයාව අපට සැබවින්ම අගය කළ නොහැකිය. එමෙන්ම එම පුද්ගලයාගේ අගය ද අපට නොවැටහේ. එම නිසා අප අතරට වැඩ සිටින ඔබවහන්සේව දිනපතාම ඉතා සාදරයෙන් පිළිගත යුතුවේ. ඔබවහන්සේගේ පැමිණීම සඳහා ආධ්‍යාත්මිකව සූදානම් වීම තුළිනුත් අප හදවතට යම් තෘප්තියක්, සහනයක් සහ ආනන්දයක් ලැබේ.

අප අතර මාංශගත වී අපට ළඟා විය හැකි උපරිම ප්‍රමාණයට ඔබවහන්සේ අපට සමීප වී ඇත. එය කෙතරම් සමීපතාවයක් ද කියතොත් ඔබවහන්සේත් අනික් පුද්ගලයන් අතරත් කිසිදු වෙනසක් අපට දැකිය නොහැකි තරම්ය. ඔබවහන්සේ ගැන බොහෝ වේලාවට මිනිසුන් එතරම් තැකීමක් නොකරන්නේ ඒ නිසාම විය හැකිය. මනුෂ්‍යයන් ලෙස අප මේ ලෝකයේ ජීවත් විය යුතු ආකාරය අපට අනාවරණය වූයේ ඔබවහන්සේගේ ඒ සාමාන්‍ය දෛනික ජීවිතය තුළය. එම අතිශයින් සාමාන්‍ය ජීවිතය ඔබවහන්සේ අතිශයින් අසාමාන්‍ය ලෙස අතිශයින් උත්තරීතර සහ උදාර ලෙස ජීවත් වුණි. දේවත්වය තුළ අඩංගු සියළුම ගුණ ලක්ෂණයන් ද අනාවරණය වූයේ, විද්‍යාමාන වූයේ, නිරූපණය වූයේ, එම අතිශයින් සාමාන්‍ය වූ ඔබවහන්සේගේ දෛනික ජීවිතය තුළය.

ඔබවහන්සේ සදාකාලික ආගමනයයි. දැනුවත්ව හෝ නොදැනුවත්ව, සැම ජාතියක්ම, සැම ආගමක්ම, සැම සංස්කෘතියක්ම, සැම ජනකොට්ඨාශයක්ම පුල පුලා බලා සිටින්නේ ඔබවහන්සේගේ පැමිණීම නොවේ ද? සැම මනුෂ්‍ය හදවතක්ම ගැඹුරින්ම ඉල්ලා සිටින්නේ ඔබවහන්සේගේ පදිංචි වීම නොවේ ද? ඔබවහන්සේ පදිංචි නොවූ හදවත, තම සැබෑ වාසස්ථානය නොදන්නා හදවතකි. එම හදවත හැමදාටම තැන් තැන් වල ලගින හදවතකි. ස්ථිර පදිංචියක් නොමැති හදවතකි.

ඔබවහන්සේගේ සදාකාලික පැමිණීම නිසා ඔබවහන්සේ කිසිසේත්නම විඩාවට පත් නොවන්නේ ය. ඔබවහන්සේගේ ක්‍රියාකාරිත්වය තුළම ඔබවහන්සේගේ විවේකය ද අඩංගු වී ඇත. ඔබවහන්සේ සදාකාලික මේ මොහොතයි. අතීතයත්, වර්තමානයත්, අනාගතයත් සදාකාලිකවම මේ මොහොත තුළ ඔබවහන්සේ තුළ අඩංගු වී ඇත. ඒ අනුව ඔබවහන්සේගේ මාංශගත වීම අවුරුදු දෙදහකට පෙර සිදුවූ දෙයක් වූවත් එහි බලපෑම සදාකාලිකය. අනන්තය.

ඔබවහන්සේ සැම දෙයකටම අතිශයින් සමීපය. එමෙන්ම සැම දෙයකින්ම අතිශයින් දුරස්ථය. මේ ලෝකයට හරියාකාරව ආදරය කළ හැක්කේ සේවය කළ හැක්කේ එවිටය. ලෝකයට ආදරය කිරීමට ලෝකයට ඇලී ගැලී නොසිටිය යුතු වේ. ඔබවහන්සේ අප අතර සර්ව සම්පූර්ණවම මාංශගත වූවත් ඔබවහන්සේ සැබැවින්ම අයිති වූයේ ස්වර්ගයට ය. පෘථිවිය මත ජීවත් වන අතරතුර අප ස්වර්ගයට ද අයිති විය යුතු වේ. සැබෑ මනුෂ්‍ය ජීවිතයක් ගත කළ හැක්කේ එවිට පමනි. ඔබවහන්සේ ලෝකය තුළ ජීවත් වූවත් ලෝකයට අයිති වූයේ නැත. ලෝකයට ඇලී ගැලී ජීවත් වෙන්නා සැබෑ මනුෂ්‍ය ජීවිතයක් ගත නොකරයි. බහුතරයක් වූ අපගේ සැබෑ ශෝචනීය ඉරණම වී ඇත්තේ මෙය නොවේ ද? ස්වාමිනී ඔබවහන්සේ මෙන් පෘථිවිය මත ස්වර්ගීය ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වරම් අපට දෙනු මැනව.

අපගේ ජීවිත වලට ඇති එකම සැනසීම, සහනය සහ සංතෘප්තිය ඔබවහන්සේ අප අතරට පැමිණීමයි. ඔබවහන්සේ අප අතරට නොපැමිණියේ නම්, අපට ඔබවහන්සේව කිසිසේත්ම සොයා ගත නොහැකිය. ඔබවහන්සේ අප අතරට පැමිණ සිටින විටත්, ඔබවහන්සේව සොයා ගෙන යෑම අපට දුෂ්කර නම්, ඔබවහන්සේ අප අතරට නොපැමිණියේ නම් ඔබවහන්සේව සොයා ගැනීම කොතරම් දුෂ්කර වේද?

ඔබවහන්සේව සොයා ගැනීමට අපට නොහැකි වී ඇති නිසා, අපටත් අපව සොයා ගැනීමට දුෂ්කර වී ඇත. ඔබවහන්සේව හඳුනා ගන්නේ නොමැතිව අපට අපවත් හඳුනා ගත නොහැකිය. ඔබවහන්සේව නොදන්නා පුද්ගලයා වල්මත් වූ පුද්ගලයෙකි, අනාථ වූ පුද්ගලයෙකි. ඝන අන්ධකාරයේ ගිලී අතරමං වී සිටින පුද්ගලයෙකි. ඔබවහන්සේ නොමැතිව අපගේ ජීවිත වලට කිසිදු අර්ථයක් නැති බව ඉතා කටුක අත්දැකීම් වලින් අපට අවබෝධ වී ඇත. ඔබවහන්සේ අපගේ පාපකාරිත්වයෙන් අපව ගලවා නොගන්නේ නම් වෙනත් කිසිම බලවේගයකට, දේශපාලන මතවාදයකට, සංවර්ධන ව්‍යාපෘතියකට අපට ගලවා ගත නොහැකිය. ඔබවහන්සේගේ ප්‍රඥාව, යහපත, දයා කරුණාව, යුක්තිය, නිදහස, ගැලවීම සහ මඟ පෙන්වීම නොමැතිව මෙලොව තුළ මනුෂ්‍ය ජීවිතයක් ගත කිරීම අතිශයින්ම දුෂ්කර කටයුත්තක් වේ.

ඔබවහන්සේ අප අතරට පැමිණියේ අපගේ තාවකාලික ජීවිත සදාකාලික කරන්ටත්, අපගේ ආධ්‍යාත්මික දරිද්‍රතාවය පොහොසත් කරන්ටත් අපගේ දෛනික අසහනය සැබෑ ආනන්දයට නැං වීමටත් ය. ඔබවහන්සේ පුරාණයේ පොරොන්දු වූ ආකාරයටම අප අතරට පැමිණියේ ය. එසේ පැමිණියේ ස්ත්‍රියකගේ ශරීරයක් තුළින් අප මෙන් මනුෂ්‍ය ශරීරයක් ගෙන, මනුෂ්‍ය සීමාවන් නිහතමානීව වැළඳගෙනය. පාපය හැර අන් සැම දෙයකින්ම ඔබවහන්සේ අප හා සමාන විය. ඊට හේතුව පාපය මනුෂ්‍යයාට ස්වාභාවික වූ දෙයක් නොව ආගන්තුක දෙයක් වන හෙයිනි. පව්කාරයා තමාටම ආගන්තුකයෙකි. ඔහු හෝ ඇය මනුෂ්‍යත්වයේ සැබෑ ස්වභාවය නොහඳුනයි. නොදනියි.

ඔබවහන්සේගේ ජීවිතය තේරුම් ගැනීමට පාප විරහිත ජීවිතයක් ගත කළ යුතුවේ. අපගේ මනුෂ්‍ය ජීවිතයේ සීමාවන් අපට බාර ගැනීමට අමාරු වූවත්, ඔබවහන්සේට එය ප්‍රශ්නයක් නොවුණි. මනුෂ්‍ය ජීවිතයේ දුෂ්කරතාවයන් ගැන අප මැසිවිලි නැගුවත් ඔබවහන්සේට ඒවා දුෂ්කරතාවයන් නොවුණි. ඊට හේතුව වූයේ ඔබවහන්සේ ඒවා ඉතා නිහතමානීව බාර ගැනීමයි. අප කිරීමට අකැමති දේවල් වලට ඔබවහන්සේ ඉතා ධෛර්යයවන්තව මුහුණ දුන් සේක.

මැසිවිලි නගන්නේ නැතිව, නහයෙන් අඬන්නේ නැතිව, කලකිරෙන්නේ නැතිව මෙලොව තුළ මනුෂ්‍ය ජීවිතයක් ගත කළ හැක්කේ කෙසේ ද යන්න පෙන්වා දුන්නේ ඔබවහන්සේය. වේදනාකාරී අත්දැකීම් වලින් ඔබවහන්සේ පලා නොගිය සේක. ජීවිතයේ කටුක අවසානය දක්වා ඔබවහන්සේ ඒ සැම දෙයක්ම විඳ දරා ගෙන සිටි සේක.

දුෂ්කර අත්දැකීම් වලින් පලා යන්නා සැබවින්ම ජීවත් නොවන පුද්ගලයෙකි. සැම තත්ත්පරයක් තුළම පරිපූර්ණව ජීවත් වීමෙන් ඔබවහන්සේ පියාණන් වහන්සේට මහිමය ලබා දුන් සේක. සැම මොහොතකම පරිපූර්ණව ජීවත් නොවී දෙවියන් වහන්සේට මහිමය අත්කර දිය නොහැකිය. දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන පුද්ගලයා සැම මොහොතකම ජීවයෙන් පිරුණු පුද්ගලයෙකි. ඔබවහන්සේට කිසිදු මානව අත්දැකීමක් ආගන්තුක නොවුණේය. සැම මානව අත්දැකීමක්ම ඔබවහන්සේ විසින් වැළඳ ගන්නා ලද නිසා, ඒ හැම දෙයකින්ම ඔබවහන්සේට අපව ගලවා ගත හැකි විය.

සැම කටුක මානව අත්දැකීමක්ම බාර ගත හැක්කේ ඉතා නිහතමානී සහ නිදහස් පුද්ගලයෙකුට පමණය. එමෙන්ම ඒවාට මුහුණ දිය හැක්කේ ඉතා ධෛර්යවන්ත පුද්ගලයකුට පමණය. වේදනාකාරී අත්දැකීම් වලින් පලා යන්නා නිදහස් පුද්ගලයකු නොවේ. ප්‍රඥාවන්ත පුද්ගලයකු ද නොවේ. අපව සම්පූර්ණයෙන්ම නිදහස් කළ හැක්කේ සර්ව සම්පූර්ණ ලෙස ජීවත් වූ ඔබවහන්සේට පමාණය. බෙත්ලෙහෙමේ සිට කල්වාරිය දක්වා වූ ඔබවහන්සේගේ නිහතමානි ජීවිත චාරිකාවට අවධානය යොමු නොකර, සැබෑ මිනිසුන් ලෙස අපට මේ ලෝකය තුළ කෙසේ ජීවත් විය හැකි ද යන්න සිතා ගැනීමට පවා අපහසුය. ඔබවහන්සේත් දුක් වින්ද නිසා ඔබවහන්සේට අපගේ දුකේ දී අපට සැබැවින්ම පිහිට විය හැකිය.

අපගේ වර්තමාන ඉතා දරුණු සහ කෲර ලෝකය තුළ ඔබවහන්සේ අපව කිසිසේත්ම අත් හැර දමා නොයන සේක. ඒ අනුව ඔබවහන්සේගේ මෙවර පැමිණීම අළුතින්ම සිදු වන දෙයක් නොවේ. මෙවරත් අප අතරට පැමිණ, ඔබවහන්සේ අපට මතක් කර දෙන්නේ ඔබවහන්සේගේ අඛණ්ඩ, නොනවතින, සදාකාලික ක්‍රියාකාරිත්වයයි. ඔබවහාන්සේ විගමනය නොවන ආගමනයයි.

ඔබවහන්සේගේ ශුද්ධ ලියවිල්ල අවසන් වන්නේ ද ඔබවහන්සේගේ සපැමිණීම සම්බන්ධයෙන් වීමද කොතරම් ආනන්දයට කරුණක් ද ? "ආමෙන්. ජේසුස් ස්වාමින් වහන්ස වැඩිය මැනව" (එළිදරව්ව 22:20). මෙලෙස ප්‍රාර්ථනා කළ හැක්කේ සූදානමින් සිටින හදවතකට පමණි. අවදියෙන් සහ අවදානයෙන් සිටින හදවතකට පමණි. ඔබගේ හදවතත් එවැනි වූ හදවතක් ද?

මහාචාර්ය ඇන්ටන් මීමන



## මරිමව් තුළින් බිලිඳු සොයා යමු

# දිළින්දන් දේව රාජ්‍යයට කැඳවන කිතු උපත

සකල මිනිස් සංහතියට අහිමි වූ දේව රාජ්‍යයේ උරුමය යළි ලබා ගැනීමට නම් දේව පුත්‍රයා වන කිතු සමිඳුන්ගේ රුධිර පූජාවෙන් එය ඉටු විය යුතු බව දේව සම්මතය විය. ඒ අනුව කිතු සමිඳුන් මනුවෙස් ගෙන මෙලොවට පහළ වීමේ විමුක්ති ගමන දෙවිඳුන් ක්‍රියාත්මක කළේය. දේව රාජ්‍යයේ උරුමය දිළින්දන්ට හිමිවිය යුතු බවද දේව නියමය විය. ඒ අනුව කිතු උපත දිළිඳු උපතක් වූයේය.

එදා බෙත්ලෙහෙමේ නත්තල් රාත්‍රිය විශ්වයේ උත්පාදක දෙවිඳුන්ගේ පුත්‍රයාණන් වූ කිතු සමිඳුන්ගේ කිතු උපත කිසිවෙකු නොදන්නා අප්‍රසිද්ධ උපතක් විය. එම ශුද්ධවූ රාත්‍රියේ කිතු උපතේ මංගල පණිවුඩය ස්වර්ගීය සුරදූතයන් ගීතිකා ගයමින් ප්‍රකාශ කළේ ද මිටියාවතේ ගව බැටළුවන්ට තණ කවා නිදා සිටි සමාජයේ පහත් යැයි සැලකූ දුගී එඬේරුන්ට නොවේ ද? මෙම අති ගැඹුරු සංසිද්ධියේ අරුත සොයන්නට මෙතෙක් විශ්වයේ කිසිවකු විමර්ශනය කළ බවක් නම් නොපෙනේ. උන්වහන්සේගේ නාමයෙන් පිහිට වූ ශුද්ධ වූ සභාව පවා කිතු උපතේ දිළිඳු ගවහලේ කතාව පවා සම්පූර්ණයෙන්ම මකා දමා ඇති බව පෙනේ.

අද නත්තල් රාත්‍රිය මහා සැණකෙළියකි. කා බී නටා ගයා වයා තරු හෝටල්වල හා මහා ධන කුවේරයන්ගේ හා ඇති හැකි බලවතුන්ගේ රාජකීය සාදයකි. නත්තල් මැදි රැයේ ජේසු බිළිඳු ප්‍රතිමාව ඔසවාගෙන ගොස් දෙව්මැඳුරේ තැනූ කෘතිම ගවහලේ තැන්පත් කිරීමේ ශුද්ධවූ මොහොතේ හිමිකරුවෝ තවම මහ මඟය. අතරමඟය. ඔවුන්ට ඉඩම් නැත. නිවාස නැත. දේපල වස්තුව නැත. ආහාර නැත. වස්ත්‍ර නැත. සමහරු රෝගීව තනිවම රෝහල් වලය. සමහරුන්ව මැරයන් ලෙස සමාජ අසාධාරණයන් හමුවේ හංවඩු ගසා සිරගෙවල් වලය. ජේසු බිළිඳා දෙව්මැඳුරේ කෘතිම ගවහලේ නැති බව පිළිගන්න අප සැවොම අකමැතිය. දෙව්මැඳුරේ කෘතිම ගවලෙනට පෝලිමේ ගොස් පුද පූජා ඔප්පු කර බිළිඳු රූපය සිප වැළඳ ගන්නා සියල්ලෝ පාට පාට නත්තල් සාදය තනිවම භුක්ති විඳිති.

ගවහනේ සිටින නිර්මල මරිය තුමිය පීඩිත පංතියේ දිළිඳු කන්‍යාවියකි. සුරැකි පියාවූ ජුසේ තුමා දිළිඳු කම්කරුවෙකි. ඔවුන්ට මිල මුදල්, වතු පිටි යාන වාහන, වස්තු සම්පත් ශීත කළ මාලිගා සිනිඳු සළු පිළි නොවීය. ජේසු සමිඳු සිටින්නේ කෘතිම ගවහලේ නොව, පීඩා විඳින, සියළු සැප සම්පත් වරප්‍රසාද අහිමි පැල්පත්වල බව ශුද්ධවූ සභාවත් ශුද්ධවූ කිතුනුවන්වත් පිළිගැනීමට සූදානම් නැති බව පෙනේ. සුපිරි බලවතුන්ගේ සභාවක් ජේසු සමිඳු ගොඩනැඟුවේ නැති බව අපේ ප්‍රැන්සිස් සුදොතුම් පියාණෝ පවා පිළිගැනීම දිළින්දන්ගේ සභාවේ හොඳම සාක්ෂිය වන්නේය. ශුද්ධවූ සභාව තවම ජේසු දේශනා කළ සැබෑ දේව වචනය තුළ දේව ජනතාව බෙදා හදාගෙන ජීවත් කළ යුතු ක්‍රමවේදය හමුවේ අවිනිශ්චිතව අසරණ වී ඇත්තේය. කිතුනු සභාව දිළින්දන්ගේ සභාවක් බව සභාව ආරම්භයේම ප්‍රධාන ක්‍රිස්තු ශ්‍රාවකයෝ සියළු සම්පත් එකිනෙකා අතරේ බෙදා හදා ගනිමින් දේව ජනතාවට දුන් ආදර්ශය ශුද්ධවූ බයිබලයේ පැහැදිලි ලෙසම සඳහන් වන්නේ ය.

පමුණුගම
ජෝ. සංගපාලආරච්චි

ජේසු ගේ සියළු ශ්‍රාවකයෝ එදිනෙදා දිවි පෙවෙත ගෙන ගිය ලද දෙයින් තුටු වූ දිළිඳුන් වූයේය. එවැනි පැහැදිලි දැක්මක් ශුද්ධවූ බයිබලය තුළින් දැක දැකත් අප සියල්ලෝම ස්වර්ගීය වචනයට පිටුපා ධනය, බලය, සම්පත් ඉදිරියේ දණ නමා අවසානය.

ජේසුගේ උපතේ උරුමකරුවෝ දිළින්දන් බව පළමුව ප්‍රකාශ කළේ ජේසු සමිඳුන්ගේ මෑණියන් වූ නිමල මරිය තුමිය බව ශුද්ධවූ බයිබලය අපට උගන්වන්නේ ය. එය මරිය උදාන ගීතය නමින් සමස්ත විශ්වයටම ප්‍රකාශ වන්නේ මෙසේ ය.

"එවිට මරිය තුමිය මෙසේ උදන් ඇනුවාය. මාගේ හද සමිඳුන් ලෙස උසස් ලෙස පසසයි. මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි. කුමක් නිසාද එතුමාණෝ සිය දාසියගේ දීනතාව සලකා වදාළ සේක. හැම පරපුරක්ම මෙතැන් සිට මට භාග්‍යවන්තී යයි කියනු ඇත. පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක. එතුමන්ගේ දයාව සියළු බැතිතුමන් කෙරෙහි පරපුරෙන් පරපුරට පැතිරේ. සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා උඩඟු දීනයන් උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. (ශු. ලූක් මරිය උදාන ගීය 1:46-53)

දේව රාජ්‍යයේ උරුමකරුවන් ගැන ජේසු සමිඳුන්ගේ මාතාවන් වන මරිය මව් තුමිය එසේ ප්‍රකාශ කළේ නම් ශුද්ධවූ සභාව සහ ශුද්ධවූ දේව ජනතාවට දේව සැලැස්මට පිටුපා ධනය, බලය, වස්තුව පසු පස හඹා යන දහමක් නිර්මාණය කිරීමට බලය දුන්නේ කවුද? ජේසු සමිඳුන් සිය පළමු දේශනය ආරම්භ කරන්නේ ද, දිළින්දන්, පීඩිතයන්, වරප්‍රසාද අහිමි වහලුන් මුදවා ඔවුන් දේව රාජ්‍යයට කැඳවන බව ශුද්ධවූ බයිබලයේ සඳහන් වන්නේ මෙසේ ය.

"උන්වහන්සේ තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවරට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී ධර්ම ශාලාවට වැඩම කර කියවීම පිණිස නැගිට සිටි සේක. එවිට දිවැස්වර යෙසායාගේ ග්‍රන්ථය උන්වහන්සේට දෙන ලද්දේය. උන්වහන්සේ ග්‍රන්ථය දිග හැර මෙසේ ලියා ඇති තැන සොයා ගත් සේක. "ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. කුමක් නිසාද දිළිඳුන් හට සුභාරංචිය දේශන කරනු වස් උන්වහන්සේ මා ආලේප කල සේක. වහලුන්ට මිදීමද අන්ධයන්ට පෙනීමද ලැබෙන බව දන්වන්ටත් පීඩිත වූවන් මුදන්නටත් ස්වාමින් වහන්සේගේ

14 පිටුවට »




අභිමානවත් නත්තල, ජේසු බිළිඳුන් කේන්ද්‍රීය කොට සැමරුණත් ඊට පසුබිම් වූ දේවමාතාවහන්සේගේ භූමිකාව කිතුනු බැතිමතුන්ගේ අවධානයට කෙළින්ම ලක්වී නොමැත.

මරිය වසර සමරන මෙසමයෙහි කතෝලික ජන හද වැදගත් නිසා මරිය මාතාවන් ගැන මෙනෙහි කිරීම කාලෝචිතය. අප ජේසු සමිඳාණන් මනුකය ගෙන මනුෂ්‍ය පෙළපත පාපදෝෂයෙන් ගලවා ගැනීමේ මහඟු මෙහෙය ඇරඹුණේ නත්තල් දින ක්‍රිස්තෝත්පත්තියෙන් බව අපි දනිමු. එහෙත් ඊට පළමුව කුමරි මරියාවන්ගේ සූදානම්වීමද ඉතා වැදගත් වේ. "දේවමාතාවන්ගේ සුවිශේෂය" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන ශු. ලූක් තුමාගේ සුවිශේෂය කුමරි මරියාවන්ගේ භූමිකාව ඉතා කදිමට ගෙන හැර පායි.

දෙවියන් වහන්සේගේ දූතයා, කුමරි මරියාවන්හට මංගල පුවත සැල කළ සඳ, ඕතොමෝ කැළඹී විපිලසර වූයේ එතුමිය අහිංසක දේව ගරු බිය සම්පන්න, ගැමි, ජුදා ළඳක් වූ නිසාමයැ, එහෙත් දේව දූතයා ඇය අස්වසාලමින්, බිය නොවන ලෙසද දෙවිනයන් වහන්සේ විපුල ප්‍රසාද ලබා ඇති බවද පිළිසිඳගෙන පුතෙකු බිහිකරන බවද, උන්වහන්සේට ජේසුස් යන නම තබන ලෙසද පැහැදිලි කළේය. තවදුරටත් කරුණු පැහැදිලි කළ දූතයා දිව්‍ය බිළිඳාණෝ ශ්‍රේෂ්ඨ වන බවද පරමෝත්තමයාණන්ගේ පුත්‍රයා යැයි කියනු ලබන බවද, දාවිත්ගේ සිංහාසනය ප්‍රදානය කරනු ලබන බවද, ජාකොබ්ගේ වංශයේ සදහටම රජකම් කරන බවද, එසේම උන්වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නොමැති බවද අනාවරණය කළේය.

මේ සියල්ලට සාවධානව සවන් දුන් මරිය තොමෝ, පුරුෂයකු නොමැතිව මේ අරුමය සිදුවන්නේ කෙලෙස දැයි විචාලේය. ඊට පිළිතුරු වශයෙන් දේව දූතයා සර්ව පරාක්‍රම දෙවිපියාණන්ගේ අසීමිත බලය ගැන හඳුන්වා දුන්නේ මෙලෙසයැ. එනම් ශුද්ධාත්මයාණෝ මරියාවන් කෙරෙහි පහළ වන බවද, පරමෝත්තමයාණන්ගේ ආනුභාවය එතුමිය සිසාරා යන අතර, ඇගෙන් බිහිවන පරිශුද්ධ දරුවා දේව පුත්‍රයා යැයි හැඳීන්වුවද වඳ කාන්තාවක් කී ඇගේ ඥාතිවරියව එළිසබෙත්, මහළු වියේදී පුතකු පිළිසිඳගෙන, දැනට පස් මසක ගැබිණියක් බවත් හෙළි කරමින් දෙවි මහෝත්තමයාණන්ට නොකළ හැකි කිසිවක් නැතැයි තහවුරු කළේ මරියාවන්ගේ සියලු සැක සංකා හිරු දුටු පිණි මෙන් දුරු කරමිනි.

මෙමඟින් සැනසීමට පත් වූ සහ සැහීමට පත්වූ කුමරි මරියාවෝ බැතිබරව ප්‍රකාශ කළේ තමන් ස්වාමින් වහන්සේගේ දාසිය බවද, දේවදූතයා සැල කළ පරිදි සියලු කරුණු කාරණා එලෙසම ඉෂ්ට සිද්ධ වේවා යනුවෙනි.

මෙම ඓතිහාසික ප්‍රකාශය මඟින් මරියතුමී සිය කැමැත්ත දේව කැමැත්තට අඩංගු කළ නිසා, ගැලවීමේ ක්‍රියාදාමයේ මුල් පියවර තැබුණි. මෙම ඓතිහාසික හමුවීමෙන් පසු දූතයා ඉවත්ව ගියේද අමන්දානන්දයට පත්ව, දෙවි මහෝත්තමයාණන්ට ස්තුති ප්‍රශංසා කරමින් බව නිසැකය.

දේවදූතයා දුන් ආරංචිය අනුව, එතුමිය දෙමාපියන්ටද මෙම විත්තිය දන්වා, කඳුකරයෙහි නුවරක විසූ එළිසබෙත් බැහැදැකීමට ගියේ සිතෙහි තැන්පත් වූ ධෛර්යය සතුට නිසා බව නිසැකය. විපුල ප්‍රසාදලත් මරියාවන්ගේ ආචාරය සවනට වන් කළ, එළිසබෙත්ගේ කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලගිය බව ශු. ලූක් තුමා සඳහන් කරයි. එලෙසම එළිසබෙත් තුමිය ද ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව හඬ නගමින් මරියාවන් අමතා ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දීය. ඔබ කුස ඔත් දරු ඵලය ද ආශිර්වාද ලද්දේය. මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙතට පැමිනීමට තරම් මම කවරෙක් ද? යනුවෙන් පැවසීම කුමරි මරියාවන්ගේ සුවිශේෂී භූමිකාව ඉස්මතු කරයි.

දේව මාතාවන්ගේ උදාන ගීතය (ශු. ලූක් සුවිශේෂයේ සඳහන් පරිදි) දෙවි පියාණන් විසින් එතුමිය ගැලවුම්කරුවාණන්ගේ මව ලෙස තෝරා ගැනීමේ ගැඹුරු යථාර්ථය කදිම ලෙස හෙළි කරයි. මරියාවන්ගේ බැහැපත්කමද, දේව කැමැත්තට අනුකූලවීම ද, දෙවි මහෝත්තමයාණන්ගේ බලපරාක්‍රමය ද එමඟින් උඩඟු බලවතුන් නෙරපා හැර, බැතිමත් අසරණ ජනතාව ඔසවා තබමින්, ඔවුන් පෝෂණය කරන අයුරුද විග්‍රහ කරන්නේ මෙලොව සුසිත් ජනතාවගේ පැතුම, බලාපොරොත්තුව ගැලවුම්කරුවාණන් වූ ජේසු සමිඳාණන් බව හුවා දක්වමිනි. එම ගැලවුම්කරුවාණන්ගේ මව වීමේ වරම ලැබූ කුමරි මරියාවන් අද දක්වා පරපුරෙන් පරපුරට භාග්‍යවත් මාතාවෝ ලෙස හඳුන්වන්නේ මේ නිසා නොවේ ද?

අසිරිමත් මුල් නත්තල් දින බෙත්ලෙහෙම් පුරවරයේ දී මරියතොමෝ දිව්‍ය පුත්‍රයා බිහි කරන්නේ හුදකලාව වුවද එළිසබෙත් සමඟ විසූ තෙමසක කාලය, මරියාවන්ට දරු ප්‍රසූතියේ කරුණු කාරණා අවබෝධ කරගැනීමට ඉවහල් වූවාට නිසැකය. එඬේරුන් විසින් දිව්‍ය බිළිඳු බැහැදැක, දේව දූතයා හෙළිකළ ආනන්දජනක මංගල පුවත, ස්වර්ගීය සේනාවන්ගේ පැසසුම් ගීතාවලිය, ආදී අසිරිමත් සිදුවීම් ගැන මරියාවන්ට පැවසූ කල ඕතොමෝ සියලු කරුණු සිත්හි රඳවාගෙන මෙනෙහි කළ බව සුපුවත සඳහන් කරයි. පසු කලෙක ජේසු බිළිඳා කැප කිරීම පිණිස ජෙරුසලෙම් නගරයට පැමිණි කල්හි සිමියොන් නම් බැතිමතා දිව්‍ය බිළිඳු දෝතින් රැගෙන කී ප්‍රශංසා ගීයද, මරියාවන් අමතා අනාගතයේ ඇගේ හදවත කම්පා වන සිදුවීම් ගැන කී අනාවැකි ද ඕතොමෝ සිත්හි ධාරණය කොට මෙනෙහි කළාට නිසැකය.

පෙරදිග ශාස්ත්‍රවන්තයින් පැමිණ පසඟ පිහිටුවා වැඳ නමස්කාර කරමින් ත්‍රිවිධාකාර පඬුරු ඔප්පු කිරීම් ද කුමරි මරියාවෝ මෙනෙහි කළහ. එසේම කුරිරු හෙරෝද් රජුගෙන් ජේසු බිළිඳු රැක ගැනීම පිණිස ජුසේ තුමන් සමඟ මිසරයට පලා යෑමද ඇගේ සිත්හි සනිටුහන් වන්නේ අනාගත සිදුවීම් සමඟ මෙනෙහි කිරීමටය. ජෙරුසලම්හි දේවමාලිග ාවේ ජේසු කුමරුන් මඟ හැරුණු සිදුවීමට ඊට එකතු කළ හැකිය. පසුව සිය වල්ලභයාණන් වූ ජුසේ තුමන් සමඟ ජේසු කුමරු රැක බලාගෙන පෝෂණය කළාය. ජේසු සමිඳුන් ප්‍රඥා මහිමයෙන් ද කාය ශක්තියෙන් ද දෙවියන් වහන්සේගෙන් සහ මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින් ද වැඩුනු බව ශු. ලියැවිල්ල පෙන්වා දෙයි.

පසු කලෙක අප සමිඳාණන් නාසරෙත් හි දේශනා කළ අවස්ථාවේ විස්මිත වූ නාසරෙත් ජනතාව උන්වහන්සේ හැඳින්වූයේ "මොහු මරියාගේ පුතා නොවේ ද?, මොහු වඩුවාගේ පුතා නොවේ ද? යනුවෙනි. අප සමිඳුන්ගේ ශ්‍රී මරණය මෙන්ම උත්ථානය දක්වාම දේව මාතාවන් රැඳී සිටියේ මේ සියලු අනාවැකි, කරුණු කාරණා මෙනෙහි කරමින්, ආවර්ජනා කරමින් බව නිසැකය. එළිසබෙත් ඉදිරියෙහි කළ උදාන වාක්‍යයන් එතුමියගේ නිහතමානී ප්‍රීතිය ප්‍රකාශ කළද, ජේසු කුමරු ඇති දැඩි කිරීමේදී සුපුරුදු මාතෘක බලාපොරොත්තු තිබුණද, තරු ජේසු සමිඳු කුරිරු මරණයට ගොදුරු වීම, දැඩි කම්පනයට පත් කළ බව නොඅනුමානය. එහෙත් ජේසු සමිඳු පිළිසිඳ ගැනීමේ සිට අජරාමර විජයග්‍රාහී උත්ථානය දක්වා සියලු සිදුවීම්, අප දේව මාතාවන් සිත් සතන් දේවාලම්භණ ප්‍රීතියත් පුරවාලු බව, ගැලවීමේ උදාර මෙහෙය අවසන් හි පැහැදිලිය. ඒ සියල්ලේ ඕ තොමෝ මෙනෙහි කළහ.

සාමයේ කුමරුන් වූ දිව්‍ය ගැලවුම්කරුවාණන් වූ ජේසු සමිඳුන්ගේ උත්පත්තිය සමරන කල්හි ඊට පුරෝගාමී වූ එහෙත් පසුබිමේ සිටියාවේ කන්‍යා මරිය මාතාවන්ගේ භූමිකාව සමාජයේ සැමරීම, පූර්ණ නත්තලක් සැමරීම ලෙස හුවා දැක්විය හැකිය. එය ජේසු සමිඳුන්ටම කරන්නාවූ උපහාරයක්ම වන්නේය.

**වෛද්‍ය නෙල්සන් දයානන්ද වැලිකඩආරච්චි**
මීගමුව

# නත්තල යනු තවත් උපන්දින සාදයක් පමණක් ද?

නත්තල හෙවත් ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය කිතුනුවන් වූ අපට සුවිශේෂී දිනයකි. ඒ ක්‍රිස්තුන් වහන්සේ මිනිස් බව ගෙන මෙලොව ඉපදීමේ අසිරිමත් සිදුවීමයි. අප ආදි මව්පියන්ගේ අකීකරුකමේ හා උඩඟුවීමේ වරද සමඟ මිනිස් ලෝකයට උරුම වූ ශාපකාරී පාපයෙන් සකල මිනිස් වර්ගයා මුදා ගැනීමේ උතුම් වූ කාර්යය ඉටුකරනු වස් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සඟ ලොවින් බැස මනු ලොවට වැඩම කිරීම නත්තලේ දී අපි සමරන්නෙමු.

නත්තල හෙවත් ක්‍රිස්තෝත්පත්තිය ආධ්‍යාත්මික උත්සවයකි. නිදහස් කැමැත්ත අයුතු ලෙස හා උඩඟුවෙන් යුතුව පාවිච්චි කිරීම නිසා මිනිස් ජීවිතය තුළ පාපයද කාලකන්නිකමද එහි විපාකය වූ ශාපය ද මිනිසා උරුම කරගත්හ. එහෙත් තම උතුම් මැවිල්ල වූ මිනිසා වෙත දෙවියන් වහන්සේ දක්වන අසීමිත ප්‍රේමය මිනිස් ලොවට දානය කිරීමේ ප්‍රතිඵලය ලෙස ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙලොව උපදීම දැක්විය හැකිය. දේවත්වය හැර දමා මනුලොවට වැඩම කළ දෙවි පුතනුවන්ගේ ඉපදීම අප සමරනු ලැබිය යුත්තේ ද එහි ඇති ආධ්‍යාත්මික වටිනාකම් මෙනෙහි කිරීම තුළයි. එහෙත් අද නත්තල වානිජකරණය වීම නිසා මේ උතුම් ආධ්‍යාත්මික උත්සවය බාහිර අලංකාරයෙන් පිරුණු තවත් උපන්දින සාදයක් බවට පත් වී ඇත.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දේව පුත්‍රයාණන්ම වන බව කිතුනුවන් වූ අප තරයේ විශ්වාස කරමු. අදහා ගනිමු. ඔවුන් වහන්සේ කන්‍ය මරියෝත්තමාවන්ගේ කුස තුළ පිළිසිඳගෙන මෙලොව ඉපදීම පවුකරුවන් වූ අපට සැනසීමකි. සහනයකි. සතුටකි. ඔවුන් වහන්සේ මෙලොවට වැඩම කර වසර 33 ජීවත්ව දුක් විඳ තම ජීවිතය යාගයක් ලෙසට පූජා නොකෙළේ නම් මිනිස් අපට පාපයෙන් ගැලවීමක් හෝ මිදීමක් හෝ අත් නොවනු ඇත. නත්තල තුළ කිතුනු අප විශේෂයෙන් මෙනෙහි කළ යුත්තේ ඔවුන් වහන්සේ මෙලොව ඉපදීමේ සුබාරංචිය පමණක් නොව, මිනිසා පාපයෙන් ගලවා ගැනීම සඳහා වූ ඔවුන් වහන්සේගේ ගැලවීමේ කාර්යයේ වටිනාකමයි. එහි ඇති අමිල බව හා එහි ඇති පූර්ණ වරප්‍රසාදමය තත්ත්වයයි. එමෙන්ම ඔවුන් වහන්සේගේ දෙවන ආගමනයේ බලාපොරොත්තුවයි.

එහෙත් කිතුනු අප නත්තල ගත කිරීමට පුරුදුව ඇත්තේ වඩ වඩාත් බාහිර දෙයට යොමුවීම තුළයි. මෙසියස් වහන්සේ හෙවත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දේවත්වය හැර දමා මනුලොව ඉපදීම ගැන අප හද පත්ලෙන්ම සතුටු විය යුතුය. උත්සවාකාරයෙන් සැමරිය යුතුය. එහෙත් කිතු උපතේ ආධ්‍යාත්මික හරය ද අප හැල්ලුවට ලක් නොකළ යුතුය. දෙවියන් වහන්සේ ප්‍රේමය ය. ප්‍රේමය දෙවියන් වහන්සේ වන සේක. සාමයේ හා ප්‍රේමයේ උල්පත ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වන සේක. ඔවුන් වහන්සේ දිළිඳුව, අසරණව, බැහැපත්ව ගවහලෙක ගවයන් මැද ගව ඔරුවක උපදින්නට හෝ සැතපෙන්නට තරම් බැහැපත් වූයේ නම් නිහතමානි වූයේ නම් දේව කැමැත්ත වූයේ එය නම් නත්තලේ අහිංසක බව නිහතමානි බව හා බැහැපත්කම කොතරම් වෙත් ද? එදා බෙත්ලෙහෙම් ගවහලේ නත්තලෙත් අද අපි සමරන නත්තලෙත් වෙනස කොතරම් ද? බාහිර දේ සඳහා අප කොතරම් වැයවෙයි ද? කෙබඳු අලංකාරකරණයකට යොමු වෙත් ද? මෙවැනි දේ තුළ කුමන වටිනාකමක් ද?

අද නත්තල, දුගියාගේ හෝ අසරණයාගේ හෝ පීඩිතයාගේ හෝ වහලාගේ හෝ කම්කරුවාගේ හෝ ගොවියාගේ හෝ පවුකරුවාගේ හෝ වහලාගේ හෝ කම්කරුවාගේ හෝ ගොවියාගේ හෝ පවුකරුවාගේ හෝ කොන්කරනු ලැබුවෙකුගේ හෝ නොව අතරමැදි වෙළෙන්දාගෙ ය. අප කණගාටු විය යුත්තේ අපේ නත්තල වානිජකරණය වීම ගැනයි. නත්තල ඇති කරන්නේ ද නැති කරන්නේ ද වෙළෙන්දාය. බහු ජාතික ව්‍යාපාරිකයා ය. මාධ්‍යය ආයතනය.

දෙසැ. පළමු දා හෝ ඊට කලින් දින කීපයක සිට හෝ වෙළෙන්දාට නත්තල්ය. සුපිරි නත්තලකට අවශ්‍ය සුපිරි බඩු භාණ්ඩ (මස් මාංශ වර්ග, ඉහළ පෙනේ මත්පැන්, ආනයනික කෑම වර්ග, කේක් වර්ග, නවීන විලාසිතාවන්ගෙන් පිරි ඇඳුම් පැළඳුම් විසිතුරු බඩු) සුපිරි වෙළෙඳ සැල්වල පිරී ඉතිරී ගොස්ය.

සුපිරි තරු පහේ හෝටලේ සිට යමක්කමක් ඇති කෙනාගේ නිවස දක්වා ඉහත කී සියලු දේ අඩු වැඩි වශයෙන් පරිභරණයට ගැනෙති. කිතුනුවන්ට හිමි ආයතන වලද X - mas පාටිය. හැම තැනම X - mas පාටිය. සිදුවන්නේ කුමක්ද අපිම නොදනිමු. කති, බොති, නටති, ප්‍රීතිවෙති. අහෝ එදා නත්තලේ, ගවහලේ තනිවුන ශු. පවුල ගැන කුමන කථා ද? කාටත් ඒ ගැන නිනව්වක් ද නැත. එදා ඔවුන්ට සිටියේ ගවහලේ උන් ගවයන් හා බැටළුවන් පමණි. සමාජයෙන් කොන් කරන ලද එඬේරුන්ගේ පැමිණීමද ඔවුන්ට සහනයක් විය. සතුටක් විය. දේව කැමැත්ත එය වූ විට ඔවුන් එය විඳ දරා ගත්හ. එහෙත් මෙම ආගමික උත්සවය වානිජකරණය වීම තුළ නත්තලේ සැබෑ අරුත යටපත් වෙමින් පැවතීම නොපෙනෙන නොහැඟෙන අවාසනාවන්ත තත්ත්වයකි. බාහිර අලංකාරය, හරසුන් වත් පිළිවෙත් හා නිසරු ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වය දීමෙන් වැළකී ආධ්‍යාත්මික වටිනාකම වටහා ගනිමින් නත්තලේ හරය දුක් විඳීනට හෝ අත් දකින්නට අපට හැකි නම් එය කොතරම් භාග්‍යයක් ද?

**රංජිත් නෝනිස්**
නාගොඩ

# වඩිනු දෙව් මැසියා

"නත්තල" යන සංකල්පය කිතුනු අප ජීවිත වලට කෙතරම් සමීපද, කෙතරම් හුරු පුරුදුද, එය සවන්ගත වන විට සිත් තුළ ප්‍රීතියක්, සතුටක් හට ගැනේ. නත්තලේ අසිරිය කිසිදාක, කිසිවිටෙක අප හදවත් වලින් බැහැර නොවනු ඇත. එය අපට අමුතුවෙන් විදහා දක්වන්නට වුවමනාවක් ද නොමැත. එය ඒ තරමටම අප සිත් හා කා වැදී ඇත.

නත්තල යනු කිතු උපතයි. එය අහම්බෙන් සිදු වූවක් නොවේ. ලෝකයට ගැලවුම්කාරයකු අවශ්‍යව තිබූ කාලවකවානුවක අප මැවුම්කාර දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ අනගි සම්පන්න පෙර සැළසුම් මත, නිසි කාලයේදී තම එකම පුත්‍රයාව මෙලොවට දායාද කළ සේක. පාපයේ වහල් බැමි බිඳ දමා, මුළු මිනිස් සංහතියට ගැලවීම සළසා දෙනු වස්, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගෙන මෙලොවට වැඩිය සේක.

අවුරුදු දෙදහසකට පෙර සිදුවුණු මේ සිද්ධිය දෙස අද බැලිය යුත්තේ, අළුත්ම ඇසකින්ය. දේව ප්‍රඥාවෙන් ය. එවිට දෙවියන් වහන්සේගේ මිනිසා සංහතියට දැක්වූ ශුද්ධවූත්, වෙනස්වූත්, අසීමිතවූත් ආදරය කොතෙක්ද කියාත් ගැලවුම්කරුවකු ලොවට එවීම පිළිබඳව උන්වහන්සේ තුළ තිබූ අනගි සැලසුම් කෙතෙක් විශ්මිත ද? කෙතෙක් උදාරද කියාත් අපට පැහැදිලිව පෙනෙනු ඇත.

"දෙවියන් වහන්සේ ලෝකයාට කෙතරම් ප්‍රේම කළා සේක් ද කිවොත් ස්වකීය එකම සහජාතක පුත්‍රයාණන් පවා ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ උන්වහන්සේ අදහන සියනලු දෙනා ගලවනු ලබන පිණිසය."

මේ වදන මඟින්, දේව ආදරයේ කගැඹුර, එහි විශාලත්වය මොනවට පැහැදිලි වි. ඒත් එක්කම,දේව ආදරය පිළිබඳවම පෙනෙන්නට තිබෙන කරුණක් තමයි. නත්තලේ ගුණාත්මක භාවය බොඳ වී ගොස් එය බාහිර ආටෝපයට බාහිර ක්‍රියාකාරම් වලට පමණක් අද නත්තල සීමා වෙලා. ඒ විතරක් ද පීඩිතයන්ට, අසරණයන්ට, වහළුන්ට, දිළිඳුන්ට විමුක්තියක් ගෙනෙන නත්තල අද වෙළෙඳුන්ගේ ධනවතුන්ගේ පාරාදිසයක් බවට පත්වී නැද්ද? මුදල් ඉපයීම ප්‍රමුඛ තැන බවට පත්වෙලා. ඔවුන් මුදල් පසුපස හඹා යන ආකාරය අපට හොඳින් දැක ගත හැකිය. ජනතාව ද ඒ අනුව පෙළ ගැසෙනු වැළැක්විය හැකිද?

දෙවියන් වහන්සේගේ වචනය, මරිය තුමී තුළ මාංශගතවීම, වචනය දරා ගැනීම, පෝෂණය කිරීම, වචනය බිහි කිරීම, මේ අභිරහස්මය ක්‍රියාදාමය නත්තල තුළින් අපට එළිදක්වනවා. අපට සිහිගන්වනවා. විමුක්තිදායකයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජනතාවගේ ගැලවුම්කරුවාණන් හැටියට ලොව පාලනය කරන්ට රජෙක් හැටියට, මේ ලෝකයට වැඩම කිරීම මොනතරම් ශ්‍රේෂ්ඨ ද මොනතරම් අගය කටයුතු ද? එය අප ජීවිත වලට කෙසේ බලපානු ඇද්ද? එදා මෙන් අදත්, අඳුරෙන් පිරි ලොව එළිය කරන්නට අප අතරට අප හදවත් තුළට මෙසියස් තුමාණෝ පැමිණිය යුතු නොවේ ද?

ශුද්ධාත්මයාණෙනි, කා බී, නටන අරුත් සුන් නත්තලක් සඳහා නොව, අප තුළ සමිඳුන් මාංශවත් වෙමින් අප ජීවිත තුළ විමුක්තියක් ඇති කරන නත්තලක් බිහි කළ මැනව.

**රිචඩ් වික්‍රමසිංහ** - බටගම



මරිමව් තුළින් බිළිඳු සොයා යමු

# අභියෝගවලින් පිරුණු අසිරිමත් කිතු උපත

**ලොව මෙතෙක් යම් උපතක් විවිධ පැතිකඩ ඔස්සේ අන්දෝලනයට/අභියෝගවලට තුඩු දුන්නා නම්, ඒ ජේසුස් ක්‍රිස්තු උපතයි. මෙම උපත එතරම්ම අභියෝග වලින් පිරුණු එකකි.**

ජේසු තුමා උපදින්නට ආසන්නව සිටියදී, ජන සංගණනයක් ගැනීම සඳහා බෙත්ලෙහෙම් නුවරට යන්නට සිදු විය. එය ඉතා දිගු ගමනක් වූ අතර, මරිය තුමියට ඇවිදීම පහසු නොවූ හෙයින්. ජුසේ තුමා විසින් ඇයට කොටළුවකුගේ සහය ලබාදුනි.

මෙය මෙම අපූර්ව උපතේ ප්‍රථම අභියෝගය නොවේ. අතීතයේ ක්‍රිස්තු පූර්ව එක්තරා දිනක ශුද්ධාත්ම බලයෙන් කන්‍යා මරිය තුමිය ගැබ්බර වූ විට, ඇයට එය මුලින් දරාගැනීම අපහසු වුයේ කිසිම මානුෂික සබඳතාවයක් නොමැතිව කන්‍යාවක වු ඇයගේ ගැබ් ගැනීම සමාජය කෙසේ බාර ගනිද යන්න ගැන සිතමිනි. නිසි ස්වාමි පුරුෂයකුගේ සම්බන්තාවයක් නොමැතිව ගැබ් ගැනීම මෙකල මෙන් එකලද ආන්දෝලනයට තුඩු දුන් සමාජ කතිකාවතක් විය.

එහෙත් මේ සැම අභියෝග යකටම ඇය මුහුණ දුන්නේ ඇය දේව කැමැත්ත ඉහළින්ම අගය කළ නිසාය. මෙම අභියෝග හමුවේ ඇයගේ නියම තත්ත්වය වටහාගත් ජුසේ තුමා නිසා ඇය විශාල සැනසිල්ලක් ලබන්නට ඇත.

නමුත්, කිතු උපතේ අභියෝග එතෙකින් නිමා නොවීය.

ගැබ්බර මරිය මාතාව අසරණව ශීතල රාත්‍රියේ වෙව්ලමින් ප්‍රසව වේදනා පැමිණි විට මෙම නන්නාඳුනන දේශයේ නොහඳුනන නිවෙස් වලට දොරවලට සිය ප්‍රසූතිය සඳහා උපකාර ලබාගැනීමට තට්ටු කළ විට ඒවා එකිනෙක වැසෙන්නට විය. මෙයින් මොන තරම් හුදකලාවක්, අසරණ බවක්, සිත් වේදනාවක් ඔවුනට දැනෙන්නට ඇද්ද?

දුප්පත් වූ පළියට, අසරණ වු පළියට සමාජ අසාධාරණයට ලක් වන්නේ අද පමණක් නොවන බව මින් පැහැදිලිය. එදා සමාජයේ



අසරණයින්ට සැලකූ ආකාරය ගැබ්බර මරිය තුමිය මුහුණ දුන් මේ සිදුවීමෙන් පැහැදිලි වේ.

මහ සයුරේ කොතරම් ජලය තිබුණත් තිබහට වතුර බොන්නට උපකාර වන්නේ කුඩා ළිඳක් බව පොදු ව්‍යවහාරයයි. එය මීට දෙදහස් වසරකට එහා සමාජයේද සිදු වූවක් බව සනාථ කරමින් අසරණව, පීඩාවෙන් යුතුව සිටි මරිය තුමිය සහ ජුසේ තුමාගේ පිහිටට පැමිණියේ, ඔවුන් වැනිම අසරණ වු එම පන්තියේ අයමය. පැත්තක තිබූ ගවයන් ලගින ස්ථානයකය. එම එඬේරුන් එතරම්ම හෝ කාරුණික වීම ඉතිහාසයේ විශිෂ්ටතම උපත සමග බද්ධව පවතී.

මිනිස් වාසයට ගවයින් සිටින තැනක් කොතෙක් දුරට සුදුසුද කියා නවීන වෛද්‍ය විද්‍යාව අනුව නම් සහනයක් බලාපොරොත්තු විය නොහැක. එසේ නම් මිනිස් දරු උපතකට. ගවයින් ලගින් ස්ථානයක් ගැන කියනු කිම.

මරිය තුමියට සිය ප්‍රසූතිය සඳහා උපකාර කිරීමට කාන්තාවක් පළාතක නොවීය. ඇය කොතරම් ශාරීරික සහ මාසසික පීඩාවක් විඳින්නට ඇද්ද? ඇයට ශක්තිය දෙන්නට ඇත්තේ දෙවියන් කෙරේ පැවති තදබල විශ්වාසයත්, සිය කුස තුළ සිටින අද්විතීය දරුවාත්, සෙවනැල්ලක් මෙන් සිටි ජුසේ තුමාත් පමණක් විය හැක.

වර්තමාන කාන්තාවකට කොපමණ මුදල් සම්භාරයක් ලබා දුන්නත්. ගව ලෙනකට ගොස් දරු ප්‍රසූතියක් සිදු කරාවියයි සිතීමට අපහසුය. සිතින්, ගතින්, පරිසරයෙන් කුමන අපහසුතා තිබුණත් මරිය මව එම අභියෝගයද ජයගෙන නිරෝගී දරුවකු, ලෝක ඉතිහාසය වෙනස් කළ බිළිඳකු ලොව පාපයෙන් මුදවා ගන්නට පැමිණි ගැළවුම් කරුවකු මෙලොවට බිහි කිරීමේ අභියෝගය ජය ගත්තාය.

ඊළඟට පැමිණි අභියෝගය වූයේ සක්වලින් එහා ගිය, කිසිදා නොපෑයු වල්ගා තරුවක්, ජේසු බිළිඳුන් මෙලොව එළිය දුටු ගවලෙනට ඉහළින් පායා තිබීමය. මෙම සිදුවීම එම වකවානුවේ කාගේත් පුදුමයට සහ කතා බහට පාත්‍ර වූ මාතෘකාවක් වූ අතර, රෝම අධිරාජ්‍යයේ පාලක පෙළැන්තියද සසල කරන්නට සමත් විය.

තාරකා විද්‍යාව ගැන දන්නා ප්‍රභූන් තිදෙනෙකු විවිධ පළාත් තුනක සිට මෙම සුවිශේෂී වල්ගා තරුව ඔස්සේ අලුත ඉපදුණු සුවිශේෂී කුමරකු සොයා ආහ. මේ බව දැනගත් හෙරෝද් රජ කලබලයට පත් විය. තම සිහසුනට අභියෝග කරන කුමාරයකු බිහි වී ඇතැයි සැකයෙන් දැවෙන්නට විය.

මෙකී භයානක අභියෝගයද ජය ගැනුණේ එකී රජුන් තිදෙනා හෙරෝද් රජු නැවත හමු නොවී, වෙනත් මාර්ගයකින් ආපසු යාම නිසාය.

ජේසුස් ක්‍රිස්තුන්ට නම් තැබීමද අභියෝගයක් විය. ඒ අනුව දිව්‍යමය මැදිහත් වීමෙන් ලොව අස්සක් මුල්ලක් හැර කියවෙන, සදාකාලිකව ගෞරවයට පාත්‍රවන නමක් ලෙස මේ කුඩා බිළිඳාට 'ජේසුස්' යන නම තබන ලෙස උපදෙස් ලැබිණි.

මෙලොවට බිහි වූ පසුවද ජේසු බිළිඳාට හෝ මවට හෝ පියාට සැනසීමක් ලැබුණේ නැත. තමාට අභියෝග කරන්නට කුමාරයකු බිහි වී ඇතැයි යන බිය නිසා, හෙරෝද් රජු කලබල විය. ඔහු ප්‍රදේශයේ අලුත උපන් බිළිඳුන් සියලු දෙනා මරා දැමීමේ තිරිසන් නියෝගය ලබා දුනි. එම අභියෝගයද ජය ගත් ජුසේ තුමා මරිය තුමිය ද බිළිඳුද රැගෙන ප්‍රදේශයෙන් පිටතට යන ලදි.

මෙසේ උපදින්නට පෙරත්, උපන්නාට පසුවත් මෙවන් අභියෝගාත්මක උපතක් ලෝකයේ මෙතෙක් සිදු වී නොමැත. සිදු වේ යයි සිතීමටද නොහැක.

එසේ නමුත් අද ලොව පුරා උත්තරාර්ධ ගෝලයේ සිට දක්ෂිණාර්ධ ගෝලය දක්වා අස්සක් මුල්ලක් නැර සියලු භේද වලින් තොරව සමරන එකම උපන් දිනය ජේසු උපන් අසිරිමත් නත්තල බවට පත්ව ඇත

**පද්මා පැඩ්ඩිලියන්**
රද්දොළුගම

# මහා සමාජවාදියාණෝ

**වසර දෙදහස් ගණනකට පමණ පෙර ප්‍රථම නත්තල දෙස ආපසු හැරී බලමු. එම පුරාවෘත්තය ඔබට මතක ඇති! බෙත්ලෙහෙමේ කුඩා ග්‍රාමයට සැතපුම් කිහිපයක් නුදුරින්වු තැනිතලා බිම් පෙදෙස් වලට මැදියම් රාත්‍රිය ආසන්නව තිබිණ. අහස් කුස තරු, දියමන්ති මෙන් දිදුලන්නට විය. විඩාබර කුඩා එඬේර කණ්ඩායම් සීතල ගල් පොළව මත නින්දට වැටුණා පමණි. එදිනෙදා අප ජීවන ගමනේ සිදුවන වෙනස්කම් මෙන් එහි කිසියම් වෙනසක් සිදුවේ යයි ඔවුනට පැහැදිලි හේතුවක් නොවීය. නමුත් සියල්ල සැලසුම් සහගතවිය. මනුෂ්‍ය ඉතිහාසයේ අතිශය වැදගත් රාත්‍රියක් හැටියට මෙම රාත්‍රිය ඉතිහාසයට එක්විය. චමත්කාරජනක මෙම රාත්‍රියේ මැදියම් රැයේ ගවයන් ලැගුම් ගන්නා කුඩා ගවලෙනක ජේසුස් නැමති තේජස්බල ඒ උත්තමයාණෝ මෙලොව බිහිවූහ.**

කිතුනුවන් ප්‍රමුඛ සකල ලෝකවාසිනට සනාතන ධර්ම මාර්ග යක් විවරකළ ජේසුතුමන්ගේ උපත නත්තල තුළින් සැමරුවද 'නත්තල' එයට වඩා ගැඹුරින් අධ්‍යයනය කළයුතු වචනයකි. නත්තල තුළ විවිධ අර්ථකථන, විවිධ විලාසිතා, විවිධ සැණකෙළි, විවිධ ගිතිකෙළි, විවිධ උත්සව, විවිධ රසාංග, විවිධ ඇඳුම් පැළඳුම්, විවිධ වත්පිළිවෙත්, විවිධ ආගමික වතාවත් තිබෙන්නට පුළුවන. නමුත් ඒවා සියල්ල බාහිර අලංකරණයට කැපවු ඒවා මිස සැබෑ නත්තල විවර කරන සංසිද්ධින් බවට පත්වී නොමැත.

නත්තල හුදු බාහිර අලංකරණයටම සීමාවූවක් පමණක් විය යුතුද? 'නත්තල' සැබෑ අරුත විය යුත්තේ කුමක් ද? ක්‍රිස්තියානි දහමේ නිර්මාතෘවරයා ජනිත වු මෙදින බාහිර අලංකරණයටම පමණක් කැපකර සිටිමුද? ජේසුතුමන් මෙලොවට පැමිණියේ ඇයි? එතුමන් ගවයන් ලැගුම් ගන්නා ස්ථානයක විඩාබර දිළිඳු එඬේර සමූහයා සමග උපත ලැබුවේ ඇයි? එතුමන් තම ජීවිත කාලය තුළ අපට කියා දුන්නේ! වදාළේ කුමක්ද? විවිධ උපමා උපමේය ගෙනහැර එතුමන් ජනතාවට පැහැදිලි කළේ කුමක් ද? එතුමන් පැවසු දහමේ හරය කුමක්ද?

අපට වැරදි කරන අයට අප සමාව දෙන්නේ කිසියම් ආකාරයකටද අපේ වැරදිවලට සමාව ලැබෙනුයේද ඒ ආකාරයෙන්ම බැව් එතුමාණන් අපට පැහැදිලි කළා; අපට කිසියම් කෙනෙකු වරදක් කළවිට අප සමාව දිය යුතුය යන්න එතුමන්ගේ ධර්මතාව විය. වම් අතින් දෙන දෙය දකුණු අතට නොදැනෙන්නට දෙන්නට කියා එතුමා වදාළා දේශනා කළා. ඔටුවකුට ඉදිකටු සිදුරකින් ඇතුල්වීමට වඩා ධනපතියකුට ස්වර්ග රාජ්‍යයට ළඟාවීමට අපහසු යයි එතුමා දේශනා කළා. ජේසුතුමාට සාමාන්‍ය ජනතාවගේ බඩගින්න වේදනාව අපහසුතාව දැනී ඒවා අවම කිරීමට, නැති කිරීමට එතුමා පියවර ගත් බැව් අපට පැහැදිලිය. වරක් තමා සමග සිටි සෙනඟට කෑම අවශ්‍ය බැව් දැනගත් එතුමාණන් එම පිරිසට කෑම ලබාදීමට සැලසුවා! ඔබ ඔබට ආදරය කරනවා සේම ඔබගේ අසල්වැසියාටද ආදරය ගෞරවය කළ යුතුයැයි පැවසු උන්වහන්සේ අසල්වැසියා කවරෙක්ද යන්න පැහැදිලි කළා! මේ මහා සමාජවාදියාණෝ මේ මහා විප්ලවවාදියාණෝ මේ ඉගැන්වීම් වලින් මොනවාද ප්‍රකාශ කළේ? මොනවාද අදහස් කළේ?

මෙලොව ජීවත්ව සිටි කාලය තුළ එතුමා සනිටුහන් කළේ කුමක් ද? වෙන කිසිවක් නොව මෙලොව අප ජීවත්විය යුතු ආකාරයයි. අප තව කෙනෙකුගේ දියුණුවට ජයග්‍රහණයට මං පෙත් අවුරනවා නම් ඒ තැනැත්තාට නත්තල සැබෑ ලෙස සැමරිය හැකිද? මන්ද නත්තල යනු මේ දේවල් නොකළ යුතුයැයි වදාළ මනුෂ්‍යයකුගේ උපත සිහිකිරීමක්. ලෝකයට පෙනෙන්නට දන් පින් කරන නමුදු තමා යටතේ රැකියාව කරන තමන්ට ලක්ෂ ගණන් මුදල් හම්බකර දෙන සේවකයන්ගේ ශ්‍රමයට සරිලන වැටුපක් නොගෙවන හාම්පුතාලට, තමා සමග එකට කිට්ටුවෙන් වාසය කරන අසල්වැසියාගේ කිසියම් සාධාරණ, ඉටුකළ හැකි ඉල්ලීමකට, ආයාචනයකට පිහිටක් නොවී උදව්වක් නොදී තමන් පමණක් ජීවත්විය යුතුය යන්න ධාරණය කරගෙන ඉන්නා අයට, තමන් ලොකු මහත් කළ වැඩිමහල් දෙමාපියන් මහළු නිවාසවලට තල්ලුකර පුරාජේ රුවට සිටින අයට යනාදි නා නා විධ නොකළ යුතු ක්‍රියාවල නියුතුවන නියුතුවන්නන් නත්තල් දිනට ප්‍රදර්ශණ භාණ්ඩ ලෙස හැඳපැළඳ පල්ලියට ගොස් ආගමික වතාවත් වල නියැලුණ පමණින් නත්තල අර්ථවත් වේද?

නත්තල යනු බදා ගැනීමක් නොව බෙදා ගැනීමකි. නන්දා මාලිනි ගායිකාවගේ නත්තල් අර්ථවත් ගීතයක් මට මතක් වෙයි.

"දුගී ළමෝ හඬත්දී පැල්පතේ
මන්දිරයක සාදයක්ය මිහිරි
නත්තලේ."

නත්තල අර්ථවත් වීමට නම් අප නොදැනුවත්ව කරන සියලු වැරදි ක්‍රියා අප වෙනස් කළ යුතුය. අඩුතරමින් ඒවා වෙනස් කිරීමට උත්සහයක්වත් ගත යුතුය. නත්තල යනු වෙනස් වීමකි. එසේ නොමැතිව ආගමික වත්පිළිවෙත්, මත් පැන්, ප්‍රිය සාද, අලංකාර ඇඳුම් පැළඳුම්, රතිඤ්ඤා, සුරාසැල්, ප්‍රිය සම්භාෂණ, සුඛෝපභෝගි වාහන, අලංකාර සැරසිලි හා කැරොල් ගීතිකා ගැයීම් ආදිය නත්තලටම නොවේ. නත්තල යනු ඔබගේ මගේ පමණක් නොව සැමගේ නත්තලයි. එසේ වීමට අප වෙනස්විය යුතුය. එවිටයි නත්තල අර්ථවත්වන්නේ.

ඔබ සැමට සුබ නත්තලක්!

**ගාමිණී පීටර්ස්**
පයාගල

## මතක් කළ මැන කිතුනු සංගෙට

**ජේසු උපතේ මහා අසිරිය සොබා දහමත් ලොවට පවසන**
**අමුතු තරුවක් අහස් කුස නැඟ එළිය දෙන විට ලොවම දිදුලන**
**විදෙස් බුද්ධිමත් රජ නිරින්දෝ පැමිණ ඇත ගවලෙන සොයා ගෙන**
**කිසිත් නොමදත් රටේ මහ රජ සිටි සැණකෙලියේ නටා ගෙන**

**මෙවන් පරිසර රටාවක් තුළ තැලුණ පෑගුන ජනතාව වෙත**
**විමුක්තියෙ නව මාවතක් අරුණාලු උදාකොට සාදා සුබ සෙත**
**සමාජය තුළ විෂම පරතර නැති කරන්නට පුදා ජීවිත**
**ජේසු බිහිකළ විමුක්තිය අපි සුරකිමුද අද කිතුනු බැතිමත**

**ඔබට අඳනා දෙකක් ඇත්නම් එකක් දෙන්නට නැති අයෙකු හට**
**දහම දෙසුමට ලොවට යන විට හිස් පතුලෙන්ම මඟ ගෙවන්නට**
**ලැබෙන දෙය තුළ තෘප්තිමත් වී අල්පේච්ඡව දිවි ගෙවන්නට**
**ප්‍රබල ලෙස මේ නත්තලේදී මතක් කළ මැන කිතුනු සංගෙට**

**බෙනී ජයමාන්න**
**පමුණුගම**




# හෙළ බසින් රචිත කිතු

ලෝකාරම්භයේ දී බිඳ වැටුණු දෙව් මිනිස් සබැඳියාව යළිදු එක්කරලන්නට අභිමත වූ දෙවිඳාණෝ කාලයට අනුගතව ආදි පිතෘවර, වීරනායක, රජවරු, දිවැසිවර.... යනාදි යුග නිමා කොට "කාලය සම්පූර්ණ වූ කල දේවත්වයේ උත්තරීතර බව පසෙකලා, මිනිසත් බව ගෙන අප හා සමාන මිනිස් කෙනෙකු වූ සේක. " (පිලිප්පි 2:3-11). (ගලාති 4:5) මනුෂ්‍යාකාරව සිටිමින් ස්වකීය ගැලවීමේ අභිරහස එනම් කුරුසියේ මරණය දක්වාම ම ඔවුන් වහන්සේ යටත් පහත්ව දේව කැමැත්තට හිස නමා කීකරු වූ සේක.

නත්තල් මංගල්‍යය හෙවත් ශු. සභාවේ තෙවන ප්‍රධාන මංගල්‍යය දෙස බැලීමේ දී එය හුදු උපතක්, සැමරුමක් නොවන්නේ ය. ප්‍රබල දෙවිඳාණන් දුබල මනුෂ්‍යයා හමුවූයේ මෙම උත්තරීතර මංගල්‍යයෙනි. දෙවිඳාණෝ මනුෂ්‍යත්වයට ගරු කොට මෙලොවට මාංශගතව මිනිසුන් හා වෙසෙන්නේ මෙම සැමරුම මඟිනි. ලාංකේය සංස්කෘතික දායාද තුළ විවිධාකාර සිතුවිලි ගුණ සමුදායන් එක් කොට නත්තල් මංගල්‍යය විවිධාකාරව පිළිබිඹු කළ ද, දේව ධාර්මිකව හා ශු. ලියවිලි පදනම මත හෙළ කිතුනු සාහිත්‍යයේ නිර්මාතෘවරයාණන් වන අති පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් හිමිපාණන්ගේ රචනාවන් අතිශයෙන්ම ප්‍රශංසනීය වූත් අනර්ඝ දායාදයන් ලෙස සැලකිය හැකිය. මන්ද එතුමාණෝ කිතු උපත දකින්නේ පලස්තීනයේ, රෝමයේ, ප්‍රංශයේ, ජර්මනියේ.... තිබෙන අයුරකින් නොව හෙළයේ සිදු වූ සිදුවීමක් ලෙසටය. මෙහිදී එතුමාණන් විසින් රචිත දේව වේද පුරාණය, මංගල ගීතය, වේද කාව්‍ය හා සුවිශේෂ විසර්ජනය වඩාත් කැපී පෙනෙන්නාවූ සාහිත්‍යමය කෘතින් ලෙස සැලකිය හැකිය. මෙහිදී දේව වේද පුරාණය වනාහි මහනුවර යුගයේ දී රචනා කරන ලද ගද්‍ය කෘතින් වලින් විශාලතම ගද්‍ය කෘතිය වේ. මෙහිදී ක්‍රිස්තෝත්පත්තිය පිළිබඳ ජාකොමේ ගොන්සාල්වෙස් පඬිවර පූජාප්‍රසාදීන් වහන්සේ සඳහන් කරනුයේ ලාංකේය සංස්කෘතිය හා හෙළ සාහිත්‍යාංග තුළ දක්නට ලැබෙන සුලක්ෂණ උපයෝගී කරගෙනය.

"එකල කන්‍ය බිසෝ ගර්භනී වූ වස් දවස් සම්පූර්ණ වී ප්‍රසව වේලාල තුනක් දැනගනී. ඒ කෙසේදයත් සෙසු ස්ත්‍රිවරු ජම්ම දෝෂ සාප නිසා ඒවේලෙහි විඳින රුජාවලින් කිසිවක් තමාට නොදැනී නරපාලකයෙක් රාජභවනින් නික්මෙන කල කරන පංචතූර්ය නෘත කොලහලක්මෙන් පංච ගාත්‍රයෙහි කුහුල් සපිරි සොම්නස් කොලහලක් උදීප්ත විය. සර්වේස්වර වූ දෙව් පිතුරුනි, ඔබගේ දිව්‍ය ඥානයෙන් ජනිත වූ කුමාරයා මාගේ කුසින් ප්‍රසව වෙන්ඩ කරුණා කළාවේද, ගැත්තිගේ කන්‍යාධාන රැකහි පැසුනු මේ සුගති ඵලය මාගේ කරඬුතුලෙහි රැක තිබූ මේ දිව්‍ය නිධානය, ලෝකාරක්ෂාවට දාන කොට ලැබෙනවා සොඳෙයි කියා මෙසේ ආරාධනා කල සඳෙහි ධ්‍යාවෘත දර්පනයෙහි දිළුනු රිවි කිරණයක් සේද, චක්ෂු ප්‍රසාධයෙන් නිකුත් වූ බිම්භ රූපය ලෙසක් ද, ගසින් මල හා මලින් සුවඳ විහිදුනු ලෙසද මාතෘ ගර්භයෙන් කන්‍ය මුද්‍රා නොකඩා කිසි කිළුටුවකුත් නොමැතිව දේව කුමාරයා මවු කුසයෙන් බිහිව ලෝකයට ප්‍රසාධ නෙත් දාන වූ සේක. ඒ කෙනෙහි ඒ මධ්‍යම ජාම රාත්‍රි වේලාවේ ඒ ගිරිලෙන තුලෙහි දිවයුරු පැව්වා සේ පහන් ප්‍රභා නිස් ප්‍රභා කරමින් දිව්‍යාලෝක ව්‍යාප්තව ගියේය...." (දේව වේද පුරාණය පිටු 182 - 183)

මෙහිදී ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා මේ සඳහා ආභාෂය ගෙන ඇත්තේ "බුදු සිරිතේ" එන බුත්සරණය නමැති කෘතිය මුල් කරගනිමිනි. දේව වේද පුරාණය රචනා වූ අවධියේ ශු. බයිබලය හෙළ බසට පරිවර්තනය කර නොතිබූ අතර එසේ පරිවර්තනය කිරීමට ද විශේෂ අවසරයක් නොවීය. සැදැහැවතුන් අතට ශු. බයිබලය අත්පත් වූයේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවත් සමඟය. එම නිසා මේ යුගයේ දී අති පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා ශු. බයිබලයේ අන්තර්ගත සමස්ථ හරයම ගද්‍ය කෘතියක් ලෙස ඉදිරිපත් කරයි.

එලෙසම දේව වන්දනා පිළිවෙත් සඳහා එකල ප්‍රමාණවත් පූජා ප්‍රසාදිවරුන් නොසිටි නිසා භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන්ගේ ධර්මදූතික ක්‍රියාදාමය තුළ ගිහි නායකත්වයට වැදගත් ස්ථානයක් දෙනු ලැබීය. මේ නිසා ම පූජාප්‍රසාදිවරු නොසිටි අවස්ථාවල දේව වන්දනා පිළිවෙත් සංවිධානය කරනු සඳහා පත් කරන ලද "අන්නවි" ධුරයන් තුළ ඔවුන් වෙත පත් කරන ලද "සුවිශේෂ විසර්ජනය" නමැති කෘතිය තුළින් මේ සඳහා මනා ක්‍රියාදාමයක් ගත් අතර එහි සඳහන් "ක්‍රිස්තු ස්වාමිදරුවන් උපන් මංගල්‍යයෙහි දේශනා කරන සුවිශේෂය



තුළද පෙර සඳහන් කළ ගති ලක්ෂණ හා පූර්වෝරූපනයන් මැනවින් ඉස්මතු වන්නේ ය.

"කළුවලා ඇඳිරි බිඳ දසත රැස් විහිදුවා ජ්වලිත තේජ
දිව්‍ය රාජයා මෙන් ද,
සෝරා තාපනය නිවා
වර්ෂාව මෙන්ද, අඥා

# මව්පිය සෙනෙහස සංකේතවත් කරන "නත්තල"

සීතල රැයක, ඝන අඳුර මැදින් ගැබ්බර මවක් හා ඇගේ සැමියා රැය එළිකර ගනු අදහසින් සෙවණක් සොය සොයා ගියද ඔවුන් දෙදෙනට පිළිසරණක් වන්නට කිසිවකු මෙයට අවුරුදු දෙදහසකට පමණ පෙර එදා බෙත්ලෙහෙම් නගරයේ නොසිටියහ. අදද ඒ අයුරින්ම ලොව කොතැනක හෝ එම සිද්ධියම නැවතත් සිදුවන්නට බැරිකමක් නැත.

විනෝදය, සතුට හා කාමුක තෘප්තිය ලබන අදහසින්, මිරිඟුව පසු පස දුවන පිපාසිතයෙක් මෙන්, පහත් අපේක්ෂා වලින් රෝගීවුන සමාජයට ගැබ්බර මවකගේ විළිරුදාව හෝ පියකුගේ මනස්තාපය හෝ දරු සිඟිත්තකුගේ කුසගින්න පෙනෙන්නට පුළුවන්කමක් නොමැත්තේ ඔවුන්ගේ නෙත් අඳවී හදවත් ගල්වී ඇති හෙයිනි.

ගැබ්බර මවක, බස් රථයක් තුළ සිටගෙන නූපන් දරුවකුගේ බර දෙපයින් දරා ගනිමින් එක අතකින් බසයේ ආධාරකයේ එල්ලී ගමන් ගනිමින් පීඩාවට පත්වන මොහොතක බසය තුළ වූ ශක්තිමත් තරුණයින් හා වැඩිහිටියන් කිසිත් නුදුටුවාක් මෙන් කවුළුවලින් ඈතට දෙනෙත් යොමා ගෙන සිටින්නේ තම බිරිඳ හෝ මව හෝ සොයුරිය මෙවැනි තත්ත්වයකට පත්වුවහොත් ඇගේ සිත තුළ ඇතිවිය හැකි සන්තාපය ගැන මොහොතකටවත් කල්පනා නොකරමිනි.

එදා බෙත්ලෙහෙමේදී මවක වීමට ඔන්න මෙන්න කියා සිටි සියුමැලි ස්ත්‍රියකටත්, ඉපදෙන්නට සිටි කිරිකැටි බිළිඳකු පිළිබඳව බලාපොරොත්තුවෙන් පසුවුන පියෙකුටත් දහස් ගණනක් ජනයා අතර තනිවන්නට සිදුවූයේ පුදුමාකාර ලෙසිනි. සෝෂාවෙන් පිරුණු නගරයේ ගොඩනැගිලි වලින් ඈත්ව පිහිටි, නිසංසල ගවහලක් වෙත මරිය තුමියත් ජුසේ තුමාත් පියවර තැබුවේ දේව නියමය නිසා විය හැකිය. කෙසේ වෙතත් එදා සිට මෙදා



වනතුරු ගතවී ඇති වසර දෙදහසකට ආසන්න කාලය තුළ දී මිනිසුන්ගේ සිත් තුළ ආදරය, කරුණාව, දයාව, මෛත්‍රිය කොතෙක් දුරට පැලපදියම් වී තිබේ ද? නත්තල් සංවත්සර දිනයේදී නැගෙන ප්‍රශ්නය එයයි.

මව්කුස පිළිසිඳගත් දරුවකුට මව් කුසය සොහොන් ගැබක් කරන්නට තැත් කරන පියවරුන්ටත්, සිය කුසෙන් බිහිවන දරුවන් විකුණා රස නහර තෘප්තිමත් කරන්නට තැත් දරන මව්වරුන්ටත්, මින් වසර දෙදහසකට ආසන්නව බෙත්ලෙහෙමේ ගවහලක ඝන කවරණය සෙවූ මවත්, පියාත් ආලෝකය හා නිවැරදි මාර්ගය පෙන්වන පහන් තරු දෙකක් බඳුය. නත්තල මව්පිය සෙනෙහස සංකේතවත් කරන්නකි.

කිරිකැටි බිළිඳුන් ළයට තුරුළු කරගෙන දෙසැම්බර් මස සීත රාත්‍රියක බස් නැවතුම් පොළක සෙවන යට ගත කරන මව්වරුන් කොතෙක් ඇතිද? එදා බෙත්ලෙහෙමෙහි වූ ගවහලේ දර්ශනය මවන, බස් නැවතුමක් තුළින් නැගෙන බිළිඳුහඬ, සීතල අඳුරු රැයට පමණක් ඇසෙන්නකි.

මිනිසා මිනිසාට හතුරුව හා එදිරිව කළ සටන් වලින් අනාථ භාවයට පත්වුන දරු සිඟිත්තන් ළයෙහි හොවාගෙන ලතැවෙන හා දුක් සුසුම් හෙළන මව්වරුන් අනාථ කඳවුරු වල කොතෙක් සිටිත් ද? ඒ හැම බිළිඳකු මවක හා පියෙකු නත්තල් ගවලෙනක රූ බඳුය.

මෙයට වසර දෙකකට උඩ දී දෙව් බිළිඳුන් ලොව අනාථ කඳවුර වෙත පියවර නැගුවේ අන්ත දුඃඛිත තත්ත්වයකට පත්ව සිටි ජන රොත්තකට මද අස්වැසිල්ලක් ගෙන එන අදහසිනි. දෙව් බිළිඳුන් මේ නත්තල් සමයේදීත් අනාථ කඳවුරෙන් කඳවුරට යන්නෙ අනාථ දරු පවුල් අතර සතුට හා සාමය බෙදාලනු පිණිසය.

දෙව් මවත්, ජුසේ තුමාත් පවුල් දිවියක ඇති සාරවත් බව, සමගිය අන්‍යෝන්‍ය අවබෝධය ලොවට පළ කර සිටිති. මෙම දෙමාපියන් අතරට නත්තල් දිනෙක එක් වූ දෙව් බිළිඳුන් මවක හා පියකු තුළ ඇති කළේ නොමියෙන සතුටකි. නත්තල සැබවින්ම මව්පිය සෙනෙහසේ සංකේතයකි.

නත්තල ආදර්ශමත් පවුලක් පිළිබඳව ලියැවුන රසවත් කථාවක මුල් පරිච්ඡේදය වී ඇත.

**මර්වින් වනිගරත්න**
වාද්දුව

## බිළිඳු ජේසුනේ

**පවිටු බව අපගේ නසන්නට**
**මිනිස් වෙස්ගත් දෙව් බිළිඳුනේ**
**සිව්මැලි රුවැති ගත**
**රළු පිදුරු මත**
**සැතපුවේ අප පව් නිසාමය**

**බිළිඳු වෙසින් වසරින් වසර**
**යළි යළිත් අප අතරට වඩිමින්**
**අපේ දිවියත් එළිය කරනා**
**ජේසු බිළිඳුනි, දෙව් කුමරුවනි**
**අපේ දිවිමං නවමු කරනු මැන**
**පාපි බවින් අප සැම මුදා**

**වෛද්‍ය කාමලීටා ජයසිරි**
**ප්‍රාදේශීය රෝහල**
**ලුණුගම්වෙහෙර**



## වැඩිහිටි නිවසෙන්

**මේ නත්තල් සමය උදාවී ඇත**
**සාම කුමරුගෙ සමරන්නට උපත**
**දරු සැමට සාමය සතුට සැපත**
**පතන්නෙමි සිටින්නට මුළු දිවි පෙවෙත**

**ඈත්වී සිටියත් දරුගෙන් මේ මහළු කත**
**දෙව්රැකවරණය ලැබ ජීවත්වෙමි නිරත**
**ඉල්ලමි සාමකුමරුනේ වැඩ ඔබෙ දෙපා වෙත**
**පහදනු මැනවි මව්පිය අගය සැම දරු වෙත**

**මාරි පැන්සි පෙරේරා**
**කලමුල්ල**

# කලාපේ



ශාස්ත්‍රවන්තයෝ පරදේශීය
වූත් වටපිටාවක් නත්තල
ආරෝපණය කරති. ඉම්හිරි මව්
කැදැල්ලක් බවට පත් ගව - බැ
ගිරිලෙනේ නිසසල බව පෙරදිවි
අමුත්තන් නිසා බිඳී ගියේය.
රාජ්‍ය නිලදරුවෝ කැළඹුණහ.
දනවන හැඟුමෙන් පිරී ගියේය.

දුරාතීතයේ පටන් කිතු
පරිකල්පනය අසිරිමත් කල්පනා
පිබිදවීමට මෙම තත්ත්වය ඉවහ
ඇතැයි සිතිය හැකිය. ගව ඔරු
ජේසු බිළිඳාණන්ගේ දර්ශනය
නොව ජේසු උපත හා ළමා වි
කලාකරුවන් බිහිකළ දහස් ගණ
හා කැටයම් අද වන විට නිර්මා
බව අපි දනිමු. එහෙත් චිත්‍ර කල
තුළ ශාස්ත්‍රවන්තයින් අවුත් පඬු
වඳින අවස්ථාව නිරූපණය කර
වලට ඇත්තේ අන් සියළු සිතුව

# සමිඳුන්ගේ මාංශගතවීම




සොයා යමු



ප්‍රතාපයෙන් උදාවන
රාත්‍රි කාලයෙහි
වාහිත සිහිල් පිනි
න තිමිර අන්ධකාරය

දුරහැර පාපා ගිනි තාපනය නිවන්නා වූ දෙව්සුන අද පොළොවෙහි උපන් මංගල්‍යය අති උත්කෘෂ්ට වන්නේය...."

මෙහිදී ගොන්සාල්වෙස් පියතුමා ඉදිරිපත් කරන උපමා හා රූපක තුළ කිතු උපත පිළිබඳ කතාන්දරය මැනවින් ලාංකේය ජන හදවත් වලට කතා කරන්නට වෙර දරා ඇත. ලක්දිව පළමු ගීතිකා පොත ලෙස විරුදාවලියේ පවතින "මංගල ගීතය" තුළ ද "ක්‍රිස්තු උපත් සින්දු" ලෙස ගීතිකා කීපයක් දක්නට ලැබේ මේවා තුළ ලාංකේය සංස්කෘතික ගති ලක්ෂණ මෙන් ද දේව ධාර්මික සංකල්ප ද මැනවින් ඉස්මතු කර ඇත.

"උපන් දේව බිළිඳුන්ගේ, යස අද පිළිවසන්නේ
කවුරු නිමාවද අරුම පවසන්නේ, සතුන්ට දැක් වූ කරුණේ,
ලෙඩුන් කනුන් කොරුන්, ගොළු බිහිරි රෝ දුක් සියල්ල නිවාරනේ, යක්ෂ භූත දුරින් දුරලන්නේ, තුන් ලොව ලෙළවා මංගලම් පාන්නේ, ඔබ මේ දේව වේද ජේසු බිළිඳුන්නේ....." (මංගල ගීතය)

ක්‍රි.ව. 1725 දී ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචිත "වේද කාව්‍යය " තුළ ද "ක්‍රිස්තු උත්පත්තිය හා මාංශගතවීම" පිළිබඳව මැනවින් සඳහන් කරයි. මෙය හුදු කාව්‍යමය රචනාවක් පමණක් නොව දේව ධාර්මික රචනාවක් නිර්මාණය වන්නේය. හෙළ බසින් ක්‍රිස්තු චරිතය පාඨක, ශ්‍රවනයින් හට රසවත්ව උද්දීපනය වන ආකාරයෙන් ඉස්මතු කරන්නට මෙහිදී එතුමාණෝ වෙර දරයි. මේ සඳහා එතුමාණෝ ආභාෂය ලබා ඇත්තේ "බුදුගුණාලංකාරය, සඳ කිඳුරු වත, සුභාෂිතය, සසදාවත, මුවදෙව්දා වත, පැරකුම්බා සිරිත... යනාදි හෙළ පද්‍ය කෘතින්ගෙන් හා මහනුවර යුගයේ රචිත කෘතින්ගෙන් ආභාෂය ලබා ගනිමිනි. පෙදෙන් බුදු සිරිත නමින් රචනා වූ "බුදුගුණාලංකාරය" අනුගමනය කරමින් "පෙදෙන් කිතු සිරිත" දක්වාලන්නට වේද කාව්‍යය පාදක කරගනියි.

"පුන් සඳ වලාවෙන් පැවුවා ලෙසි
නේ
රන් කරඬුවෙන් එළියට ගත් මැණික මෙ
නේ
තුන් ලොව පසිඳු පිත් දෙව් කුමරුන් උප
නේ
පින් ඇති දෙවිඳු කන්‍ය කුසින් බිහි වූ
නේ

(වේද කාව්‍ය 147)

දිලි පුන් සඳ අයුරු, පුරවල් සකල සිරින්
ඉසු රූ
ගත රන් මිණි මැදුරු, නරලොව නෙක
පිරිසිදුයේරූ
සතොසින් එ සුර මුරු, නොඉපද එවැනි
තැනක රුසි රූ
ගවයින් මැද නිසරූ, පන්තියේ උපන් ඇයි
මිතු රූ

(වේද කාව්‍ය 153)

"පින්වත් සුර වරනා, සර්වාදීපත් වල්ලභ
සුර නා
තුන් ලොව මෙ හැම තැනා, එක රඟ
සැම තැන වැඩ සිටි නා
දැන් ඔහු වෙස් රැගෙනා, දුප්පත් බිළිඳකු
සේ ම මෙදි නා
එන්නට සුරවරනා, මෙලොවට සකි මේ
කාර ණා
(වේද කාව්‍යය 155)

තවද ජනප්‍රිය කැරොල් ගීතයක් ලෙස අප අතර ඉතා ජනප්‍රිය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ "දෙවිඳු උපන්නේය...." ගීතිකාව ද වැදගත් වේ.

"දෙවිඳු උපන්නේ සතුනි
දෙවිඳු උපන්නේ ය ඔහෝ

දෙවිඳු සර්ව නායක වන දිළිඳු එමනු වෙස් ගනිමින
නිරිඳු දවිදු කුල සසොබන බිළිඳු ලෙසින් මිහිවඩමින
දෙරණේ තෘණ යහනේ - සුර රජුනේ - කිම සයනේ

රංචු බැඳී අංජුවරු නෙක එති - පංච තූර්ය නාද කරති
කොවි නොම කිනි කියමින් තුති - පුංචි දෙවිකුමරුන්ව වඳිති
තෙපලා තුති ගොසලා නෙක ගොසලා සිර නමලා......"

මෙම ගීතය තුළ ගොන්සාල්වෙස් පියතුමාටම ආවේනික වූ භාෂා ශෛලියක් පවතී. දේවදූතයන් දකින්නේ "අංජුවරු" ලෙසය. ඔවුන් නාද නඟන්නේ වීණාව නොව හෙළ සිරිතේ එන "පංච තූර්ය" නාදයයි. මීට අමතරව ගැයෙන "තුන් ලොව නායක මේ ස්වාමි" ගීතිකාව ද ඉතා වැදගත් වේ. එහි ඇති ශබ්ද රසය මනාව සංකලනය කර නත්තලේ අර්ථය පහදාලයි. ගොන්සාල්වෙස් පියතුමා දෙව් පුත් උපන් මංගල ගී වල එන වචන පද ගැටීම, ශබ්ද හා අර්ථ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අපට පසක් වන්නේ මානව ඉතිහාසයේ සිදුවූ දෙව් බව මිනිසත් බව ගැනීම යන නත්තලේ අරුතයි. දෙවිඳාණෝ මිනිසත් බව ගෙන අප හා සමාන මිනිසෙක්ව දිවි ගෙවීම තුළ වර්තමාන සමාජයේ බිඳ වැටීමට, අපයෝජනයට, දූෂණයට ලක්ව පවතින මනුෂ්‍යත්වය දෙවිඳාණෝ උසස් කරන සේක.

මෙලෙස

මීට වසර 300 කට පෙර දේශානුරූපිගතව අති පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා දේශීයකරණය, හෙළ සංස්කෘතික සංහිඳියාව එක් කරගනිමින් සිදු කළ සංහිඳියාව වෙනදාට වඩා මේ නත්තලට අපට මහගු ආදර්ශයක් මෙන් ම අභියෝග යක් වන්නේ ය. මන්ද නූතනයේ ආගමික අන්තවාදය තුළ විවිධ වූ සේනාවන්, බලවේග හේතුකොට ගෙන මෙකී සංහිඳියාව සිඳ බිඳලන්නට වෙර දරා ඇත. සැම සාහිත්‍යධරයකුම වනාහි සමාජ ශෝධකයෙකි.

මේ නිසා ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ මේ මහගු ක්‍රියාදාමය තුළ රචිත ක්‍රිස්තු මාංශගතවීම හා දේවත්වය විශේෂයෙන් වැදගත් වන්නේමය. මේ නිසා බටහිරත්වයට වඩා දේශීයත්වයට මුල් තැනක් දෙමින් නූතනයේ වාණිජවාදය, බටහිරකරණයට ලක්ව පවතින නත්තලේ නියම අර්ථය පහදාලන්නට මෙම ලාංකේය කිතුනු සාහිත්‍ය දායාද වැදගත් වන්නේය. මන්ද දේව පුත්‍රයාණෝ බිහිවූයේ යුරෝපාකරයේ නොව ආසියාවේ බැවිනි.

**අසේල දසනායක**

# න් පිළිබිඹු වන ශාස්ත්‍රවන්තයින්ගේ දේව ධර්මය



ු වූත්, ගුප්ත
ල් කතාවට
- දරු
ටළු - එඬේර
ගින් ආ මෙම
ජරුසලමේ
ගරු බිය
නුවන්ගේ
 වලින්
ල් වන්නට
වක බැවූ
පමණක්
ය අළලා
කින් සිතුවම්
ණය වී ඇති
ා ඉතිහාසය
රූ පුදා
න චිත්‍ර
ම් පරදවන

සුළු පුරාණයකි. එපමණක්ම නොවේ බිළිඳු පුදන්නට ආ මෙම පළමු අමුත්තන්ගේ කතන්දරයට මුල් කිතුනු සභාව ඉතා විශාල දේව ධාර්මික වැදගත්කමක් දී ඇති බවට ද චිත්‍ර හා කැටයම් කලාව සාක්ෂි දරයි. සුභාරංචියේ සඳහන්වන කිතු උපත හා බැඳි මංගල නිමිති, සිහින, අහස් ලකුණු පුද දුන් පඬුරු ආදියේ සැඟවුනු අරුත් පසුපස දෙව් දහම් ඇදුරන් සේම කලාකරුවන් ද නිරන්තරයෙන් හඹා ගිය බව පෙනේ.

ශාස්ත්‍රවන්තයින් ගෙනා පණිවුඩය අතීතයේ විසූ කිතුනුවන් තේරුම් ගත්තේ කොහොමද කියා දැන ගැනීමට උත්සාහ කිරීම අපූරු අත්දැකීමකි. මෙම පණිවුඩය යම් පමණකට හෝ තේරුම් ගත හැකි වන්නේ අදාළ ධර්ම සාහිත්‍යය (දේව ධාර්මික නිබන්ධන, ධර්ම දේශනා, කාව්‍ය ප්‍රබන්ධ ආදිය) සමඟින් චිත්‍ර හා කැටයම් කලාවද අධ්‍යයනය කිරීමෙනි. මෙම ලිපිය එබඳු උත්සාහයකින් පෙරා ගත් සාරයෙන් බිඳකි.

"හෙරෝද් රජු දවස ජුදයේ බෙත්ලෙහෙමෙහි ජේසුස් වහන්සේ උපන් කල, පෙරදිගින් ශාස්ත්‍රවන්තයෝ ජෙරුසලමට අවුත් "ජුදයින්ගේ" රජව උපන් උතුමාණෝ කොතැන්හිද? අපි එතුමාගේ තාරකාව පෙරදිග දී දැක, එතුමාණන්ට නමස්කාර කරනු පිණිස ආවෙමු"යි කීහ. යනුවෙන් මතෙව් ශුභාරංචියේ දෙවන පරිච්ඡේදය ආරම්භ වේ. මෙම රාත්‍රි ගමන ගැන බයිබලයේ අන් කිසි තැනක සඳහන් නොවේ. කිතු උපත පිළිබඳව ලූක් සුබාරංචියේ එන පුවත් ඊට වෙනස්ය (බලන්න ලූක් 2:1-20)

මතෙව් සුබාරංචියට අනුව කිතුනු චිත්‍ර කලා ඉතිහාසයේ ශාස්ත්‍රවන්තයින් නිරූපණය කර ඇති මුල්ම සිතුවම හමුවන්නේ රෝමයේ ප්‍රිසිලා කැටකොම්බ - භූගත සොහොන් ගෙය තුළිනි. ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස මැද භාගයට අයත් මෙම බිතු සිතුවම කැටකොම්බයේ "කැපෙල්ලා ග්‍රෙසියා" නමින් හඳුන්වන පැරැණිම ගොඩනැගිලි කොටසේ ආරුක්කුවක් මුදුනේ ඇඳ තිබේ. මෙම ශාලාවේ ආරුක්කුව යට දෙපස ඇති දිගු පිල් මත අසුන් ගෙන ආදි කිතුනුවෝ භූමදානයෙන් පසු අවමංගල ආහාර සිරිත් පවත්වන්නට ඇතැයි විශ්වාස කැරේ. ශාස්ත්‍රවන්තයින් නිරූපණය කර ඇති අනෙකුත් බොහෝ පැරැණි චිත්‍රවල වගේම මෙම ආරුක්කුවේ ඇඳ තිබෙන්නේ ද පුද්ගලයින් තිදෙනෙකුගේ රූපය.

ඔවුනොවුන්ගේ බාහිර පෙනුම සමාන වන අතර ඔවුන් අත්හි පඬුරු ඇති බව පෙනේ. සිතුවම දුර්වර්ණව තිබුණත් අතැති පඬුරු අනුමාන ලෙස හඳුනාගෙන ඇත. එක් අයකු අත මල් වළල්ලකි. සෙසු දෙදෙනා අත හතරැස් බඳුනක් හා බටකුරු පාත්‍රයකි. මවගේ ඇකය (දණ මත) හොබවන දරුවා දෙසට ඔවුහු පෙළට ගමන් කරති. එහෙත් මෙබඳු වෙනත් චිත්‍රවල ඇති ආකාරයේ අහස් තරුවක් හෝ සංචාරක ඔටුවන් හෝ ඇඳ නැත. වතිකාන කෞතුකාගාරයේ තිබෙන හතරවන සියවසට අයත් ශෛලමය මිනී පෙට්ටියක පිට පැත්තේ නම් එබඳු රූප නෙළා තිබේ.

සාමාන්‍යයෙන් කැටකොම්බ වල බිත්ති වලත් බොහෝ ශෛලමය මංජුසා වලත් බයිබලයේ වෘත්තාන්තවල එන චරිත නිරූපණය කර ඇති බව ප්‍රකට කරුණකි. එලෙස චරිත රැගත් බයිබලීය ප්‍රස්තුතයන් අතරින් කිතුනු කලාකරුවන් විසින් තෝරාගෙන ඇති ප්‍රධාන ප්‍රස්තුතයක් වූයේ ශාස්ත්‍රවන්තයින්ගේ වෘත්තාන්තයයි. (මෙම ගණයට නොගැනෙන එක් සුවිශේෂ උප්පත්ති බිතු සිතුවමක් ප්‍රිසිලා කැටකොම්බයෙන් හමුවේ. එහි නෙළා තිබෙන්නේ මරිය තුමිය හා ජේසු බිළිඳා සමඟ පැරැණි ගිවිසුමේ විස්තර වන බාලාම් දිවැසිවරයාගේ චරිතයයි.

හතරවන සියවසට පෙර කිතුනු සිතුවම් කලාව සොහොන් ගැබ් පරිශ්‍රයන්ට සීමා වී තිබුණත් අනතුරුව එළිමහනට ආ බව පෙනේ. ඊට හේතු වූයේ රෝම අධිරාජ්‍යයේ පීඩන සමය අවසන් වී බයිසන්තියාන පාලනය යටතේ ලද ආගම් ඇදහීමේ නිදහසයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රථම වරට බිහි වූ බැසිලිකාවල ඇඳෙන්නට පටන් ගත් වෛවර්ණ වීදුරු කැබලිති චිත්‍ර හෙවත් මොසැයික සම්ප්‍රදාය තුළ ශාස්ත්‍රවන්තයින්ගේ විත්තිය නිරූපණය වීමට පටන් ගත්තේ ය. එහෙත් ඒවායේ ප්‍රකාශන අන්තර්ගතය පෙර සිට පැවත ආ කැටකොම්බ සිතුවම් වලට වඩා එතරම් වෙනස් නොවීය.

මේ සඳහා දිය හැකි හොඳම නිදසුනක් නම් ඉතාලියේ රැවෙන්නා නගරයේ සාන්ත ඇපොලිනාරේ නුවාවෝ දෙව්මැඳුරේ ඇති මොසැයික දර්ශනයයි. මෙහි මනා ලෙස නිමවන බඳුන් අතැතිව හා අලංකාර ඇඳුම් පැළඳුම් සහිතව ඇත තරුවක් දෙස බලමින් ඉදිරියට ඇදෙන ත්‍රිකායක් ලෙස නිරූපිත ශාස්ත්‍රවන්තයින් ඉදිරිපිට අසුන්ගෙන සිටින මරියතුමියගේ ඇකයේ ජේසු බිළිඳා වේ. එම දෙදෙනා වහන්සේ පිරිවරා දෙපස සුරදූතයෝ රැකවල් කරති.

මෙම මොසැයිකයේ නිරූපිත ශාස්ත්‍රවන්තයින්ගේ රූප තුන අන් චිත්‍රවල එන ශාස්ත්‍රවන්තයින්ගේ රූප වලට වඩා වෙනස් ය. ඒ කෙස් වැටි වලට යොදා ඇති වර්ණයන් නිසාය. අයෙකුගේ කෙස් වැටිය දිගුය. දුඹුරු පැහැතිය. දිගු රැවුලක් ඇත. දෙවැන්නා රැවුල හොඳින් බාන ලද තරුණයෙකි. තෙවැන්නා අළු පැහැ කෙස් වැටියක් සහිත මහළු වියේ අයෙකි. තවද ඔවුන්ගේ හිස් වලට ඉහලින් එකිනෙකාගේ නම් ලියා තිබීම තවත් විශේෂයකි. පළමුවැන්නා බල්තසාර් යනුවෙන් ද දෙවැන්නා මෙල්කියෝර් යනුවෙන් ද තෙවැන්නා ගාස්පාර් යනුවෙන් ද නම් කර ඇත. ඔවුන් තිදෙනා වයස් කාණ්ඩ තුනකට අයත්ය. (නම් තැබීම පසුකාලීන එකතු කිරීමක් විය හැකිය.)

බයිබලයේ කිසි තැනක ශාස්ත්‍රවන්තයින් ගේ සංඛ්‍යාව හෝ ශරීර විස්තර හෝ ජේසු බිළිඳා බැහැදුටු දිනය හෝ ගැන සඳහන් වී නැත. ඉතාමත් සංක්ෂිප්තව ශාස්ත්‍රවන්තයින් ගැන සුපුවතේ ලියා ඇති (මතෙව් 2:1-6) වැකි කිහිපයකට කාලයාගේ ඇවෑමෙන් මුඛ පරම්පරාගත සාම්ප්‍රදාය ඔස්සේ ආ වතගොත රැසක් එකතු වී ඇති ආකාරය චමත්කාර ජනකය. හතරවන සියවස වන විට ශාස්ත්‍රවන්තයින්ගේ පැමිනීම සමරා (දෙසැම්බර් මස 25 වන දින ජේසු සමිඳු උපතින් දින 12 කට පසුව එළැඹෙන) ජනවාරි මස 06 වන දා රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යය පැවැත්වීමට ද ඇරැඹුනි. (වර්තමානයේදී පවා එදා ශාස්ත්‍රවන්තයින්ගේ පඬුරු පිදීම සිහි කරමින් ඇතැම් රටවල තෑගි හුවමාරු කරගන්නේ දෙසැ. 25 වනදා නොව ජනවාරි 6 දා ය.

ලබන කලාපයට....

**රංජිත් නිමල් කුරේරා**
සභාපති
හලාවත කතෝලික සංස්කෘතික සංසදය



## මරිමව් තුළින් බිළිඳු සොයා යමු

# කිතුනු ගීතිකාව හා ගීතය හෙවත් කන්තාරු හා කැරොල්

ගැයුම දෙවරක් යැදුමකි, යන කියමනින් කිතුනු ජනවන්දනාවේ සහ ගායනයේ අති අවියෝජනීය සබැඳියාව අනාවරණය වෙයි. කිතුනු ගීත සාහිත්‍ය පිළිබඳව සාකච්ඡා කරන විට එහි ප්‍රධාන ප්‍රභේද දෙකක් අපට හමුවෙයි. එනම් කිතුනු ගීතය සහ ගීතිකාවයි. එකම පසුබිමක බිහිවූයේ වී නමුත් ඒවා භාවිත වන අවස්ථාව, පරිසරය සහ ඊට ඉලක්ක ගත අරමුණු අනුව මෙහි වෙනස්කම් හඳුනා ගත හැකිය.

"කන්තාරු" යන පදය සිංහල භාෂාව හා බැඳෙනුයේ කිතුනු දේව මෙහෙය පිළිබඳව එන ශබ්ද මාලාව තුළිනි. කන්තාරු යන පදයට සිංහල ශබ්ද කෝෂය දෙන අර්ථය වන්නේ ද දේව මෙහෙයවල දී කියන ගීතිකා නොහොත් පල්ලියේ ස්තෝත්‍ර ගීතිකා ලෙසටය. ගීතිකාව යනු ක්‍රිස්තියානි යාච්ඤා වශයෙන් ගායනා කරන ගීතය, දේව ස්තෝත්‍ර ගීතය, සමූහ වශයෙන් ගායනා කරන ගීතය යන අරුත් සහිත පදයක් ලෙසට සිංහල ශබ්දකෝෂය අරුත් දක්වා ඇත.

කන්තාරු හෙවත් ගීතිකා යන පදය අර්ථයෙන් වඩාත් සමීප වන්නේ ඉංග්‍රීසියෙහි යෙදෙන "හිම්ස් - Hymn" යන පදය ටය. මෙයට ස්තුතිය පළ කරන ගීය යන අරුත ද දෙයි. ඒ අනුව දේව මෙහෙයට සහභාගිවන ජනයා විසින් සාමාන්‍ය තනුවකට ගායනා කරනු ලබන ගීත මෙසේ හැඳින්වෙයි. ආරම්භක යුගයේ දී මෙම "සාම්" (Salm) හෙවත් ගීතිකා ගැයුනේ ලතින් බසිනි. "සාම්" ප්‍රබන්ධ තෙහිලි ගී ලෙස හැඳින්වෙයි. මෙම ගායනාවන් සිදු කෙරුනේ ග්‍රෙගෝරියානු චාන්ට් එනම් රෝමයේ විසූ ශාන්ත ග්‍රෙගරි පාප්තුමා (ක්‍රි.ව. 509 - 604) විසින් විධිමත් කරන ලද ප්‍රසංවාදයෙන් (Harmony) තොර වූ ගායනා සම්ප්‍රදාය අනුව ය.

කිතුනු දහමේ සමාරම්භය සමඟ කන්තාරු යන පදයේ ඥාති සබැඳියාවක් දක්නට ලැබෙන ආකාරය තහවුරු වේ. කන්තාරු කණ්ඩායම යනුවෙන් පල්ලියේ ගීතිකා කණ්ඩායම හැඳින්වීම ද සුලබ ලක්ෂණයකි. ගීතිකාවලින් දෙවියන් වහන්සේගේ බලය, තේජස, අප්‍රමාණ බව, අසිරිය හා විශ්වාසය පිළිබඳ උත්කර්ෂයෙන් වර්ණ වී ඇත. වීණා, හොරණෑ, රබන්, නලා ආදී භාණ්ඩ වාදනය කරමින් ගායනා සිදුකොට ඇති බවට ශුද්ධ බයිබලයේ අප්‍රමාණ නිදසුන් හමුවේ.

සිංහල කන්තාරු හෙවත් ගීතිකා ඉතිහාසයේ මූලිකත්වය හිමිවන්නේ වාදනයෙහි ද දක්ෂයකු වූ ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාට ය. එතුමා විසින් ක්‍රි.ව. 1730 දී රචනා කළ මංගල ගීතයෙහි ආදිම කන්තාරු ගී අපට හමුවෙයි.

ආදි වින බිඳ හරින - ලෙස පවර මනු වෙසින්
කුරුසෙ මත වැඩ ඉන්න තෙද දේවාජ බාලනේ .... වැනි ගීත එක් නිදසුනකි.

ජනශ්‍රැති ගීත වශයෙන් ප්‍රභේද දෙකක් පැහැදිලිව සඳහන් කර ඇත. එහිදී පූජා ගී යන්න කිතුනු ගීතිකා යන අරුතින් යුතුව භාවිත කර ඇති බව අනාවරණය වේ.

මේ සම්බන්ධව අප කළ සාකච්ඡාවක දී අනාවරණය වූයේත් කිතුනු ගීතිකා යනු ජනවන්දනා හා දෙව්මැඳුරට සම්බන්ධව ගැයෙන, ප්‍රශංසාව සහ සමාව අයදීම සම්බන්ධව බැඳෙන හා ගැයෙන පූජා ගීතිකා ලෙසටය. බයිබලයේ තෙහිලි ගීතිකා අනුව යමින් දේව වචනයෙන් පබැඳී තිබීම මෙම ගීතිකාවල එක් ලක්ෂණයක් ලෙසට දැක්වෙයි. ග්‍රෙගෝරියාන ගායන සම්ප්‍රදාය ඊට උරුම ගායන සම්ප්‍රදාය ලෙස ද දැක්වේ.

කැරොල් යන සම්ප්‍රදාය මීට වඩා වෙනස් වූවකි. එය කිතුනු ගීතයයි. එයට හිමි පරාසය කිතුනු ගීතිකාවට හිමි පරාසයට වඩා පුළුල් වූ එකකි. කැරොල් යනු දේව මෙහෙයෙන් පසුව දෙව්මැඳුරු භූමියේ හෝ වීදි සංචාරයේ යෙදෙමින් හෝ ගෙයින් ගෙට යමින් ගයන සමූහ ගීත විශේෂයෙකි. කැරොල් කණ්ඩායම් වශයෙන් එකතු වී වීදි සැරිසැරීම අතීතයේ



දී සිදුවී ඇති අතර, එය වර්තමානය දක්වා ම නත්තල් සමයේ දී පවත්වාගෙන යනු ලබන චාරිත්‍රයක්ව පවතියි. සරල පදමාලාවෙන් යුතුවූ බටහිර සංගීතයෙන් පෝෂණය ලැබූ කැරොල් ගීත බහුලව ම දක්නට ලැබෙන අතර ඉතා කලාතුරකින් දේශීය නාද රටාවකින් සමන්විත වූ කැරොල් ගීතයක් අසන්නට ලැබේ. නත්තල් බැති ගී යනුවෙන් කිතුනු ගීත සාහිත්‍යයේ මේවා හැඳින්වේ.

අසීසියේ සා. ප්‍රැන්සිස් මුනිතුමා නත්තල් බැති ගී සිරිතේ පියා ලෙස ද, එම නිසා ඉතාලිය නත්තල් බැති ගී සිරිතේ උපන් බිම ලෙස සැලකීමට ද බොහෝ අය එකඟ වෙති. එහෙත් නත්තල් බැති ගී වල අන්තර්ගතය අනුව ඒවා ජේසුස් වහන්සේගේ මාංශගතවීම අරබයා දෙවියන් වහන්සේට කෙරෙන ප්‍රශංසා ලෙස අරුත් ගැන්වෙන්නේ නම් පළමු නත්තල් බැති ගීය ලෙස හැඳින්විය යුත්තේ මරියාවන්ගේ උදාන ගීතයයි. ඉන් අනතුරුව දේව දූතයන් එඬේරුන්ට සුභ ආරංචිය ගෙන එමින් ගැයූ මහිම ගීය යි.

ගරු සිසිල් ජෝයි පියතුමා ගෙන එන එම අදහසට අනුව නත්තල් ගීතයේ ආරම්භය ශුද්ධ බයිබලයේ නව ගිවිසුමට අයත් ඉහත ගීත දෙක යි.

මධ්‍යතන යුගයේ දී Carol හෝ Carole යන පදයෙන් නොදියුණු ශිෂ්ටාචාරයකට ඥාතිත්වය පාන ජනප්‍රිය නැටුම් ගීයක් උසස් සමාජයේ නැටුමක් හෝ නැටුම් ගීයක්, ජනප්‍රිය ආගමික පෙරහරක් යන අර්ථ ගම්‍යමාන වූ බව සඳහන් වී ඇත. සැබැවින් ඉතාමත් පුළුල් අරුතින් ගත හොත් කැරොල් යනු ගීතයයි. ප්‍රීති ප්‍රමෝද්‍යයෙන් යුතු, විශේෂයෙන් නත්තල ආදි උත්සව ආශ්‍රිතව ගැයෙන්නේ කිතුනු ගීතයයි. ජන වහර තුළ කැරොල් යනුවෙන් ජනප්‍රිය වී ඇති භක්ති ගීත මෙම ගනයේ ලා හඳුනා ගත හැකි බව සිංහල ශබ්ද කෝෂය කැරොල් යන්නට දෙන තේරුමයි.

කිතුනු ගීතය යනු කුමක් දැයි අප කළ සාකච්ඡාවේ දි ඊට ලැබුණු පොදු නිර්වචනය වූයේ කිතුනුවාගේ සදාතනික වටිනාකම් සහ සුවිශේෂීතා අනාවරණය කරන ගීතය කිතුනු ගීතය වන බව ය.

ඉංග්‍රීසි කැරොල් ගීයෙහි ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ ක්‍රි.ව. 1350 සිට ක්‍රි.ව. 1550 අතර කාලය යි. කැරොල් ගායනය, අතීතයෙහි පටන් ජනතා ගායන ප්‍රකාරයක් බවත්, බොහෝ විට නුපුහුණු ගායකයන් විසින් කරන ලද ගායනයක් බවත්, පිළිගැනේ. සාහිත්‍යාංගයක් මෙන් ම සංගීතමය වශයෙන් ද ලෝක ප්‍රකට ගීත සම්ප්‍රදායක් ලෙස පිළිගැනෙන කැරොල් සම්ප්‍රදායේ සිංහල කැරොල් ගීතයේ නිර්මාතෘවරයා වශයෙන් පිළිගැනෙනුයේ ද ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා ය. එතුමා විසින් 1730 දී සම්පාදිත "මංගල ගීතය" ගීත සංග්‍රහයෙහි ප්‍රථම සිංහල කැරොල් ගීත ඇතුළත් ය. පෘතුගීසින් හා ලන්දේසින් විසින් හඳුන්වා දෙනු ලැබූ බටහිර නාද රටාවලට අනුව නොව තත්කාලීන ව පැවැති දේශීය නාද රටා හා පෙරදිග සංගීත නාද රටාවන් ඔස්සේ යමින් සිංහල කැරොල් ගීත රටාව ජනප්‍රිය කරවීමට දක්ෂ සංගීතඥයකු වූ ගොන්සාල්වෙස් පියතුමා උත්සාහ දරා ඇත. එතුමාගේ මුල් කාලීන ගීතයක් වන,

දෙව්ඳු උපන්නේය සතුනි
දෙව්ඳු උපන්නේය ඔහෝ

යන ගීතය වර්තමානය දක්වාම ඉමහත් ජනප්‍රියත්වයක් උසුලයි. කර්ණාටක සංගීතය සහ සාම්ප්‍රදායික ජන ගී නාද රටාවන්ගෙන් සැදුම් ලත් මෙතුමා කළ කැරොල් ගී ප්‍රබන්ධයන්ගේ සුවිශේෂී බව පසක් කිරීමට එම ගීතය ම කදිම උදාහරණයකි.

මෙසේ නත්තලක් නත්තලක් පාසා උත්කර්ෂයෙන් ගැයෙන කැරොල් ගීතය වර්තමානය වන විට ඉතා ජනප්‍රිය භක්ති ගීත විශේෂයක් බවට පත්වී ඇත. ඉතා සරළ පදමාලාවක් බටහිර තනු නිර්මාණයන්ගෙන් අලංකාරය කෙරෙන බහුතරයක් කැරොල් අද ජනප්‍රියව ඇත.

විශ්ව නත්තල් බැති ගී ආර ඇසුරින් මෙරටට සමීප ගීත කලාවක් ගොඩනැගීමට මූලික වූයේ ස්වර්ගස්ථ ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය. ගීතිකා, නත්තල් කැරොල් ගී සම්බන්ධයෙන් විශේෂ මැදිහත්වීමක් කළ එතුමාගේ ප්‍රථම කැරොල් ගීතය ලෙස 1934 දී පමණ ප්‍රචාරයට පත් වූ,

"රෑ තරු බබළනවා - මල් පිපිලා වාගේ
එළියෙන් නැහැවෙනවා - මල් වැහැලා වාගේ ගීතය

බෙහෙවින් ජනප්‍රිය වී ඇත.

මෙතුමා කිතුනු ගීතයේ මෙන්ම සිංහල ගීත සාහිත්‍යයේ ද කැපී පෙනෙන සලකුණකි. ගීතය සම්බන්ධයෙන් පියතුමාගේ අදහස මෙවැන්නකි. කවියක හෝ ගීතයක රසය මතු වන්නේ එහි බස සරළ, මට සිලිටි වූ පමණට සහ බස ප්‍රබල ලෙස භාවිත වූ තරමට බවය.

ගොන්සාල්වෙස් පියතුමා ගොඩනැඟූ කිතුනු සිංහල ගීත ලකුණ වඩාත් ප්‍රභාවත් කරන්නට ජයකොඩි පියතුමා උත්සාහ දැරූයේ දේශීයත්වය උන්වහන්සේ තුළ මාංශගතව තිබූ නිසා යැයි කිව හැකිය. මර්සලින් ජයකොඩි පියතුමා රචනා කළ නත්තල් කැරොල් ගීතයෙන් මතු වූයේ ශ්‍රී ලාංකිකයකුගේ නෙතට හසුවන නත්තලකි.

වරෙන් වරෙන් නත්තලේ
වරෙන් නත්තලේ
බුලත් හුරුල්ලකුත් අරන්
වැඳ පුදන්න දෙමාපියන්
වරෙන් නත්තලේ වැනි ගීත

උදාහරණයක් ලෙස දැක්විය හැකි ය."

එහෙත් මුල් කාලයේ දී ජයකොඩි පියතුමා ද ජනප්‍රිය විදේශීය තනු අනුව කැරොල් ගීත රචනා කළ බවට

නිසසල ඒ - මිහිරි රැයේ
රස වෑහේ - මුතු පැහැයේ
අහස පුරා - තරු එළිය දිලේ
පොළොව කරා - වැද සිරිය හැලේ
ජේසු පුතා බිහි වී ....

වැනි ගීත නිදසුන් වේ. එහි තනුව, නත්තල් තේමා ගීය ලෙස ලොව පුරා ප්‍රචලිත "සයිලන්ට් නයිට්" නමැති ගීතයේ තනුව අනුසාරයෙන් නිර්මිත වූ එකකි. මෙම කැරොල් හෙවත් කිතුනු ගීත ජේසු සමිඳු උපත සමරන නත්තලේදීත්, උන්වහන්සේගේ උත්ථානය සමරන පාස්කුවේදීත් කිතුනු බැතිමත්හු මහත් ප්‍රීතියෙන් ගායනා කරති. මෙම කැරොල් ගීත පූර්වාදර්ශයට ගත් බොදුනුවෝ වෙසක් බැති ගී හා පොසොන් බැති ගී ද ගායනා කිරීමට යොමු වූහ. කිතුනු ගීත සාහිත්‍යයේ ඇති ගීතිකාවේ සහ ගීතයේ වෙනස මෙම කරුණින් වුවද තවදුරටත් තහවුරු වී ඇත.

**රම්‍යා බස්නායක**

# නත්තලට සැබෑ අරුතක්



නත්තල කියා අප සමරන්නේ කුමක් ද? අද වර්තමානයේ සැබෑ නත්තලක් අප සමරනවා ද? නත්තලේ අරුත විනාශ කරනවාද? නැත්නම් නත්තල මරණවාද? කියා නැවත වරක් සිතා බැලිය යුතු කාල වකවානුවකට අප එළැඹ තිබේ.

එදා වසර දෙදහස් ගණනකට පෙර ජේසු කුමරුවා නැතහොත් අප සැමගේ ගැලවුම්කරුවාණන්ට ලොව ඉපදීමට නිශ්චිත ස්ථානයක් නොමැති වූවා සේම අදත් වර්තමානයේ දෙවියන් වහන්සේ නැවත වරක් තම ඒක ජාතක පුත්‍රයාණන් මෙලොවට එවීමට තීරණය කළහොත් එදාට වඩා අද අඩුම වශයෙන් ගව මඩුවක් තියා අගුපිලක වත් උන්වහන්සේට උපදින්නට ඉඩක් නැත.

ක්‍රිස්තුන් වහන්සේ දෙවන වර පැමිණෙන්නේ ඔබත් මමත් නත්තල් කාලයට කඩෙන් රැගෙන එන විදුලි බුබුළු දල්වා දිග වල්ගා තරුවක් සෑදූ සරුව පිත්තල ගව හලකට නොවෙයි. ඔබේත් මගෙත් නිර්මල පිරිසිදු සිතටයි, හදවතටයි. නමුත් ඔබත් මමත් කොතෙක් දුරට අපගේ සිත නැත්නම් හදවත පිරිසිදු කරගෙන තිබෙනවාද? වෛරයෙන්, ක්‍රෝධයෙන්, තණ්හාවෙන්, මෝහයෙන්, ඊර්ෂ්‍යාවෙන්, අන්‍යයන්ගේ මත නොඉවසීමෙන්, අන් අයගේ හොඳ දේ දකින්න බැරිකමින්, දුෂ්ට කමින්, බොරු ප්‍රශංසාවට යටවෙමින් අපගේ සිත කිළුටු කරගෙන අවසානයි.

එවැනි තත්ත්වයක් යටතේ ක්‍රිස්තුන් වහන්සේට අපේ හදවත් තුළට පැමිණිය හැකි ද? ඔවුන් වහන්සේ මඟබලා සිටින්නේ අවුරුද්දකට එක සැරයක් වත් එළියට ගන්නා ගවලෙන් ප්‍රතිමා වගේ අවුරුද්දකට එක සැරයක් වත් අපේ සිත් පිරිසිදු කර ගනිමින් ඔවුන් වහන්සේට වඩින්නට සුදුසු පරිසරයක් සකස් කරයි යන සිතුවිල්ලෙනි. අඩුම වශයෙන් අප අතින් වන අඩුපාඩු රාශියකින් එකක් හෝ නිවැරදි කර ගනිමින් සිතේ තිබෙන කුණු පැල්ලම් ඉවත් කරගෙන සැබෑ සිත් හැරීමක් තුළ නිර්මල සිතක් ඇති කරගනිමින් යහපත් පාපොච්චාරණයක් කර උන්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් මේ නත්තල අර්ථවත් කරගන්නට සූදානම් වෙනවා නම්.... එයයි අපගෙන් ඔවුන් වහන්සේ බලාපොරොත්තු වන්නේ.

බාහිර ආටෝපයන්ගෙන් පිරිඳ ඉතිරි නොගොස් අන් අයගේ විපතේදී උණුවන හදවතක් ඇති, යහපත් මිනිසුන් වෙමින් දෙවිඳුන්ට ආදරය කරන, සාමය, ප්‍රේමය තුළ ජීවත්වන අනෙකා වෙනුවෙන් කැපවෙන වැයවෙන, අප අතින් වූ පාපයන්ට පසුතැවිලි වන නිර්මල සිත් ඇත්තන් වෙමින් ජේසු කුමරුවාණන් පිළිගන්නට සැරසෙමු. එයයි අපගෙන් ඔවුන් වහන්සේ බලාපොරොත්තු වන්නේ.

පමා නොවී මේ නත්තල් සමයේ දී වත් අවංක සිතින් යුතුව යහපත් පාපොච්චාරණයක් කරගනිමින් උන්වහන්සේට අප හදවත් තුළට වඩින්නට හැකි වන වාතාවරණයක් ගොඩ නැගීමට අදිටන් කරගනිමු.

අප ජීවිත පාපයෙන් මුදවා ගෙන වෙනස් වෙමින් ප්‍රේමයෙන් සාමයෙන්, ප්‍රීතියෙන් යුතුව අන් අයට ආදර්ශයක් වෙමින් දිවි ගෙවන්නට නිරතුරු උත්සාහ ගනිමු. එයයි සැබෑ නත්තල. එයයි අරුතැති නත්තල.

**ශාන්ත සුසිල් විජේරත්න**
අගරදගුරු පදවි ගිහි අපෝස්තලික සේවාවේ පුහුණුවන පළමු කණ්ඩායමේ සාමාජික



# දේශපාලනයයි මිනිස් ඝාතනයයි නත්තලයි

ලෝකයේ මිනිස් ඝාතන වර්තමානයේ තරම් ඉහළ ගිය යුගයක් තවත් නැත. වසර 2500 ක ඉතිහාසයක් තුළ ද ශ්‍රී ලංකාවේ මෙතරම් මිනිස් ඝාතන රැසක් සිදුවූයේ ඓශ්චර්යයක් ලෙසද යන්න අපට කුකුසකි.

ආදම් හා ඒව දෙවියන් වහන්සේ විසින් සුගති උද්‍යානයේදී නියම කළ තහනම් ගසේ ගෙඩි කෑමෙන්, මිනිසා පාපයට වැටීමත් සමඟ, පරම්පරාවක් කරා ගමන් කිරීමේ මාර්ගයක් ඇතිවිය. නමුත් ආරම්භයේ දීම කායින් - ආබෙල්ගේ කථාවේදී තම සොයුරා වන ආබෙල්ව කායින් අතින් මරා දැමීම තුළ මේ මිනිස් ඝාතනයේ ආරම්භය ඇති වූවා යැයි අපිට හඳුන්වා දිය හැක්කේ ශුද්ධවූ බයිබලය ඇසුරිනි.

අද ලෝකයේ විවිධ සිද්ධි ආවර්ජන කිරීමේදී හිට්ලර්, මුසෝලිනි වැනි කෲරත්වයේ ආදීනව තුළ මිනිමැරුම් දහස් ගණනක් විය. ඊට නොදෙවෙනි ලෙස අප රටේ ද වියරු ත්‍රස්තවාදයෙන් ඔද වැඩී ප්‍රභාකරන් විසින් සිදු කළ ඝාතන ද මිල කළ නොහැකි උතුම් ජීවිත විය. රටේ මොලකරුවන්, දක්ෂතා පූර්ණ පරපුරක් විනාශ භංගත්වයට යාමට ද මේ රටේ මුල පිරුවේ දේශපාලනික වශයෙන් යම් යම් විසඳුම් ලබා නොදීමේ ක්‍රියාවලිය තුළ බව නිසැක වශයෙන්ම දක්නට ලැබෙන සත්‍යයකි. වසර 30 ක් පුරා පැවැති දරුණු යුද්ධයේ ඓතිහාසික කථාව තුළ ද යම් යම් වැරදීම් සිදුවීම් සිදුවීම තුළ එය නිරවුල් කර ගැනීමට නොහැකිකම නිසා මේ දුක්ඛාන්ත තත්ත්වය රටට උදා වූ බව නොරහසකි. මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කරවන තරම් වූ යුගයක මිනිස් ජීවිතයක අගය මෙතරම් දුරට බාල්දු වූ යුගයක් නොමැති තරම් විය. සුනාමියෙන් අප රටේ ගිලගත් මිනිස් සංඛ්‍යාවකට වඩා පිරිසක් ඒ යුද්ධය නිසා මිය ගිය බව නිසැකය. මේ ශ්‍රී ලංකාවේ සිදුවූ 71 කැරැල්ලේ ද තරුණ ජීවිත බිළි වූ අයුරු, 83 ජූලි කළබලයෙන් විනාශ වූ ජීවිත සංඛ්‍යාවද අපමණය. අපට අපගේ මනුෂ්‍යයන්ගේ වටිනාකම් නොදන්නා අමනුෂ්‍ය ලෝකයක අඳුරු වලාපට තිර ඇදෙද්දී නායකත්වය තුළ ඍජු තීරණ ගැනීමෙන් මේ සකල විධ ඝාතන සිදුවන්නට ඇති බව සක්සුදක් සේ පැහැදිලි වන්නකි.

අද මිනිසාගේ උත්තරීතර වටිනාකම දැනගන්නට නම් අප ජීවිත තුළට කිඳා බැසිය යුතු විශේෂත්වයක් තිබිය යුතුය. එය නම් හෘදය සාක්ෂිය අනුව ජීවත් වීමය. එම භාරධූර කාර්යය අපගේ හදවතින් සිදු කළ යුතු වන්නේ යහපත් සිතුවිලි තුළින් ය. හරිහැටි අවබෝධ කරගත් මානව ධර්මතා තුළ ජීවිතය ස්ථිර සාර මාර්ග යක් කරා ගෙන යාමට අපට සමාජයෙන් ලැබෙන පසුබිම තුළ යහපත්ව ගත කරමින්, ආගමානුකූල ජීවිත හැසිරීමක් කරා එළඹීමෙන් අපගේ යහපත් පරමාර්ථ ඉටුකිරීමේ ඒකායන ප්‍රාර්ථනයක් කරා ළං වීමට හැකිවනු නියතය.

මිනිස් ඝාතන සිදුවීමේදී මෙයට වක්‍රව බලපාන රටේ විවිධ ප්‍රශ්නද හේතු නොවෙනවා නොවේ. තමන්ට ජීවත්වීමේ අයිතිය තුළ අධ්‍යාපනය, රැකියාව, ආර්ථිකය, මූලික මානව අයිතින් තුළ දේශපාලනික නිදහස පවා නැතිවීමෙන් මේ ඝාතන රැල්ල වැඩි වීමට ඉවහල් වී ඇති බව කිව යුතුය. පොලිසිය විසින් නීතියට විරුද්ධව කෙරෙන අල්ලස් දූෂණ, අධිකරණ කරා යාමට ඇති බාධක අහුරන සාක්ෂි (මිනිමැරුම්), බලපෑම්, තර්ජන, ගර්ජන හමුවේ නීතිය සැහැල්ලුවට පත් වීමත්, වරදකරුට දේශපාලන රැකවරණ ලැබීම තුළින් සිදුවන දේශපාලන ඇඟිලි ගැසීම් මේවා අතර කැපී පෙනෙන කරුණු වෙති. එසේ නම් මේ සා විසඳුම් ලබා ගත හැක්කේ කෙසේ ද? ප්‍රශ්නයකි.

ශ්‍රී ලංකාවේ දේශපාලන කරළියේ මිනිස් ඝාතන ඇයි? මේ බලය ලබා ගැනීම පිණිස නේද? එදා එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ ඝාතනයෙන් පසු මෙරටේ වටිනා දේශපාලන ඝාතන කොතරම් සිදුවීද? විජය කුමාරණතුංග, ලලිත් ඇතුළත් මුදලි, ආර්. ප්‍රේමදාස, ගාමිණී දිසානායක, ඔසී අබේගුණසේකර, අමිර්තලිංගම්, රෝහණ විජේ වීර, වැනි විවිධ නායකයන් පාට දේශපාලනයේ නිරත වීමෙන් තම ජීවිත පරිත්‍යාග කිරීමට සිදුවූයේ අතිශය බිහිසුනු ලෙසය. රටක් ගොඩනැංවීමට තිබූ මේ ජීවිත තුළින් අපගේ අනාගතය කබාසිනියා වීමට තුඩු දුන් බව අපට පැහැදිලිය. අද අප සමාජයේ දේශපාලන සංස්කෘතියේ ඇති තවත් විශේෂත්වයක් නම් තම තමන්ගේ බෙලි කපාගෙන ජීවත් වීමේ අරගලයක නිරත වී සිටීමය. මනාප පොරය තුළ මොනතරම් මිනිස් ඝාතන රැසක් සිදුවීද? දේශපාලනඥයන් පාතාල ලෝකයේ මිනිමරුවන් ළං කරගෙන අද සිදු කරන අපරාධ රැල්ලද කිසිසේත්ම අනුමත කළ නොහැකි, ස්ත්‍රී දූෂණ, ගෙවල් කඩා දැමීම්, බලහත්කාරකම්, මංකොල්ල මේ අතර ඉහළින්ම නැඟී සිටින දූෂිත කාරණා හා මේ වරදවල් වලට දඬුවම් ලබන අයව සුරක්ෂිත කිරීමට දේශපාලනඥයන් නීතියට සරදම් කිරීම විහිළුවක් බව සිතට ගත යුතුය.

අරාබි රටක, නැතහොත් මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවල ඇති අධික නීතිය නිසා මිනිසා අද මෙල්ල කර දූෂණ, අපරාධ අවම කර ගැනීමට හැකි වී ඇත. නමුත් ලංකාවේ "එල්ලුම් ගහ" ක්‍රියාත්මක කළ ද එය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම තුළ ද මිනිස් ඝාතන රැල්ල වැඩිවීමට හේතු වී ඇත. දේශපාලනඥයන්ගේ බැල්ම, කැල්ම මේ නිසා අපරාධකරුවා නිදහස් කර, නිවැරදිකරුවා අසරණ වන තත්ත්වයකට නීතිය උරුම වී ඇත.

එදා ක්‍රිස්තු ජීවිතයක් ගත කළ සමාජයේ ජුදා නීතිය තුළ වරදකරුවන්ට ද නීතියේ බලපෑම තුළ නිදහස ලබා ගැනීමට අද වැනි මේ දේශපාලනඥ නිලධාරි පැලැන්තියක් ද විය. ජේසු සමිඳාණන්ට උරුම කර දුන් තීන්දුව එයට කදිම උදාහරණයකි. ජුදා සමාජයේ "ජේසු නසරේනු මරා දමව්" "බරබ්බස් නිදහස් කරව්" සටන් පාඨ විය. ජේසු කුරුසියේ මරණයට තීන්දු විය. ඝාතන සංස්කෘතියේ මේ තවත් එක් සිද්ධියක් වුවද, ලොව මවිත කළ උදාර සිදුවීම වූයේ දෙවියන් වහන්සේගේ පුත්‍ර මිනිසත් බව ගෙන වද විඳ ජීවිත පූජා වී නැවත, මරණයෙන් උත්ථාන වීම තුළය. අද ජේසු බිළිඳු සමරන නත්තලේ අපගේ සිත් සතන් යොමු විය යුත්තේ දේශපාලනය තුළ මිනිස් ඝාතන රැල්ලට අනුබලදීම නොව කිතු උපතින් ගෙන හැර පෑ මාංශගතවීමේ නත්තල යථාර්ථවාදීව ජීවිත තුළට ඇතුළු කිරීමට කිතුනු දේශපාලනඥයන් මේ ඝාතන රැල්ලට අනුබල නොදී ඇත්වී හෘදය සාක්ෂිය තුළ කිතුනු සාක්ෂිය ලොවට මොරගා කියන්නට උත්සාහ ගත යුතුය.

කිතු උපතින් උදා වූ නත්තල අප ජීවිත පුබුදුවාලන සංකේතයක් කරගත යුතු අතර, දුප්පතාට, දුගියාට, අසරණයාට, සරණය වන නත්තලක් ලෙසින් ගත කිරීමට උත්සාහ දැරීම අපගේ යුතුකම හා වගකීම වන්නේ ය.

"උඳුවප් මිහිර" සංස්කාරක හා ජාතික කතෝලික ලේඛක හවුලේ භාණ්ඩාගාරික
**මැක්සිමස් රෝයි පෙරේරා**



## මරිමව් තුළින් බිළිඳු සොයා යමු

---

නත්තල් කෙටි කතාව

# නොසසල සිතක්

"අර කට්ටිය ආව නේද මෙහෙ...?

"ආව නේන්නං... මං ගවුම වැළට දාන්න එළියට බහිනකොටම ගොඩ වුනා ගෙට ... මෙන්න ඔයාට දෙන්න කියල මේවත් දීලයි ගියේ..."

"මං දැක්කා ප්‍රජා ශාලාව ළඟින් බැහැල එනවා.. මං පාගල ගියේ ඉක්මනට එන්න හිතාගෙන... කොහෙද එක කඩේකවත් පාන් නෑ ඔක්කොම තියෙන්නෙ කේක්... අන්තිමෙට බේකරියටම ගියා... එතැනින් පාන් ගෙඩියක් අරන් එනකොට වයලට් අක්ක අත්අඩංගුවට ගත්තා..."

"වයලට් අක්කා....?"

"ඔව්.. මේ වතුර ටැංකිය ගාව වයලට් අක්ක.... නත්තලට ගමේ ඇවිත් කියන්ඩ තියෙන ඉහළ ඔක්කොම කිව්වා... ඊට පස්සෙ අහන්ඩ තියෙන සේරම ඇහුවා... දුවට බබා හම්බ උනාද ඇහුවා... පුතෙක්ද දුවෙක් ද ඇහුවා... ඒ පාර මං කිව්වා දුවෙක් කියලා..."

"ඇයි අනේ බොරු කිව්වෙ...?

"දුවෙක් උනත් පුතෙක් උනත් දරුවෙක්නෙ... ඊට පස්සෙ ඇහුවා කොහේද බබා හම්බ උනේ කියලා... කාසල් එකෙයි කිව්වම ඇස් දෙක උඩ ගියා... ආණ්ඩුවෙ ඉස්පිරිතාලවල ළදරු මරණ වෙනව වැඩියිලු... කිසිම සැළකිල්ලක් නෑලු... සැල් දානවට වැඩිය දෙයක් නෑලු... ඔව් ඉතින් ප්‍රයිවට් තැන්වලට ගියාම හිනාවෙලා... ගුඩ් මෝනිං කියලා... ළඟට ළං කරගෙන බලන්න ඕන හැමදේම බලනවා... කියන හැමදේම අහගෙන ඉන්නවා.... කරන්ඩ පුළුවන් හැමදේම කරනවා..."

"සල්ලි වලට තමයි... ඒවයෙ අයිතිකාරයො දොස්තරට කියල තියෙන්නෙ උඹලත් හම්බ කරගෙන මටත් හම්බ කර දියල්ල කියලලු...."

"ආණ්ඩුවෙ ඉස්පිරිතාලවල ඒව එහෙමම නෑ තමයි. ඒත් ලයින්හෝම් එකෙයි කාසල් එකෙයි කොච්චර නං බබාල හම්බ වෙනවද?... කොයි තැනක ගියත් දන්න කෙනෙක් ඉන්නව නං ඉතින් සපෝට් එකක් තියෙනව තමයි... ඇයි මතක නැද්ද ඔයාට දුව හම්බවෙන්න ගිය වෙලාවෙ...."

"ඒක නං කියල වැඩක් නෑ... හුඟක් අම්මල මිසීලට බනිනවා. හරියට මිසීල කරපු දෙයක් වගේ.... මං එක වචනයක් කටින් පිට කළේ නෑ... එහෙම කළානං අරයටනෙ සවුත්තුව... ඒක හන්ද වාට්ටුවෙ හිටිය මිසීල ඔක්කොම මට කරුණාව දැක්කුවා..."

තම වැඩිමහල් දියණිය ප්‍රසූත කිරීම සඳහා රෝහල් ගත කරන ලද ජයදාසගේ බිරිඳට එහි සේවය කරන ගමේ හෙද නිළධාරිණියකගෙන් කොපමණ සහයෝග යක් ලැබුනා දැයි ජයදාසට අමතක නොවේ. දියණිය ප්‍රසූත කළ දිනයේ තම සේවා මුරය නිමකර වුවද දියණියගේ වැඩකටයුතු අවසන් වනතුරු එහි රැඳී සිටීමට ඇය කාරුණික වූයේ ගමේ කමටය. දියණියගෙන් පසු ඔහුගේ බිරිඳට පුතෙකු හම්බවන විට දී ද ඇයට ලැබුණු සහය එලෙසම විය.

එයින් කලකට පසු ජයදාසගේ දියණිය පළමු දරුවා බිහි කරන්නට රෝහලට ඇතුළත් කරනු ලැබූ විට දී ඇයට එහි සිටි ඇය හා එක පන්තියේ උගත් වෛද්‍යවරියකගෙන් ලැබුණේ මෙතෙකැයි කිව නොහැකි සත්කාරයකි. ප්‍රසූතිකාගාරය තුළ දියණියට විළිරුදාවෙන් කෑමොර දෙමින් වෙහෙසෙන්නට සිදු නොවූයේ මෙම වෛද්‍යවරියට පින්සිදු වන්නට ය. ඇය දියණිය බැලීමට වාට්ටුවට පැමිණීමෙන් පසු දියණියට ලැබී තිබුණේ උපරිම අන්දමේ සැළකිල්ලකි.

එහෙත් දියණියත් ජයදාසත් අසරණ වූයේ ඇගේ දෙවැනි දරුවා බිහිකිරීමේදීය. එම අවස්ථාවේ දියණියගේ සහයට කිසිවකු නොවීම හේතුකොටගෙන ජයදාස තුළ ඇතිවී තිබුණේ කෙලෙසකවත් හිත හදා ගැන්මට නොහැකි තත්ත්වයකි.

"තාත්ති ..මං කිව්ව ඩොක්ටට නෝමල් හම්බ වෙනකං ඉන්නෙ නැතිව සීස කරල බබාව ගම්මු කියලා... එතකොට ඩොක්ට අහනව හැම අම්මම කැමති නෝමල් හම්බ වෙනවටලු...මේ අම්ම විතරක් සීස කරමු කියන්නෙ ඇයි කියලා... අම්මෝ ඒක නං ඇත්තම තමයි. වෝඩ් එකේ ඉන්නව මුස්ලිම් අම්මල දෙන්නෙක් ඒ දෙන්නගෙ වැඩේ අල්ලා නෝමල් අල්ලා කිය කිය ඇවිදිනවමයි. .. මං ඩොක්ටට අරම කිව්වම කියනව එහෙම නං ප්‍රයිවට් තැනකට ඇඩ්මිඩ් වෙන්නලු... කියන දවසක කියන වෙලාවකට බබාව ගන්නම්ලු..."

"ඒක තමයි මාත් කියන්නෙ... මං කොහොම හරි සල්ලි හොයලා දෙන්නම්..." "සුමිත් කියන්නෙත් එහෙම තමයි. ඒත් ඔය ලක්ෂ ගණන් වියදම් කරන තැන් තියෙන්නෙ අපි වගේ ආණ්ඩුවෙ රස්සාවල් කරන අයට නෙමෙයි.... ලොකු ලොකු අයට... මේ වගේ තැන් අපට හොඳයි අනේ.."

"ඉතින් කවුද මේ සැරේ ඔයාව බලාගන්න ඉන්නෙ... ඔයාට සැන්ටො දිදී නෝමල් හම්බ වෙනකං වද දෙයි... වරු ගානක් ඔයා ලේබරෑම් එකේ ඉඳන් කෑමොර දෙද්දි එළියෙ ඉන්න අයට තමයි දරාගන්න බැරි..."

"ටිකක් හිත හයිය කර ගන්නකො තාත්ති... මං කිසිම කරදරයක් නැතිව දුවව ගෙනාව වගේම පුතාවත් අරගෙන ගෙදර එන්නම්කො... කිසිදේකට සැලෙන්න එපා.... මාව බලාගන්න කෙනෙක් ඉන්නව... වෙලාවට එයි මා ළඟට ...අනේ අනේ.... ඉස්සර නං ඔයා ඔහොම නෑ..."

තම දියණියගේ කතාවේ කිසිම වරදක් නැතිබව ජයදාසට සහතිකය. එදා ඇය ජයදාසගේ කපාපු පළුව යැයි නොකියූ කිසිවකු නොවූ බව සැබෑවකි. බාහිර පෙනුමෙන් පමණක් නොව ගති පැවතුම් වලින්ද එය එසේම විය. එහෙත් දැන් එසේ නොවේ. ඔහුගේ ධාරණය කර ගැනීමේ ශක්තිය මුළුමනින්ම වාගේ හීනවී ගොසිනි. රෝහල් ගතවීමට යාමට මත්තෙන් තමන්ගේ දෙපා වැඳ පිටත් වී ගිය දියණිය නැවත දකින තුරු ඔහු තුළ කිසිදු අස්වැසිල්ලක් නොවූයේ එබැවිනි. තම කුස තුළ සිටින පුංචි පුතා තුරුළු කරගෙන දියණිය ගෙට ගොඩවන තුරු ජයදාස මඟ බලා සිටියේ මහත් නොඉවසිල්ලකිනි. ඔහුගේ එම පැතුම මල් එල ගන්වමින් පුංචි පුතුව තුරුළු කරගෙන පැමිණි දියණිය තමන් හට සරණය වූ තැනැත්තිය වෙත ගමන් කළ ආකාරය ජයදාසට කිසිසේත් අමතක නොවන්නකි.

"දුවට මේ සැරේ හිටියෙ වෙන කවුරුවත් නොවෙයි.... දේව මෑණියො... ඔබට කැමති ලෙස මට සිදුවේවා කියල දේව කැමැත්තට හිස නමල විඳින්න ඕන හැම දුකම දරා ගත් දේව මෑණියො... එදා රෑ දේවමෑණියන් ළඟත් කවුරුත් හිටියෙ නෑනෙ... මොන දුකක් දරා ගන්න ඇද්ද... තානායමේ ඉඩ නැතිව ... ගවලෙනේ සීතලේ ගැහි ගැහී

"ඒ උනාට අර ආපු කට්ටිය කියපු හැටියට එදා රෑ එච්චර සීතලක් තිබිල නෑනෙ... ඒ ගොල්ල කියන්නෙ නත්තල දෙසැම්බර් මාසෙ නෙමෙයිලු... ඔක්තෝබර් මාසෙලු... දෙසැම්බර් මාසෙ සීත වැඩියිලු... මං ඇහුවා බයිබලේ එහෙම තියෙනවද කියලා... එහෙමත් නැතිලු..... ඒත් දෙසැම්බර් මාසෙ නෙමෙයිලු..."

"ඔය කියන්නෙ ලූක් තුමාගෙ සුවිශේෂයෙ තියෙන එක වචනයක් අල්ලගෙනයි.... එඬේරු රෑ පිට්ටනියෙ බැටලුවන් බලාගෙන හිටියයි කියල තියෙනවනෙ සුවිශේෂයෙ... දෙසැම්බර් මාසෙ එඬේරුන්ට බැටලුවන් බලාගෙන එළිමහනෙ ඉන්න බැරිලු...මේ ගොල්ලන්ට කියන්න ඕන මූලධර්මවාදියො කියල නෙමෙයි. විකෘති ධර්මවාදියො කියලයි. එහෙම නං අපිටත් කියන්න පුළුවනිනෙ... ඔච්චර ජේසු බබාට වෛර කරපු හෙරෝද් ඒ රෑම බෙත්ලෙහෙමට ආවෙ නැත්තෙ සීතල වැඩි කමටයි කියලා... එතකොට ඇයි දේව මෑණියො ජේසු බබාව රෙදි පටිවලින් ඔතල ගවඔරුවෙ තිබ්බෙ...

කොහොම වුනත් දේව මෑණියන් තුළ තිබ්ච්ච විශ්වාසය හින්දම හැම දුකක්ම දරාගැනීමේ ශක්තියක් තිබුණා... දුවට තිබුණොත් ඒ වගේම විශ්වාසයක්...."

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව

## ජේසු ඉපදුනි!

**සිසිල ගෙනෙන උඳුවපයේ පිංබර රැයක**
**ගව බැටලුන් ලගින අබලන් දුගි ගවහලක**
**ඔරුවේ පිදුරු මත යහනකි සැකසුණු හනික**
**ඉතිහසෙ දෙකඩකර ජේසු ඉපදුනි අදවන් දිනෙක**

**ආගම්, ජාති, කුල තුළ මිනිසුන් වෙන් නොකෙරේවා**
**ධන, බල, නිළවලට අධි තන්හා නොමවේවා**
**එකමුතු දැහැමි දැය හෙට රට බිහිවේවා**
**ලක්වැසි සැමට සිරි සුබ නත්තල් වේවා!**

**කොල්වින් ඒ. ප්‍රනාන්දු**
**කටුනේරිය**



## මරිමව් තුළින් බිළිඳු සොයා යමු

# දෙවිඳුන් තනි නොකරන නත්තල

නොවැම්බර් මාසය ගෙවී දෙසැම්බර් මාසය උදාවෙන කලට මුළු ගමම අලුත් වෙන්නට පටන් ගන්නේය. මහමුහුදේ රළු ස්වභාවය කෙමෙන් තුරන්වී යයි. වාරකන් සුළඟ නැතිනම් නිරිත දිග මෝසම නිමාවී ඊසාන දිග මෝසම හෙවත් උතුරුකන් සුළඟ ගම හරහා හමන්නට පටන් ගන්නේය. ඉල් පොහොය උදාවෙත්ම සඳඑළියෙන් මුළු ගමම එළිය වෙන්නට පටන් ගනී. සඳ එළියට වැඩියෙන්ම බබලන්නේ ගමේ දෙව්මැඳුරයි. මහ මුහුදට නුදුරින් තරමක් උස් බිමක දෙව්මැඳුර පිහිටා තිබේ. මහ මුහුදේ රළගෙඩි බිඳෙන හඬත් කලපුව දෙසින් හමා එන උතුරුකන් සුළඟේ සෝෂාවත් පරයමින් දෙව් මැඳුරේ සංඨාරයෙන් දිනකට තුන් හතර වතාවක් නැගෙන ගාම්භීර නාදය මුළු ගම්මානයම වසාගෙන පැතිරී යනවිට කතෝලික ගමක අසිරිය මොනවට පැහැදිලි වෙයි.

ගමේ ජනතාවට තමන්ගේ දෙව්මැඳුරට වඩා වෙනත් දෙයක් නැති තරම්ය. ඔවුන් දෙව්මැඳුර දෙවියන්ගේම ගෘහය ලෙසින් සලකන්නේ පිතා පුත්‍රයා හා ස්ප්‍රිතු යන තුන්දෙනා වහන්සේලාව එතැන්හි වැඩ සිටින බැවිනි. එපමණක් නොව බැතියෙන් වන්දනාමාන කරන මරිය මවුන් සහ ශුද්ධවන්තයින්ද දෙව්මැඳුරේම ජීවමාන ලෙසට දෙවියන් අසලින්ම වැඩසිටිනා බවත් ඔවුන් විශ්වාස කරති. දෙනෙතට නොපෙනුනත් දිව්‍ය සත්ප්‍රසාදය තුළත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජීවමානව වැඩ සිටිනා බවද තරයේම විශ්වාස කරති. දේව වචනය ලියා ඇති ශුද්ධ වූ ලියවිල්ල හෙවත් ශුද්ධ බයිබලය දේවස්ථානයේ ඇති තවත් අගනා වස්තුවකි. දිව්‍ය සත්ප්‍රසාදයේ සලකුණ හෙවත් රක්තවර්ණ තෙල් පහන අල්තාරය මත නිතරම වාගේ නොනිවී දැල්වෙයි. දෙව්මැඳුරේ ස්ථානගතකර ඇති ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාවන් දකිනවිට එතුමන්ලාව සිහියට නැගෙන අතර එතුමන්ලා කෙරෙහි තිබෙන භය භක්තියද ඉස්මතු වෙයි. එතුමන්ලාගේ ජීවිත ආදර්ශයට ගැනීමට සිත්වෙයි. බොහෝ වේලාවට ගරු පියතුමකු දේව සේවය වෙනුවෙන්ම ලැගුම් ගෙයි වැඩහිඳියි. එතුමාණෝ ජනතාව සමග ඉතාමත් සුහද ලෙසට කාලය ගත කරති.

අපගේ ගම්මානය පුරාණ කතෝලික ගමකි. ජීවත් වෙන්නෝ පාරම්පරික කතෝලිකයෝය. ගමට දෙව්මැඳුරත් දෙව්මැඳුරට ගමත් නැතිවම බැරිබව පෙනෙයි. ගමයි දෙව්මැඳුරයි, මුහුදයි, කලපුවයි ජනතාවගේ ජීවිත වලට සම්බන්ධ වෙන්නේ ගම ආරම්භවූදා පටන්ම යැයි කීවාට කිසි වරදක් නැත. ගමේ පැවැත්වෙන සෑම වැදගත් කාරියකටම නැතහොත් උත්සවයකට මුල් වෙන්නේ දෙව්මැඳුරයි. මූලිකයා වෙන්නේ පියතුමායි. ප්‍රදේශයේ සෑම ගමකම වාගේ දෙව්මැඳුරක් ඇත. මේ සෑම දෙව්මැඳුරක් ආශ්‍රිතව පාසලක්ද ඇත. ගැහැනු පාසල හා පිරිමි පාසල යනුවෙන් ඒවා දෙකට බෙදා ඇත. පාසලේ පාලනය සිදුවෙන්නේ දෙව්මැඳුරෙන්ය. මේ සෑම පාසලක්ම රෝමානු කතෝලික පාසල ලෙස නම් කර ඇත. කන්‍යාරාමයක්ද ගමේ ඇත. ගැහැනු පාසල පිහිටියේ මේ කන්‍යාරාමය අසලමයි. පාලනය කළේ කන්‍යා සහෝදරියන්ය.

ගමේ ජනතාව දෙව්මැඳුරේ පියතුමාට විශාල ගෞරවයක් හා භය භක්තියක් දක්වයි. ඔව්හු පියතුමා ආමන්ත්‍රණය කළේ පියාණෙනි කියාය. නැතහොත් ඔබවහන්සේ කියාය. කිසි විටෙක වත් ඔව් කියා තනි වචනයෙනුත් පිළිතුරු දුන්නේ නැත. කිව්වේ එහෙයි පියාණෙනි කියාය. මඟ තොටකදී පියතුමකු මුණ ගැසුනහොත් දණනමා "ජේසු



ක්‍රිස්තු ආරාධිත වේවා" කියා උච්චාරණය කරති. පියතුමාද නැවතී දකුණතින් කුරුස සටහන ඇඳ ආශිර්වාදය දානය කරයි. බාල මහළු ගැහැනු පිරිමි භේදයකින් තොරව සියල්ලෝම එසේ කරති. කතෝලික පරිසරයකට පමණක් හුරුවූ වචන බොහෝමයක් ගමේ ජනතාව නිතර දෙවේලේම භාවිත කරයි. එය පුරුද්දට වාගේ කියවෙයි. භීතියක් ඇතිවූ විට නිසැකවම 'ජේසු මරිය ජුසේ' කියා මුවින් පිටවෙයි. කුතුහලය දනවන යමක් කව්රුන් හෝ කියුවිට එය ඇසූ කෙනාට 'ජපමාල අම්මා' කියා කිය වෙන්නේ ඉබේම වාගේය. යමක් සත්‍ය බව ඒත්තු ගැන්වීමට දිව්රනවා වෙනුවට 'සන්තානම් මැණියන් පල්ල හෝ ජපමාල මැණියන් පල්ල' යන වචනය පිට කරන්නේ භය භක්තියෙන්ය. ජපමාල මැණියන් යයි කිව්වේ මරුදමඩු පල්ලියේ දේව මැණියන්ටය. සන්තානම් මැණියනි කිව්වේ තලවිල පල්ලියේ ශාන්ත ආනා මැණියන්ටය.

ගමේ පළමු පුරවැසියා ලෙසට සලකන්නේ දෙව්මැඳුරේ පියතුමාණන්වය. ප්‍රදේශයේ ඒජන්ත උන්නාන්සේ සමග වුවද කෙලින් සිටගෙන කතා කළහැකි එකම පුද්ගලයා එතුමාණෝ පමණය. එතුමා කාටවත් බියවන්නේ නැත. සණ්ඩු සරුවල් වලට ප්‍රසිද්ධ ගමේ ඕනෑම චණ්ඩියකු වුවද එතුමාට කීකරුය. මිනිස්සු සුළු සුළු ආරවුල් වෙනුවෙන් පොලිසි උසාවි ගියේ නැත. සියල්ල විසඳා දුන්නේ පියතුමාය.

ගමත් පල්ලියත් අතර පවත්නා සම්බන්ධය වඩ වඩාත් හොඳින් පවත්වාගෙන යන පිණිස ගමේ දායක මණ්ඩලයක් සිටියි. ගමේ 'අන්නාවිරාල' නමින් හැඳින්වෙන පුද්ගලයකු සිටියි. මේ අන්නාවි රාල තනතුරට තරමක් උසස් තනතුරක්ද තව තිබේ. එය හැඳින්වූයේ "මුහුප්පු රාල" යන නමින්ය. මේ දෙදෙනාගෙන්ම ගමේ ජනතාවට සිදුවෙන සේවය අපමණය. අන්නාවි රාලගේ එක් ප්‍රධාන කටයුත්තක් නම් විවාහ මඟුල් සඳහා පෙරනම් කීමය. බොහෝ විට මේ වෙනුවෙන් ඔහුට දෙපාර්ශවයෙන්ම ගතමනාවක් ලැබුණෝය. කෙනෙකුගේ මරණය අන්නාවි රාලත් පියතුමාත් එකතුවෙන තවත් සිරිතකි. මරණයක අවසාන කටයුත්ත සඳහා මේ දෙදෙනා සහාභාගි විය යුතුමය. මළාවූ අය වෙනුවෙන් අවසාන යාච්ඤාව උච්චාරණය කරන්නේ අන්නවි රාලයි. ඉරිදා දිව්‍ය පූජාව පටන් ගැනීමට පෙර "ඔරසන් පාඩම් දීම" යනුවෙන් භක්ති අභ්‍යාසයක් ඇත. ඒ කර්තව්‍යයේ මූලිකයා අන්නවිරාලයි. ඔහු මහා හඬින් උච්චාරණය කරන යාච්ඤා වලට බැතිමතුන් හඬ නගාම පිළිතුරු දෙයි. දිව්‍ය පූජාවට පමණක් නොව ජපමාලය උච්චාරණයට, සවස නුවානයටද ඔහු එසේ කරයි. බොහෝ විට අන්නාවි තනතුරත්, මුහුප්පු තනතුරත් ලැබෙන්නේ පරම්පරාවෙන්ය. සම්ප්‍රදාය එසේවුවද ඒවා බිඳ වැටෙන අවස්ථාද තිබේ. 'සන්ක්‍රිස්තියන්' කියා තවත් කැපී පෙනෙන රාජකාරියක් කරන්නෙක්ද සිටී. පියතුමාගේ ප්‍රධාන සහයකයා ඔහුයි. ඔහු සඳහා වෙන්කරන ලද ස්ථානයක්ද දෙව්මැඳුරේ තිබේ. එය හැඳින්වූයේ සන්ක්‍රිස්තියන් කාමරය කියාය. දෙව්මැඳුරේ සිදුකෙරෙන සෑම භක්ති අභ්‍යාසයක් සඳහාම සියල්ල සූදානම් කළ යුත්තේ ඔහු විසිනි. සාන්ඨාරය හැඬවීමේ අවසරය ඇති එකම තැනැත්තා ඔහු පමණකි. මෙයත් ගරු නම්බු ලැබෙන තවත් කාරියකි. බොහෝවිට ලැබෙන්නේ පරම්පරාවෙන්ය.

ගමේ ජනතාව සිය සාරධර්ම ඉගෙන ගන්නේ දෙව්මැඳුරෙන්ය. බයිබලය අනුසාරයෙන් කෙරෙන ධර්ම දේශනා තුළින් ඔවුන් යහපත් දෙයම උගත්තේය. වාර්ෂික මංගල්‍ය සතිය තුළ කෙරෙන දේශනා ඇසීමට ඔවුන් බොහෝ ආසා කරති. ඉතාමත් දක්ෂ දේශනාවාදී පියතුමන්ලා දේශනා පවත්වති. දෙව්මැඳුර ජනයාගෙන් පිරීයති. පාරම්පරික කතෝලික සංස්කෘතිය ගමේ දෙව්මැඳුර කේන්ද්‍ර කරගත් සංස්කෘතියක් වශයෙන් හැඳින්විය හැකිය. නීති විරෝධිවූ අශීලාචාර දූෂිත දේවල් කිසිම දෙයක් ගමේ කෙරුනේම නැත. මේ නිසා පොලිස් උසාවි වල ගමේ මිනිසුන්ගේ නම් කියවුනේම නැත. පත්තරවල පළවුනෙද නැත. ශුද්ධ වූ ත්‍රිත්වයට මුල් තැන දීම කාගේත් සිරිතකි. බොහෝ දෙනා බත් පිඟාන කෑමට පෙර කුරුසය ලකුණ අඳිති. වතුර බාල්දිය හිසට වත්කිරීමට ඉස්සර නළලේ කුරුසිය ලකුණු කරති. මුහුදට හෝ කලපුවට පය තැබීමට පෙරද පිතා පුත්‍රයා දමති. ඔවුන් එසේ කරන්නේ ඉතාමත් ප්‍රබෝධ සිතින්ය. දෙවියන් කෙරෙහි ඇති අචල විශ්වාසයෙන් බොහෝ ප්‍රාර්ථනා සිතේ තබාගෙනය.

ග්‍රාමයේ මේ පාරම්පරික කතෝලික සංස්කෘතිය භෞතික වශයෙන් මහ මුහුදෙන්ද, කලපුවෙන්ද, ආධ්‍යාත්මික වශයෙන් දෙව්මැඳුරෙන්ද, පියතුමාගෙන්ද, වර්ධනය වෙමින් පරම්පරාවෙන් පරම්පරාවට ගලාගෙන එයි. ඒවාගේම පෝෂණයද වෙයි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගමේ කතෝලිකයා නියම ක්‍රිස්තියානි කාරයෙකි. මධුවිත ටිකක් ගත්තත් අසැබි වචනයක් දෙඩුවත් සුළු ආරවුලක් ඇතිකර ගත්තත් ඔවුන් තමන්ගේ එකම කතෝලික විශ්වාසයේම සිටිති. මොන අන්දමේ ජීවිත ප්‍රශ්න පැමිණියත් ඔව්හු කිසිම දිනක දෙවියන් අත් හැරියේ නැත. වෙනත් ඇදහිලි පස්සේ වැටුනේ නැති අතර ආගම වෙනුවෙන් ඕනෑම කැපවීමකට ඔවුන් පසුබට වූයේද නැත.

**ආනන්ද රණවීර**
කැපුන්ගොඩ

# ඉපදුන නමුත් නොරැඳුන ජේසු බිළිඳු

## පින් පුරවමු අපි!

අහසට පැනලා තරු ඇහිඳිමු — අපි
වෙරළට දුවලා මුතු අමුනමු — අපි
කුඹුරට බැහැලා සහල් මනිමු — අපි
නත්තල දොරලඟ පින් පුරවමු — අපි

මී වද සොය සොය පැණි ගොටු — බඳිමු
අඹ දඹ රඹුටන් වෙරළුත් — කඩමු
මදු විත වෙනුවට ගී පොත — ගනිමු
නත්තල දොරලඟ අපි පින් — පුරමු

දකුණේ කිරි පැණි කද බැඳ — ගනිමු
යාපා පටුනෙන් තල් අල — ගෙනෙමු
තනිවුනු දරුවන් බිළිඳුන් — සොයමු
නත්තල දොරලඟ අපි පින් — පුරමු

නෙතේ කඳුළු බිඳු පිසදා — හරිමු
සිතේ සුසුම් පොදි ඉවතට — දමමු
වැරහැලි වෙනුවට රන්සළු — අඳිමු
නත්තල දොරලඟ අපි පින් — පුරමු

කුරුසිය අරගෙන දොර දොර — ඇවිදිමු
වෛරය වෙනුවට සාමය — පතුරමු
සමිඳුන් පා යුග වැඳ වැඳ — සිඹගමු
නත්තල දොරලඟ අපි පින් — පුරවමු

**ජෝයි මැල්කම් මහබදුගේ**

තාවත් කෙටි පණිවිඩයක් (sms)
ඒත් සුවිශේෂ පණිවිඩයක්....
ගැලවුම්කරුවාණෝ ආයෙත් එනවා....
එය පුදුම, ඒත් සතුටු ආරංචියක්....
කඩිමුඩියෙ ලකලෑස්ති වෙනවා...
"පුතේ, මේ සැරේ ජේසු බිලිඳා ඉපදිලා ඉන්නෙ කොහේද?"
අම්මා එහෙම ඇහැව්වා.....
"තානායමේ වෙන්න ඇති....."
මෙදා සැරේවත් ඉඩක් ලැබෙන්න ඇති."
මම කිව්වා......
"එහෙනම්........ ඔයිට වඩා හොඳ ඇඳුමක් ඇඳගත්තනම්...
මම අලුත් ඇඳුමක් ඇදගත්තා.
call එකක් දීලා Taxi එකක් Hire කරගත්තා.
තානායමට යනවිට මගේ දුප්පත්කම වහගෙන යන්න එපායැ.
තානායම් Gate එක ලඟ හොඳ welcome එකක්.
Recaption එක fantastic
Welcome Drink එක රසට වඩා ලස්සනයි.
ඔක්කම Dance කරනවා.
Drinks ගන්නවා.
play කරනවා.
මම Rooms වල, Verandar එකේ
ජේසු බිළිඳුන් සෙව් නමුත් තානායම තුළ
එතුමාණෝ නොමැති බව වැටහිණි.
අවසානයේ මා නැවතුනේ තානායමේ මුළුතැන්ගෙයි දොරටුව ලඟමයි.
විනෝද වුණා. වියදම් කළා.
මගේ ඇඳුම් ද නැති වී සුපුරුදු තත්ත්වයට වැටුණා
පසු දොරින් එළියට ආ මගේ
නෙත ගැටුනේ ගවලෙනකි
අනිවාර්යෙන්ම මෙවරද එතුමාගේ ගවලෙනද?
මම යුහුව ගවලෙන තුළට ගියද



එහි කිසිවෙක් නොවීය.
නමුත් තනිව දැවෙන පහනක්,
එහි ගව ඔරුවේ තිබෙනු දුටුවෙමි
මම ගවලෙනයෙන් එළියට ආවේ
පහනද අතැතිවය......
ගවලෙනෙන් එහා මා පුදුමකරවන
දසුනක් මා නෙත ගැටිණි...
එනම්.....
පැල්පත් සමුදායක්....
දිලිඳුන් පිරුණු තැනක්....
සරණය යදින ගමක්.....
ජේසුනී....... නත්තල එතැනද?
ඔබ ඉපදුනේ එතැන ද?
ඔබව මුණ ගැසෙන තුරු
මා ඔබ සොයන්නේ...
ගවලනයන් මා අත රැඳී
ඔබගේ ආලෝකයත් සමගය....

**ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු නිමනි පියතුමා**






# උතුම් වූ නත්තලක්

බෙත්ලෙහෙමේ ආනන්දය වගුරා
මිනිස් බව ලැබූ පොඩි දෙව් කුමරා
බැටළු එඬේරුන් රැන පිරිවරා
දිවැස්වැකිය ඉටු කෙරුවා සපුරා

සුවඳ ධූප රන් පුදලා සියතින්
දෙව් මිනිස් රජුන් බව සිත් සතොසින්
දිවැසින් තරු මෙන් දුටුවත් සැනෙකින්
ගියේ කුරිරු රජු හැර අන් මගෙකින්

මිසර දේශයට යන ලෙස සිහිනෙන්
අණ ලැබූ සැනෙකින් පුංචි කුමරුවන්
රැගෙන ගොසින් සුදු පවුලක් විලසින්
දිළිඳුව දිවි ගෙව්වා ලද පමණින්

දාවිත්ගේ පුත් පරමෝත්තම යින්
ප්‍රඥා මහිමෙන් කාය ශක්ති යෙන්
දේව ප්‍රසාදය නොමඳව ලබ මින්
ගුණ රුව නුවණින් වැඩුනා කුම රුන්

මරි මවගෙන් ගෝ හල තුළ ඉපදුන
බිළිඳුන් නමදින උතුම්ව සමරන
සැබෑ අරුත් ගුණ සුවඳත් විහිදන
උතුම් නත්තලක් පතමුව සැමදින

**මියුරියල් රීටා ප්‍රනාන්දු**
දඹදෙණිය

# සමිඳු උපන් දා

උඳුවප් මහට සීතල පිනි මුතු කැන්දූ
රිදියෙන් බර කළා අතු ඉති මන බැන්දූ
සුරලොව ගැයෙනවා ඉමිහිරි ගී සිංදු
පොළොවට වඩිනවා ගැලවීමේ සමිඳු

නපුර පිරුණ සිත් සෙනෙහෙ දකීවා
හිරුදුටු පිණි සේ දුක දුරු වේවා
සමිඳු උපන් දා මිහිර පිරේවා
සොම්නස අරගෙන නත්තල් ඒවා

**සුෂිල් රීටානි** - තල්විල

# පහන් කුළුණ

මගෙ දිවි මගෙහි සමිඳුනි අඳුර ගහණය
දිවියට සදාතන නැත කිසිදු සහනය
ඔබ මගෙ දිවිය අළු කළ පහන් කුළුණය
සහන් එළිය එහි මට සමිඳු සරණය

සමිඳූනි මගේ දිවියට බාධක එමටයි
දෙපා නගනු බැරි තරමට ගත දුබලයි
පැරදුම හා ගැරහුම නිති මගෙ අසළයි
මට ඇති එකම සරණය සමිඳුන් පමණයි

ඉසි-කෝ-මානයෙන් නිරතුරු හිත පැටලෙයි
සුව-සැප හමුවෙ අනුනගෙ මගෙ හද රිදවෙයි
මිතුරන් හැර ගොසිනි හද රජයන තනියයි
දිවමන් සමිඳ ඔබ මගෙ ලෝකෙට එළියයි

**විල්සන් රුද්‍රිගු** - නුංගමුගොඩ

# විමුත් මඟ

බෙත්ලෙහෙමේ ඈත අහසේ
අලුත් තරුවක් පායලා
දිළිඳු ගවහලක
සීතල හිම කැට වැටෙනා රෑ
පුත් කුමරකු ඉපදිලා

ඒ පුත් කුමරා
දිළින්දන්ට සුභ ආරංචියක්
පව්කරුවන්ට ගැලවීමත්
රෝගීන්ට සුව සහනයේ
බලාපොරොත්තුවත්
දෙවි පියාණන්ගේ උතුම් වූ
ප්‍රේමයත් රැගෙන

ඒ පුංචි ජේසු බිළිඳා
සීතල උඳුවප් මාසේ
මිනිස් අප අතරට ඇවිල්ලා....

**අජිත් ලක්මාල්** - කට්ටුව

# ජේසු අම්මෙ මේ අහන්න

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ දෑතට ජේසු රැගෙන
මගෙ හදවත තුළට එන්න
මුළු ලෝකෙම ශීත වුවත්
මගෙ හදවත උණුසුම් වේ
ඔබ දෙපළව භාර ගන්න
මරිය වසරෙ මිහිර ගන්න
මම නොසැලී බලා සිටිමි

**අයිරින් කොස්තා**
කළුඑළිය

# මෙදා නත්තලට...

බත නොඉදෙන පැලකට අපි බතක් අරන් යමු
වැරහැලි ඇඳි සොයුරෙකු වෙත වතක් අරන් දෙමු
දුකින් පෙළෙන කෙනෙකුගෙ සිත අපි සනසා ලමු
ඒ සියල්ල සමඟින් අපි ජේසු වෙතට යමු

දිළිඳු පැලක දිළිඳුන් හා බත් වේලක් කමු
තෑගි භෝග දී ඔවුන්ගෙ සිත් පුබුදා ලමු
ඔවුන්ගෙ දුක සැප නිරතුරු අපි විමසා ලමු
ඔවුන් සමඟ සිට ජේසුව සියැසින් දැක ගමු

ගවලෙන අපි දිළිඳු පැලට සමාන කර ලමු
එහි ඇති දුක් කඳුලැලි සැම අපේම කර ගමු
දිළිඳු බවේ අරුතක් ඇති බව තේරුම් ගමු
ජේසු කිව්ව සිතින් දිළිඳු බව සිහියට ගමු

**ඩබ්ලිව්. තිලක් ප්‍රනාන්දු**
කොරළවැල්ල

# නත්තලට

සොබාදම් දිනිතිය සළු පිළි හැඳගෙන හැඩ වැඩ වෙයි සුපුරුදු ලෙසට
උඳුවප් සීතල මද නල හමමින් රහසක් පවසයි මල් වලට
සමනළයින් සහ විහඟුන් ලස්සන දසුනක් මවනව නෙත් වෙතට
ලෝකෙම මංගල ආසිරි ගන්වා සූදානම් වෙයි නත්තලට

දෙදහස් දහතුන ජේසු බිළිඳුගේ උපන් දිනය එළඹෙන කලට
නත්තල කාලා දමන්න සමහරු දැන් දැන් සිට බැහැලා වැඩට
බෙල්ලෙන් එල්ලපු නත්තල් සීයල දහස් ගණන් ඈත මඟ දිගට
වෙළෙඳ ලෝකයම හැම වසරකදී විත කරනව මේ නත්තලට

සැමදා නත්තල් පවතින ලොකු අය කන බොන විට කෑදර කමට
දුප්පත් මිනිසුන් නත්තල් දාටත් බොන්නේ සීනියි තේ කහට
ඇති හැකි නැති බැරි සැම ජනතාවම යොමු කරවන සාමයෙ මඟට
ජීවිත ගමනේ සැබෑම වෙනසක් පතමු අපිත් මේ නත්තලට

**ඇන්ටනි රුද්‍රිගු** - යක්කඩුව

# නත්තල් සමරමු

සීත සුළං රැළි දස අත පැතිරෙයි - රන් තරු අහසේ බබළන්නේ
ගිනි මැලයක උණුසුම ලැබ ගනිමින් -බැටළු එඬේරුන් රැක ඉන්නේ
රැස් මාලා දස අත විහිදුවමින් - තරුවක් අහසේ දිස් වන්නේ
අමුතුම රහසක් ලොවට කියන බව -බැටළු එඬේරුන් සලකන්නේ

සගපුර සිට ආ දේව දූතයෙක් - බැටළු එඬේරුන් අමතන්නේ
නොබියව කන් දෙව් සියළු දනන් සිත් - තුටු වන පුවතකි පවසන්නේ
ගැලවුම්කරු වන ජේසු සමිඳු අද - බෙත්ලෙහෙමේ ඉපදී ඉන්නේ
තාන් රෙදි ඔතා ගව ඔරුවක ඒ - බිළිඳු කුමරු සතපා ඉන්නේ

මරිය තුමිය සහ ජුසේ තුමාවත් - ඔරුවේ සැතපූ දෙව් කුමරුන්වත්
දුටුවෝ ඉන් හැම තමන් දුටුව දේ - ගැන දෙවිඳුන් හට තුති පුද දෙත්
කිතුනු දනන් හැම නත්තල් සුපුවත -නන් අයුරින් ලොවටම පවසත්
සතුට පිරුණු නත්තලක් පතමු අපි -ලක් වැසි සැම වෙත පා බැති සිත්

**කේ. ඒ. ඇන්සල් පෙරේරා** - වැලිපැන්නගහමුල්ල

# නත්තල ළං වී

සීතල සුළං රැළි රහසක් මුමුනනවා
වැතල දිගේ සුදු පෙණ කැටි හිනැහෙනවා
ඊතල වගේ සිතුවිල්ලක් මතුවෙනවා
සීතල නත්තලේ මිහිරෙන් පිබිදෙනවා

උපතක අරුත ගවලෙනකින් ලොවට ගෙනා
අමතක නොවී පවතී අරුමයකි වනා
දහමක උතුම් සාමයෙ පණිවුඩය ගෙනා
තරුවක ලියා තිබුණා නිල් අහස දිනා

පහළ වැටුනු අය ඔසවන දෑත නැගෙයි
වහලක් නැති අයට සෙවනක් ලැබුනු වගයි
සහයෝගයෙන් සැම තුටුවන යුගය මෙයයි
මහ ගෙදරට සැවොම එක් වන දිනය ළඟයි

**ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්** - තලාව

# අනුහස

උත්තම කිතු සමිඳාණෝ මෙලොවට බිහිවූ දා
අහස පොළොව පෑයේ තෙද බලව් හි දා
අවිඳු අඳුරු රුදු නපුරෙන් ලොව පර දා
උපතම සැනසුමක් ගෙන දුනි කිතු සමි දා

මොක් මඟ සදන සෙත් මඟ අත් කර දෙමින
දුක් දොම්නසින් සත් වග දන මුදවමින
සාමෙන් ප්‍රේමයෙන් ඉඳිනට සම සිතින
විදහා පෑයේ කිතු සම්ප්‍රාප්තියේ අනුහසින

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත

# නත්තලේ උරුමය

රූප පෙට්ටියෙයි, ගුවන් පෙට්ටියෙයි
සද්දෙට ඇහුනාට
නත්තල් උරුමය - කොහෙද ඇත්තේ
පාට පාට රෙදි
කෙළි සෙල්ලම් බඩු
ඒවා ගන්නට
නැති බැරි උන් හට
කාසි කොයින්දෝ
කෑමට, බීමට රිසි සේ
දිළිඳු දනන් හට
තහනම් වාගෙයි මේවා
බඩු මිල දුටුවම හිතේ ඇති දුක
බිළිඳු ජේසු හට
කියම් ද කෙලෙසට
අහෝ සමිඳුනි
මට නම් කම් නැත
එහෙත් !
අවිහිංසක දූ දරුවන් හට
කුමක් කියන්නද?
කුමක් දෙසන්න ද?
ජේසු බිළිඳු ගැන කියලා
දෙන්නෙම් ඔවුනට සිත පහදා ගන්නට

**ජූඩ්. ජේ. ප්‍රනාන්දු**
ගෙලිඔය

# ගවහලේ නත්තල

වීදි කඩපිලේ
ගුලි වී නිදනා
දුගී අසරණයින්
ළඟ
ජේසු බිළිඳු
ඉපදී
අසිරිමත් නත්තල
උදා වීලා....
එනමුත් ඇයිද
කිසිවකුගේ
නෙත නොගැටුණේ

**ඇම්.ඩබ්. අනුර**
**ශාන්ත පීරිස්**
හලාවත



# මෙදා නත්තලේදීවත්

මහා මන්දිර සඳලු තලවල
යස ඉසුරු පිරිවරා
රස බොජුන් වළඳමින් සිටින
පොහොසතුන් අහලකට
ඉඩක් නැහැ එන්න දුගියෙකුට....
ඔවුන්ගේ හදවත් හිස් නිසා...
දුගී බවේ පතුලටම යටව
පැල්පතක විසුවත්
කරුණා දියෙන් නැහැවුන
මිනිසත් බවින් පිරිපුන්
දුගියකුගෙ නිවහනක
ඉඩක් ඇත තවත් අයෙකුට
ඔවුන්ගෙ හදවත් පොහොසත් නිසා....
දෙවිඳු ජීවත් කළ දහම් පාඩම
මෙදා නත්තලේදීවත් වටහා ගන්නට
ඉඩක් දෙමු හදවත් තුළට

**ඇග්නස් සියඹලාපිටිය**
කටුවපිටිය



# සාමයේ මිහිරියාව

පවුබරයි මිනිසුනගේ
සිත් මඬල ජේසුනේ
ධන බලය තණ්හාව
පොදි බඳියි නිති දිනේ

නෑ කිසිදු තුටු සිතක්
අන් අය කෙරේ
මමත්වය ඉතිරිලා
ගලනවා සැම තැනේ

ඇහැම් සිතින් අන් අයට
පිළිසරණය වන්න හැකිවිට
දයා, කරුණා, සිතින ඉන්නට
නොමැති දෝ වෙලාවක් මිනිසුනට

ලද පණිවුඩය ලෝ සත සැමට
සාමයේ මිහිරියාව පතුරාලන්ට
සැම සතම පවුබරින් ගලවා ගන්ට
කුමරකු උපන්නයි මිහිමතට

**ශීලා රණසිංහ**



# නත්තල නව යුගයක උදාවයි

## මරිමව් තුළින් බිළිඳු සොයා යමු

බෙත්ලෙහෙමේ ගවඔරුවේ ජේසු කුමරාගේ උපත නව යුගයක උදාවයි. බුද්ධ වර්ෂ ලෙස ගෙවුනු කාලය උන්වහන්සේගේ උපත සමග ක්‍රිස්තු වර්ෂ බවට පරිවර්තනය විය. එතුමාණන්ගේ ඉගැන්වීම එබැවින් කිතුනු අපට පමණක් නොව මුළු ලෝකයම වෙනස් කිරීමට හේතු විය.

කිතුනු උපත තවත් බිළිඳෙකුගේ උපතට වඩා එය ලෝක ගැළවුම්කරුවාගේ උපත විය. නව යුගයේ ආරම්භය ගාබ්‍රියෙල් දේවදූතයා විසින් දෙව් මව්ට මංගලම් කීමේ සිද්ධිය තුළින් නව ගිවිසුම තුළ ආරම්භ වේ.

"මරියාවෙනි බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගේ වරප්‍රසාද ලද්දෙහිය. ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහිය. උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න." (ලූක් 1:30-31)

සහෝදරයා විසින් තම සහෝදරයාව මරා දමා මනුෂ්‍යත්වය කෙලෙසී තිබූ යුගයක, ජේසු සමිඳුන් ලෝකයට පැමිණ නව යුගයක් උදා කළසේක.

"මිහිපිට මිනිසාගේ ඇඩි දුෂ්ඨකම හා මිනිසා නිතරම නපුරු සිතුවිල්ලෙන් කල් යවන බව දුටු විට මිහිපිට මිනිසා මැවීම ගැන උන්වහන්සේ ශෝක වූ සේක. (උත්පත්ති 6:5-6)

"අපි එළිමහනේ කෙතට යමු කියා මෙසේ ඔවුන් ගිය විට කායින් සිය සොයුරු ආබෙල්ට විරුද්ධව නැගී සිට ඔහු මරා දැමීය (උත්පත්ති 4:8).

ජේසු සමිඳාණන් නව උදාවක ආරම්භය ලෙස උන්වහන්සේගේ උපතේදීම එය අපට දැක බලා ගත හැකිවිය. උපත සිදුවූයේ එදා සාමාන්‍ය දරු උපතක් සිදුවිය හැකි ස්ථානයක නොවේ. ඒ උපත පළමුව දන්වන ලද්දේද සමාජයෙන් කොන්වූ ජනතාවටයි. ඒ මංගල පුවත මුළු ලෝකයටම සාමයේ පණිවිඩයක් විය.

"ඈ කුළුදුල් පුත්‍රයා බිහිකොට රෙදිවලින් ඔතා තානායමෙහි ඉඩ කඩ නොතිබුනු බැවින් ගව ඔරුවක තැබුවාය" (ලූක් 2:6-7).

"බිය නොවන්න මෙන්න සකල ජනයා හට මංගල පුවතක් මම ඔබ වෙත ගෙනෙමි. මක්නිසාද ස්වාමීන් වන ක්‍රිස්තුස් නම් ගැලවුම්කරුවාණන් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නෙහිය" (ලූක් 2:10-11).

ජේසු සමිඳුන්ගේ නව ඉගැන්වීම එදා සිටි බොහෝ දෙනෙකුට අභියෝගයක් විය. පරිසිවරු, ලේකම්වරු ඇතුළු නායක පූජකයන්ට දිරෙව්වේ නැත. එතුමාගේ නව ලෝකයේ දුප්පතුන්ට අසරණ වූවන්ට. කොන්වූවන්ට. පවුකාරයන්ට, තැනක් තිබුනා පමණක් නොව ඔවුන්ගේ පැවැත්ම වෙනස් කර ගැනීමම මහ ආශිර්වාදයක් හා සුවයක් විය. එතුමානෝ එදා පවුකාරයන් ලෙස නායකයන් හංවඩු ගසා සිටි අයව ඒ ලෝකයෙන් එළියට ගෙනඒමට පහන් රුකක් විය. ලෙවී නමැති අයකැමියාගේ ගෙදර කෑමට ගිය සේක.

"ඉක්බිති උන්වහන්සේ නික්ම ගොස් ලෙවී නම් අයකැමියකු බදුපොලේ හිඳිනු දැක මා අනුව එන්නැයි වදාළසේක" (ලූක් 5:27).

එසේම කන්ද උඩ දේශනාව මගින් නව මාර්ග යක් පෙන්වූසේක. "දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍ය ඔබගේය." "දැන් සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝය. මන්ද ඔබ තෘප්තියට පත්වනු ඇත."

"දැන් කඳුළු හෙලන ඔබ භාග්‍යවන්තයෝය. මන්ද ඔබ සිනාසෙනු ඇත" (ලූක් 6:20-21).

නව උදාව ලෝකට අභියෝගයක් ලෙස පසක් කළේ "ඔබ ඔබට මෙන් අසල්වැසියාට ප්‍රේම කරන්න" යන දේව ආඥාව පහදා දෙමින් එය තම ජීවිතයෙන් පෙන්වා දෙමිනි අප අපටම ප්‍රේම කරන්නා සේ තවත් කෙනෙකුට ප්‍රේම කිරීමට මනුෂ්‍යයකුට අපහසු කාර්යයකි.

"එසේම මම යම් මිම්මකින් මැන දෙනවාද? ඒ මිම්මෙන්ම ආපසු ලැබෙන බව ඉගැන්වූවා. අනුන් විනිශ්චය නොකරන්න එවිට ඔබත් විනිශ්චය කරනු නොලැබේ. ඔබ යම් මිම්මකින් මැන දෙනවාද ඒ මිම්මෙන්ම ඔබටත් ආපසු ලැබේ" (ලූක් 6:37-38).

එතුමාණන් ප්‍රේම කිරිම තමන්ට වෛර කරන අයට ප්‍රති උපකාරයක් ලෙස දීමට කියා දෙමින් එසේ කළ හැකිදැයි තම ජීවිත සාක්ෂිය තුළින් පෙන්වා දුන්සේක.

"නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න. සතුරාට වෛර කරන්නදැයි ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. ඔබේ සතුරාට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. ඔබ මෙන් ස්වර්ගයේ වැඩ වසන ඔබගේ පියාණන් වහන්සේ..... වන්නාහුය (මතෙව් 5:43-45).

ජීවිතයේ සැබෑ උතුම්කම ඉගැන්වීමට හා සදාතනික වටිනාකම් කියා දීමට එතුමාණෝ ප්‍රකාශ කළේ බාලයකු තමා වෙතට කැඳවා සැබවින්ම මම ඔබට කියමි. ඔබ වෙනස් වී කුඩා දරුවකු මෙන් නොවුනහොත් කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නේය. එබැවින් මේ කුඩා දරුවා මෙන් යටහත් වෙන යමෙක් ඇද්ද ස්වර්ග යෙහි ඉතාම උතුම් වන්නේ ඔහුය. තවද යමෙක් මාගේ නාමයෙන් මෙවැනි කුඩා දරුවකු පිළිගන්නේද ඔහු මා පිළිගන්නේය (මතෙව් 17:2-6).

එතුමානෝ නව උදාවේ සිටි මිතුරෝ රාජ කුමාරවරු විවිධ දේශවල බලවතුන් ධනවතුන් නොව දිළිඳු මසුන් මරන්නෝය.

ජේසුස් වහන්සේ කථා කරමින් බිය නොවන්න. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැයි වදාළ සේක. ඔවුහු තමන්ගේ ඔරු වෙරළට ඇද ඒ සියල්ල හැර දමා උන්වහන්සේ අනුව ගියහ (ලූක් 4:10-11).

මනුෂ්‍යයින්ව තේරුම්ගෙන සැබෑ මනුෂ්‍යයකු ලෙස කටයුතු කළ එතුමාණෝ සම්ප්‍රදායට වඩා මනුෂ්‍යයකු සතු සැබෑ අවශ්‍යතාවය තේරුම්ගෙන එයට ප්‍රතිචාරය දැක්වීය.

උන්වහන්සේ කථා කරමින් "මෙය පිහිටුවන ලද්දේ මිනිසා උදෙසාය. මිනිසා..... උදෙසා නොවේ" (මාර්ක් 2:27-28).

මිනිසා දෙවියන් වහන්සේගේ සමානකමට මවන ලද බැවින් සෑම මිනිසාටම මූලික සමාන කමක් ඇත. මනුෂ්‍යයින් සියළු දෙනාම සහෝදර සහෝදරියන්ය. දෙවියන් වහන්සේ ඉදිරියේ සියළු මනුෂ්‍යයෝ සමාන වන අතර බලය, තත්ත්වය, ධනය,කුලය යනාදිය සමාජය විනාශය කරන බලවේගයන් අභිබවා යන නව ලොවක් උදාව ගැන උගන්වන ලදී.



ඇසට ඇසය, දතට දතය යන නීතිය වෙනුවට දයාව හා කරුණාව දැත් දිගුකිරීමේ නව මගක් පහදා දුනි.

"ඇසට ඇසය, දතට දතය" යන කීම ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි එදිරිකාරයාට විරුද්ධව එකට එක නොකරන්න. යමෙකු ඔබේ දකුණු කම්මුලට ගැසුවොත් ඔබේ අනික් කම්මුලද හරවන්න (මතෙව් 6:39).

### ගරු පැට්‍රික් පෙරේරා පියතුමා

විවාහ ජීවිතයේ ගැඹුරු ආදරණීය බැඳීම ගැන එකතු කළේ එක මිනිහෙක් හා ගැහැනියක් අතර තිබිය යුතු අඹුසැමි සබැඳියාවයි.

"දෙවියන් එක්කළ දෙය මනුෂ්‍යයින් විසින් වෙන් නොකෙරේවා" යනුවෙන් විවාහක ගිවිසුමේ ශුද්ධවන්ත බව සවිශක්තිමත් කරන ලදී. එකල පැවති බහු විවාහ ක්‍රමය තුළ පැවති වැරදි ආකල්ප වෙනස් කොට විවාහ ජීවිතයේ ශුද්ධවන්ත බව හා විවාහ ජීවිතයේ දේව කැඳවීම ගැන පහදා දුනි.

ජේසු සමිඳුගේ උපත සැබවින්ම නව ලොවක ආරම්භයක් විය. සමාජයේ විශාල වෙනසක් ඇති කිරීමට හේතුවිය. එදා පරිසිවරු උදහස්ව අපහාස කළේ විරුද්ධ වූයේ එදා සමාජයේ අසාධාරණ, අයුක්ති සහගත, මනුෂ්‍යයින් තලා පෙලන නායකයන්ට, සමාජ පාලනයට එරෙහිවු නිසාය. "මොහු අපේ ජාතිය කැරළිගැසීමට පොළඹවන බවත්, අධිරාජයාට අයබදු දීම තහනම් කරන බවත් තමා ක්‍රිස්තුස් නම් රජෙක් යයි කියා ගන්නා බවත් අපි දැනගතිමුයි කීය (ලූක් 23:1-2).

ජේසු සමිඳුගේ උත්ථානයෙන් පසුව මෙම නව පණිවුඩය මිනිසුන් අතර මුල්බැස ගත්තා පමණක් නොව තම ගෝලයින් විසින් තම ජීවිතය පරදුවට තබා එම නව ජීවිතය දේශනා කළහ. සකල ලෝකයටම එම පණිවිඩය ගෙනයාම සමිඳුන්ගේ අභිප්‍රාය විය.

"එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ගෝලයින් කර පියාණන්ගේද, පුත්‍රයාණන්ගේද, ශුද්ධාත්මයාණන්ගේ නාමයෙන් ඔවුන්ව බව්තිස්ම ස්නාපනය කරන්න." මෙම නව දහම එලදැරු අයුරු අපේ සභා ඉතිහාසය මැනවින් පෙන්වා දෙයි. සභාව තුළ බිහිවී ඇති ප්‍රාණපරිත්‍යාගි වරුන්ගේ ජීවිත අපට සැබෑ සාක්ෂියකි.

ජේසු සමිඳුන්ගේ ඉගැන්වීම තුළ එදා සමාජය අලුත් පණක් ලැබුවාසේ වර්තමාන කතෝලික සභාව තම කාර්යය ඉටුකිරීමට බැඳී සිටී.

දෙවන වතිකාන කතිකාවේ ඉගැන්වීම් අධ්‍යයනය කරන විට මෙම උතුම් දහම් අපි කෙසේ නව පරපුරට දිය යුතුද යන්න පැහැදිලි ඉගැන්වීමක් කරනු ලැබේ. ඒ බව කතිකාවේ ශු. සභාව (Lumen) පිළිබඳ ප්‍රකාශයන්හි මෙසේ සඳහන් කරනු ලැබේ.

කතෝලික සභාව යනු ක්‍රිස්තු තුමන් මගින් දෙවියන්වහන්සේ හා මිනිසා අතර සබඳතාවයන් ඇති කිරීමේ උපකරණයයි. මිනිසුන් අතර ඒකීය භාවයක් හෙවත් එකමුතුකමක් ගොඩනැගීමට ක්‍රියා කිරීම කතෝලික සභාව අද කළයුතු ප්‍රධාන කාර්යයයි. (LG 01)

නව ජීවනය ඔස්සේ අතීතයේ මෙන්ම නව සභා එඬේරුන් විසින් එම දහම තුළ ජනතාව ජීවත් කිරීම සඳහා විවිධ ඉගැන්වීම් හා ක්‍රම වේදයන් තුළින් තම එඬේරික කාර්යය ඉටු කරනු ලැබේ. ලෝක සාමය උදෙසා (Pacem in Terris) 23 වන ජුවාම් සුදතුම් පියාණන් වහන්සේ මිනිසා සතු අයිතිවාසිකම් වලට ගරු කිරීම යුක්තිය සාධාරණය ඉටු කරනවිට සාමය ඇතිවන ආකාරයයි. (P.T1/1)

තවද මිනිසාගේ වගකීම හා වැඩ කිරීම පිළිබඳ කම්කරු අයිතීන් පිළිබඳ කථා කරන ස්වර්ගස්ථවූ 13 වන ලියෝ සුදතුම් පියාගේ අදහස බැවින් මිනිස් ශ්‍රමය යනු යන්ත්‍ර සූස්ත්‍රවලින් නිපදවන බලයක් නොව මිනිසාගේ දහඩිය මහන්සිය රැඳී පවතින බැවින් එහි අගය මිල කළ නොහැක. (Rerum Nouarum - නො. 13)

වර්තමානයේ අප සුදතුම් පියාණන් වන ෆ්‍රැන්සිස් එඬේරාණෝ තමාට පෙර සිටි සභා එඬේරුන් සමග යමින් සභා එඬේරුන් නිතරම ජනතාවගේ දහඩිය සුවඳ වෙමින් නව මගකට සභාව යොමුකරන්නේ අපගේ දිව්‍ය නව දැක්ම තුළිනි.

එසේ හෙයින් නත්තල සැබවින්ම නව යුගයක උදාව ලෙස සලකා අලුත් වීමක් නැවුම් වීමක් පෞද්ගලිකවද පවුලක් ලෙසද සභාවක් ලෙස ද කටයුතු කිරීමට උත්සාහ කරමු.

***ඔබ සැමට සුබ නත්තලක් හා නව වසරක් වේවා.***

## දිළින්දන් දේව රාජ්‍යයට.....

05 පිටුවෙන්...

ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්ටත් මා එවා වදාළ සේක." (ශු. ලූක් 4:18-19)

දෙවියන් වහන්සේ විසින් මවන ලද ලෝකයේ සියළු ධන සම්පත් වස්තූන් සියල්ලේ සැබෑ හිමිකරුවා වන්නේ ද උන්වහන්සේය. සියළු සම්පත් සියළු මනුෂ්‍යයන්ට සම අයිතියක් වන සේ බෙදා ගෙන ජීවත් වීම කිතු දහමය. නමුත් අද ධන සම්පතේ හා භූමියේ ආධිපත්‍යය බලවතුන් විසින් තමන් සතු කරගැනීම නිසා බහුතර දේව ජනතාවක් වරප්‍රසාද, දේපල, ධනය හා වස්තූන් අහිමි දිළින්දන් පීඩිතයන් නැති බරි මිනිසුන් වී පීඩනයට පත්ව සිටින්නෝ ය. දෙවියන් වහන්සේ මේ තත්ත්වය දැකීම නිසා උන්වහන්සේ කිතු සමිඳුන් මෙලොවට එවීමට වරප්‍රසාද ලත් පංතිය ඉවත් කර දිළින්දන්ගේ පැත්ත ගත් සේක.

ඒ අනුව සියළු ධන සම්පත් සියල්ල දිළින්දන් සමඟ බෙදා හදා ගන්නා අයට පමණක් දේව රාජ්‍ය ලැබෙන බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක. අවසන් විනිශ්චය දිනේ දී ඇති නති පරතරය හා ඇති හැකි පරතරය අනුව දේව රාජ්‍යයේ විමුක්තිය උරුම වන බවත් දේව වාක්‍යයේ සඳහන් වන්නේ ය. නමුත් මෙම සැබෑ කිතුනු දැක්ම ශුද්ධවු සභාව තුළ ශුද්ධවු දේව ජනතාව තුළත් මාංශගත වී නොමැත්තේ ය. විනාශය එනතුරු ඔවුන් කමින් බොමින් නටමින් නැති බැරි වූවන්, පීඩිතයන් පාගා දමමින් මෙලොව රාජ්‍යයක් ගොඩනැග ීමට උත්සාහ කරන්නේ ය.

දේව වචනය තුළ ජීවත් නොවන කිසිවකුට දේව රාජ්‍ය කිසිදාක උරුම නොවන්නේ ය. අප සතු සියල්ල හෝ නැති බැරි අය සමඟ බෙදා හදා ග ැනීමට, සියල්ල හිස් කර ගැනීමට අතිශය දුෂ්කර වේදනාකාරී ස්වර්ගීය වන්දනා ගමනකට උන්වහන්සේ අපට ආරාධනා කරන සේක. උන්වහන්සේගේ දේවත්වයේ ප්‍රසිද්ධ ජීවිතයේ දී උන්වහන්සේ වදාළ ශ්‍රී වාක්‍ය අප ජීවිත තුළ ක්‍රියාත්මක නොවුවහොත් සදාකාලික නිරාගින්න අපට හිමිවනු ස්ථිරය.

උන්වහන්සේ ප්‍රකාශ කළ මෙම දිව්‍යමය වදන් තුළ ඔබේ දිවි මඟ සම්පූර්ණයෙන්ම මෙම දිළිඳු කිතු උපත සමරමින් ගොඩනැගිය හැකිදැයි විමර්ශනය කර බලන්න. "දෙවියන් වහන්සේටත් වස්තුවටත් සේවය කරන්නට ඔබට බැරිය" (ශු. ලූක් 15-13) "මම ඔබට කියමි, ආරාධිතයන් අතරින් එක්කෙනෙක්වත් මාගේ මංගල භෝජනයේ රස නොබලන්නේය" (ශු. ලූක් 14:22) "මෙන්න දැන් අන්තිමයන්ව සිටින සමහරු ප්‍රථමයෝ ද, දැන් ප්‍රථමයන්ව සිටින සමහරු අන්තිමයෝ ද වන්නෝ ය." (ශු. ලූක් 13:30). "එසේ නොව, උන්වහන්සේගේ රාජ්‍යය සොයන්න. එවිට මේ දේවල් ද ඔබට දෙනු ලැබේ" (ශු. ලූක් 12:13)

අද අපේ කිතුනු ලෝකය තුළත්, අපේ මීසම් තුළත් සැබෑ කිතු දහම ක්‍රියාත්මක වන්නේ ද, විවිධ වත් පිළිවෙත්, ශුද්ධවර වන්දනා, පෙරහරවල්, වන්දනා ගමන්, ශුද්ධවු පැය පොත පමණක් කිතු දහම ලෙස අදහන්නෝ දේව රාජ්‍යයේ සැබෑ උරුමකරුවෝ වන්නේ කෙසේ ද? නැතිබැරි පීඩිතයන් සූරා කමින්, මුදල් අධික ගිනි ගණනින් පොලියට දී අවසානයේ ඔවුන් උගසට තැබූ ඉඩම් අල්ලා ගනිමින්, මහා පරිමාණයේ තමන් සතු ඉඩම් වලින් අඟලක් දිළින්දෙකුට පරිත්‍යාගි නොකරන කිතුනු බලවතුන් දේවස්ථාන ගොඩනඟන්න, පිළිසකර කරන්න ශුද්ධවර පිළිම ගොඩ නගන්න ලක්ෂ ගණනින් වියදම් කරති. තමන් නම ප්‍රසිද්ධියේ කියවා ගන්න කැමති පල්ලියේ බලකනු අප අතර එමටය. "ජේසුස් වහන්සේ ඒ දැක ධනවතුන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යය ට ඇතුළුවීමට කොතරම් දුෂ්කර ද? ධනවතකුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමට වඩා ඔටුවකුට ඉඳිකටු මලින් රිංගා යාම පහසු යයි වදාළ සේක (ශු. ලූක් 18:24-25).

අපේ ජීවිතයේ දී අපට කළ නොහැකි අප අකැමැති දෙය බැහැපත් වීමය. නමුත් දේව රාජ්‍යයේ උරුමය ලබන්න අවශ්‍යමය දේ බැහැපත් වීමය. "රාත්‍රි භෝජනයෙන් පසු උන්වහන්සේ නැගිට උතුරු සළුව ගලවා තුවායක් ගෙන ඉඟවට බැඳගත් සේක. ඉන්පසු උන්වහන්සේ භාජනයකට වතුර වත්කොට ශ්‍රාවකයන්ගේ පාද සෝදන්ටත් තමන් ඉණ බැඳ ගෙන සිටි තුවායෙන් පිස දමන්ටත් පටන් ගත් සේක. (ශු. යොහාන් 12:4-5)

"මට සවන් දෙන බව මෙසේ කියමි. ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට වෛර කරන්නන්ට යහපත කරන්න. ඔබට සාප කරන්නනට සෙත් පතන්න. ඔබට ගැරහුම් කරන්නන් උදෙසා යාච්ඤා කරන්න." (ශු. ලූක් 6:27-28). "ධනය සම්පත යැයි සිතන සැමට උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ, අහෝ! ධනවත් ඔබට වන විපතක මහත, අහෝ! දැන් සිනාසෙන ඔබට වන විපතක මහත, ඔබ හඬා වැළපෙනු ඇත" (ශු. ලූක් 24:25)

අපේ ජීවිත ගැන පසුතැවෙන, වේදනා විඳින සැමට උන්වහන්සේ මෙසේ කියන්නේ ය "එකල උන්වහන්සේ සිය ශ්‍රාවකයන් දෙස බලා මෙසේ වදාළ සේක. දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍ය ඔබගේය. දැන් සාගිනි ඇත්තෝ භාග ්‍යවන්තයෝය මන්ද ඔබ තෘප්තිමත් වනු ඇත. දැන් කඳුළු හෙලන ඔබ භාග ්‍යවන්තයෝ ය. ඔබ සිනාසෙනු ඇත." (ශු. ලූක් 6:20-21)

වත් පිළිවෙත් පුද පූජා පමාණක් කිතු දහම ලෙස උගන්වන අයටත් ක්‍රියාත්මක කරන අයටත් උන්වහන්සේ මෙසේ වදාරන සේක. "පඬුර පූජාසනයේ ඉදිරියේ තබා ගොස් පළමු කොට සහෝදරයා හා සමගි වී පසුව අවුත් පඬුර පුදන්න. (ශු. මතෙව් 5-4)

ගවහලට නොගොස් දේව රාජ්‍යයට පිවිසිය නොහැකිය. මහ මැදුරෙන් බිමට බැස දේව රාජ්‍යයට යන පාර සොයන්න. "එහෙත් ජීවනයට යන පාර පටුය. පාරද අවහිරය. එය සොයන්නෝ ස්වල්ප දෙනෙක් පමණි. (ශු. මතෙව් 7:1).




## නත්තල් බැති ගී තරගය

තරංගමාලා 91.7-91.9 ඔස්සේ ස්වදේශීය සේවයෙන්

ගත්කතුවරයකු, පුවත්පත් සහ ගුවන් විදුලි මාධ්‍යවේදියකුවු කේ. ප්‍රැන්සිස් මහතා අනුස්මරණය කරමින්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කිතුනු උපදේශක සභාවේ මෙහෙයවීම මත දීපව්‍යාප්ත තරගයකින් තෝරාගත් සිංහල හා දමිළ බැති ගී කණ්ඩායම් ගී ගයන, නත්තල් බැති ගී තරගයේ අවසාන වටය හා ප්‍රසංගය අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දෙසැම්බර් 26 වන දින ප.ව. 2.30 සිට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සිහංල ස්වදේශීය සේවය ඔස්සේ සජීවීව ප්‍රචාරය වේ. නත්තල් බැති ගී තරගය ජූඩ් අයිවන්ගේ නිෂ්පාදනයකි.

## හලාවත රජතුන්කට්ටුව

මිහිඳුකුලසූරිය පැන්ටලියන් කුරුකුලආරච්චි ගුරු දේවයාණන් විසින් රචනා කොට නිෂ්පාදය කළ 'රජතුන්කට්ටුව නාඩගමේ', ගුවන් විදුලි සංරක්ෂණ පිටපත, දෙසැම්බර් 26 වනදා පෙ.ව. 10.00-11.00 දක්වා සිංහල ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය වේ. එහි ගුවන් විදුලි නිෂ්පාදය කේ. ප්‍රැන්සිස් මහතාය.

## විමුක්තියේ උපත

කිතු උපතින් සිරිලක එකළු කළ දැයේ අධ්‍යාපනය, සංස්කෘතිය, කලාශිල්ප මෙන්ම දැය උදෙසාද අසල්වැසියා උදෙසාද අප සතු වගකීම් සිහි කොට දෙන විමුක්තියේ උපත නත්තල් සජීවි වැඩ සටහන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල ස්වදේශීය සේවය ඔස්සේ දෙසැම්බර් 25 වන දා, නත්තල් දා පෙ.ව. 9.00 සිට 12.30 දක්වා ප්‍රචාරය වේ. දුරකථනය ඔස්සේ ඔබටද සජීවිව එක්විය හැකිය. නිෂ්පාදනය ජූඩ් අයිවන්.

## නත්තල මුවදොර රටවටා නත්තල්

මාතර, මහනුවර, යාපනය, අනුරාධපුරය සහ හලාවත යන ප්‍රදේශ ආවරණයවන පරිදි, පවුල හා බැදුනු නත්තලේ කතන්දරය, නත්තල් උරුමය සිරිලක වැපුරූ භාග්‍යවත් ජුසේ වාස් පිය චරිතය, සාමයේ නව සිතුවිලි, කිතුනු අධ්‍යාපනය හා සංස්කෘතිය පිළිබඳ තොරතුරු රැගෙන, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ඉදිරිපත් කරන 'නත්තල මුවදොර - රටවටා නත්තල්' වැඩ සටහන දෙසැම්බර් 23 වනදා රාත්‍රී 7.00-11.00 දක්වා සිංහල ස්වදේශීය සේවය ඔස්සේ සජීවීව ප්‍රචාරය වේ. රටවටා නත්තල් ජූඩ් අයිවන්ගේ නිෂ්පාදනයකි.

## සාහිත්‍යයෙන් ජීවිතය රසවිඳිමු

ජූඩ් අයිවන් මහතාගේ සම්පත් දායකත්වයෙන්, සුමනා අබේසිංහ නිෂ්පාදනය කරන 'සාහිත්‍යයෙන් ජීවිතය රසවිඳිමු' වැඩ සටහනින් දෙසැම්බර් 23 වන දා ප.ව. 3.00-4.00 දක්වා කොන්ස්තන්තීනු හටන් කාව්‍යයේ සිට මේ දක්වා වන කිතුනු ගීත සාහිත්‍ය පිළිබඳ විවරණයක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයෙන් ඔබ වෙත තිළිණ කෙරේ. කොන්ස්තන්තීනු හටනේ කවි ගායනය සුභාෂිණී සුබසේන.

**ලබන සතියේ ප්‍රදීපය පළ නොවේ**

නත්තල් නිවාඩුව නිමිත්තෙන් දෙසැම්බර් 29 ඉරිදා ඥානාර්ථ ප්‍රදීපය පළ නොවේ. මීළඟ ප්‍රදීපය 2014 ජනවාරි 05 වැනිදා නිකුත්වේ. දෙසැම්බර් 20 වැනිදා නත්තල් නිවාඩුවට ආයතනය වසා දමා දෙසැම්බර් 30 වැනිදා යළි විවෘතවේ.

## ජාතික රූපවාහිනියේ නත්තල් වැඩසටහන්

දෙසැ. 21 සෙනසුරාදා පෙ.ව. 8.00 ශනිදා ආයුබෝවන් (අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි සමග ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා සහභාගි වෙති.

පෙ.ව. 10.00 මාවත වැඩසටහන - විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් සමග ගරු කැමිලස් ප්‍රනාන්දු පියතුමා සහභාගි වෙති.

ප.ව. 1.00 It's nearly Wasn't Christmas (නත්තල් චිත්‍රපටය)

23 - සඳුදා ප.ව. 6.00 ගී සර වෑහෙන නත්තල (සංගීත වැඩසටහන)

24 - අඟහරුවාදා ප.ව. 1.00 - ප.ව. 1.55 හිරු වියන (නත්තල් වැඩසටහන)

රාත්‍රි 10.00-11.45 - මා (නත්තල් සංගීත වැඩසටහන)

රාත්‍රි 11.45 සිට පසුදා (නත්තල් දින) පෙ.ව. 1.30 දක්වා - මධ්‍යම රාත්‍රී නත්තල් දේව මෙහෙය (කතෝලික) වත්තල සා. ආනා දේවස්ථානයේ සිට (සජීවි විකාශය)

2013.12.25 - බදාදා (නත්තල් දිනය) පෙ.ව. 5.40 - නත්තල් දින කෙටි පණිවුඩ (ක්‍රිස්තියානි) - පෙ.ව. 7.52 - නත්තල් දින කෙටි පණිවුඩ (කතෝලික) - පෙ.ව. 8.00-පෙ.ව. 11.28 - නුග සෙවණ (නත්තල් වැඩසටහන), පෙ.ව. 11.28 නත්තල් දින කෙටි පණිවුඩ (කතෝලික) - පෙ.ව. 11.30 - නත්තල් සාකච්ඡාමය වැඩසටහන (ක්‍රිස්තියානි) - පෙ.ව. 11.58 - නත්තල් දින කෙටි පණිවුඩ (ක්‍රිස්තියානි) - මධ්‍යාහ්න 12.00 - නත්තල් සංගීත වැඩසටහන (කතෝලික) - 22, ප.ව. 12.27 - නත්තල් දින කෙටි පණිවුඩ (ක්‍රිස්තියානි) - ප.ව. 12.57 - නත්තල් දින කෙටි පණිවුඩ (කතෝලික) ප.ව. 1.00 - ප.ව. 2.55 - නත්තල් චිත්‍රපටය, ප.ව. 3.00 - නත්තල් දේව මෙහෙය (ක්‍රිස්තියානි) - ප.ව. 4.00 - නත්තල් කැරොල් - අනුග්‍රහය : ලංකා බැංකුව - ප.ව. 4.30 - නත්තල් දින කෙටි පණිවුඩ (කතෝලික) - ප.ව. 4.35 - නත්තල් දින කෙටි පණිවුඩ (ක්‍රිස්තියානි) - ප.ව. 4.40 - ශුද්ධවූ පාප් වහන්සේගේ නත්තල් දින පණිවුඩය - ප.ව. 5.00 - තිත්තයි මේ බත් - නත්තල් ටෙලි නාට්‍යය අනුග්‍රහය : මහා බැංකුව - රාත්‍රී 8.30 - නත්තල් ටෙලි නාට්‍යය නිෂ්පාදක - විජිත මංජුල සිංහපෘථිවි, රාත්‍රී 10.10 - මධ්‍යම රාත්‍රී 12.00 - ත්‍රී තාල් (නත්තල් වැඩසටහන)

2013.12.26 - බ්‍රහස්පතින්දා - ප.ව. 2.30 - නත්තල් සාකච්ඡාමය වැඩසටහන (කතෝලික) - ප.ව. 3.00 - නත්තල් සංගීත වැඩසටහන (ක්‍රිස්තියානි)

## ගොන්සාල්වෙස් පිය රූපවාහිනි වැඩසටහන අද

ජාතික රූපවාහිනිය මගින් විකාශය කෙරෙන ජාතික වීරයින්, ධීරයින්, යුගකාරක පුරුෂයින් පිළිබඳ සාකච්ඡා කෙරෙන 'මුල්' නමැති වැඩ සටහන යටතේ දෙසැම්බර් මස 22 ඉරුදින සවස 7.00 ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා පිළිබඳ වැඩසටහන විකාශය කෙරේ. එහි තිරපිටපත අජිත් මෙන්ඩිස් විසින් රචනා කර ඇති අතර, සුමිත් රෝහණ තිත්තවැල්ගලගේ අධ්‍යක්ෂණයකි.

## නත්තල් බැති ගී සංදර්ශනයක්

දෙසැම්බර් මස 22 වෙනිදා රාත්‍රී 7.00 ට ජනප්‍රිය ගායක ගායිකාවන් සහභාගී වන නත්තල් බැති ගී සංදර්ශනයක් අඟුණවිල විදුහල් ක්‍රීඩාපිටියේ පැවැත්වීමට අඟුණවිල මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමා කටයුතු සැලසුම් කොට ඇත.

මේ නත්තල් බැති ගී සරණිය සඳහා නෙලු අධිකාරී, මාරියෝ ආනන්ද, කපිල පුගලආරච්චි, තුලනි සිතාරා වැනි යොවුන් ගායක, ගායිකාවන් රැසක් සහභාගි වීමට නියමිතය. මුදල් අයකිරීමකින් තොරව පැවැත්වෙන මෙම ගීතාවලිය සඳහා සංගීතය සමග නර්තන අංග පෙළගස්වන්නේ කටුනේරියේ ''ඒන්ජල්ස්' සංගීත කණ්ඩායමයි.

**පීටර් කැමිලස් සුබාසිංහ**

තඹකන්ද ශු. බෘනෝ දහම් පාසලේ නත්තල් උත්සවය හා ත්‍යාග ප්‍රදානෝත්සවය සමග විවිධ ප්‍රසංගය දෙසැම්බර් 22 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇත. එහි විශේෂ ආරාධිත අමුත්තන් ලෙස ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු පියල් ජානක පියතුමා හා චන්දන ලියනාරච්චි මහතා සහභාගි වෙති.

**පෝල් විජේතුංග**

**40 වසරක යුගදිවි සැමරුම**
**ආදර දෙවි සමිඳේ - අප මව්පියො දෙදෙනා**
**ඔබගේ රැකවරණේ - සුරකිනු මැන සැමදා**
**1973. 12. 26 - 2013. 12. 26**



**ස්ටැන්ලි කතුරුසිංහ සහ ගර්ටි කුරේ**

ආදර දෙවිපියාණනි, පුරා 40 වසරක් යුග දිවි ගෙවන්නට ලබා දුන් සියලු වරප්‍රසාදයන්ට තුති පුදමින් ප්‍රශංසා කරන අතර අප ආදර දෙමාපියන්ගේ ඉදිරි ජීවිතයට ඔබවහන්සේගේ දේව ආශිර්වාදය අයදින්නේ ආදරණීය පුතා, දියණිය, බෑණා සහ ලේලි, මුණුබුරු මිණිබිරියන් ඇතුළු සියළුම ඥාතින්.

## නත්තල් ගුවන් විදුලි වැඩසටහන්

**තරංගමාලා 91.7-91.9. ඔස්සේ ස්වදේශීය සේවයෙන්**

දෙසැ. 15 පෙ.ව. 10.00-10.30 ගරු සුනිල් ප්‍රදිනාන්දු දේවගැතිතුමා, දෙසැ. 18 පෙ.ව. 11.30-12.00 ගරු ඊ. කේ. යසරත්න දේවගැතිතුමා, දෙසැ. 19 පෙ.ව. 9.30-10.00 ගරු ෆ්‍රැන්ක් තිසේරා පියතුමා, දෙසැ. 20 පෙ.ව. 9.00-9.30 ලංකා සභාව කුරුණෑගල පදවිය, දෙසැ. 20 පෙ.ව. 9.30-10.00 ගරු ලලිත් ප්‍රනාන්දු පියතුමා, දෙසැ. 21 පෙ.ව. 9.00-9.30 ගරු ජෙරාල්ඩ් විනිසස් පියතුමා, දෙසැ. 22 පෙ.ව. 10.00-10.30 ගරු අනුර ගම්ලත් පියතුමා, දෙසැ. 23 පෙ.ව. 11.00-11.30 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, දෙසැ. 23 පෙ.ව. 11.30-12.00 ගරු නීල් ප්‍රසන්න පියතුමා, දෙසැ. 23 ප.ව. 3.00-4.00 කිතුනු ගීත සාහිත්‍යයේ වතගොත, දෙසැ. 23 රාත්‍රි 7.00-11.00 වටවටා නත්තල් - නත්තල මුව දොර, දෙසැ. 14 පෙ.ව 11.00-11.30 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, දෙසැ. 24 පෙ.ව. 11.30-12.00 ලෙනාඩ් කුරේ මයා. දෙසැ. 24 රාත්‍රි 11.00-01.30 නත්තල් බැති ගී සහ මධ්‍යම රාත්‍රි නත්තල් දිව්‍ය පූජා යාගය (සජීවි7 අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්. සා. ආනා දේවස්ථානය - වත්තල. සංවිධානය - ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමා, දෙසැ. 25 පෙ.ව. 6.35-6.40 විශේෂ නත්තල් පණිවිඩය, දෙසැ. 25 පෙ.ව. 9.00-12.45 විමුක්තියේ උපත සජීවි නත්තල් වැඩසටහන, දෙසැ. 25 ප.ව. 1.30-2.00 ගරු ප්‍රියන්ත විජේගුණවර්ධන දෙව්ගැතිතුමා, දෙසැ. 25 ප.ව. 2.00-2.30 ගරු මොල්ලිගොඩ මෝසස් පෙරේරා පියතුමා, දෙසැ. 25 ප.ව. 2.30-3.00 ගරු දේවප්‍රිය ද සිල්වා දේවගැති තුමා, දෙසැ. 25 ප.ව. 3.00-4.00 විශේෂ නත්තල් වැඩසටහන, දෙසැ. 25 ප.ව. 5.15-5.45 නත්තල් ගී, දෙසැ. 26 පෙ.ව. 10.00-11.00 රජතුන්කට්ටුව නාඩගම - හලාවත මිහිඳුකුලසූරිය පැන්ටලියන් කුරුකුලආරච්චි , දෙසැ. 26 පෙ.ව. 11.30-12.00 ගිවන්ත අර්ථසාද් මයා, දෙසැ. 26 ප.ව. 2.30-5.30 නත්තල් බැති ගී තරගය හා ප්‍රසංගය (සජීවි), දෙසැ. 27 පෙ.ව. 11.30-12.00 ගරු සාගර පෙරේරා දේවගැති තුමා, දෙසැ. 28 පෙ.ව. 9.00-9.15 ගරු දයා කිත්සිරි ප්‍රනාන්දු දේවගැතිතුමා, දෙසැ. 29 පෙ.ව. 10.00-10.15 දිමුතු නානායක්කාර මිය, දෙසැ. 30 පෙ.ව. 10.05-10.20 ගරු රවින් කල්දේරා සහෝදරතුමා, දෙසැ. 31 රාත්‍රි 11.15-12.15 අලුත් අවුරුදු තුති පිදීමේ දේව මෙහෙය ගරු චමින්ද පොන්සේකා දේවගැතිතුමා මෙතෝදිස්ත දේවස්ථානය කරගම්පිටිය, 2014.01.01 පෙ.ව. 11.30-12.00 ගරු අනුර පෙරේරා දෙව්ගැති තුමා

## හරිත නත්තලක් අද සා. ලූසියාහිදී

කොටහේන සා. බෙනදික්ත විදුහල් වාර්ෂික නත්තල් කැරොල් වැඩසටහන 'හරිත නත්තලක්' දෙසැම්බර් 22 ඉරිදා (අද) සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී ප.ව. 7.00 ට පැවැත්වේ.

## ස්වාධීන රූපවාහිනි නත්තල් වැඩසටහන

දෙසැම්බර් 25 නත්තල් දිව්‍ය පූජාව (සජීවි) උදෑසන 8.00 සිට 9.00 පිටිපන සා. මරියා දේවස්ථානයේ සිට

දෙසැම්බර් 25 නත්තල් කැරොල් වැඩසටහන උදෑසන 9.30 යුධ හමුදා කැරොල් කණ්ඩායම

දෙසැම්බර් 25 කැරොල් වැඩසටහන සවස 4.30 ට දේවස්ථාන ගායනා කණ්ඩායම

## සිරස රූපවාහිනි

දෙසැම්බර් 24 මධ්‍යම රාත්‍රි පූජාව (සජීවි) හලාවත ආසන දෙව් මැඳුරේ සිට

## ලක්හඬ ගුවන් විදුලිය

දෙසැම්බර් 24 මධ්‍යම රාත්‍රි පූජාව (සජීවි) වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ සිට

**ප්‍රියන්ත පීටර්ස්**

## පයාගල මීසම පුරා සහෝදරත්වයේ නත්තලක්

පයාගල මීසම් සේවක ගරු සිසිර සමරකෝන් පියතුමාගේ අදහසකට අනුව මෙවර නත්තල වෙනුවෙන් පයාගල මීසම පුරා ක්‍රියාත්මක වන පරිදි නුවාන මට්ටමින් තෝරා ගත් දිනවලට අනුව එක් එක් ස්ථානවල නත්තල් වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

මීසමේ දෙව්මැඳුරුවල ඇති එක් නුවනයකට අයත් ජනතාව වෙනුවෙන් රාත්‍රි 7.00 ට ආරම්භ වන මෙම නත්තල් වැඩසටහනේදී ජේසු උපත සිහිගැන්වෙන නාට්‍යය කුඩා ළමුන්ගේ සහභාගිත්වයෙන් ආරම්භ වන අතර, ඉන්පසු අනතුරුව කුඩා ළමුන්ගේ නාට්‍ය, නැටුම් හා වැඩිහිටි අයගේ නාට්‍ය මෙන්ම, කැරොල් ගායනාද පැවැත්වේ.

සුහදත්වය, එකමුතුකම, සහභාගිත්වය හඳුනාගැනීම සහ නත්තලේ සැබෑ අරුත කුමක්ද යන්න බෙදාහදා ගැනීම මෙහි මූලික අරමුණ වේ. එමෙන්ම වයස අවුරුදු 10 ට අඩු මීසමේ සෑම ළමයකුටම ඒ ඒ වයස් මට්ටම් වලට අනුව නත්තල් සීයා අතින් ත්‍යාගයන් පිරිනැමීමටද ගරු පියතුමා කටයුතු යොදා ඇත. මීසම් සභා ඇතුළු මීසමේ සියලු ජනතාවගේ සහාය මෙන්ම උනන්දුවද මේ සඳහා ලැබී තිබේ. වාර්ෂිකව තරුණ සමිතිය සංවිධානය කරන නත්තල් එකමුතුව පවුල් ඒකක මට්ටමින් දෙසැ. 29 දින රාත්‍රි කුඩා පයාගල සා. මරියා දෙව්මැඳුරු භූමියේදී පැවැත්වේ.

**ජී. නිහාල් ප්‍රනාන්දු**

## 'උඳුවප් මිහිර' නත්තල් බැති ගී දුම්රිය දෙපාර්තමේන්තුවේ

'උඳුවප් මිහිර' නත්තල් බැති ගී වැඩ සටහන තෙවන වරටත් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කොළඹ ගොඩනැගිලි පරීක්ෂක කාර්යාලයීය පරිශ්‍රයේදී දෙසැම්බර් 19 පෙ.ව. 9.00 සිට ගොඩනැගිලි පරීක්ෂක කේ. ඩබ්. පී. රණසිංහ මහතාගේ ආරාධනයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි බී. ඒ. පී ආරිය රත්න මහතාගේ ප්‍රධානත්වයෙන් කතෝලික බොදු සේවක එකමුතුවෙන් පැවැත්වේ.

**ඒ. ඒ. ඩී. ජේ. නිව්ටන්**

## නත්තල් සුහද හමුවට ගම එක්වෙති

වැලිකුරුඳුවත්ත පාතිමා මාතා දෙව්මැඳුරට අයත් ග්‍රාමවාසීහු 2013 දෙසැම්බර් මස 30 වෙන දින සුහද හමුවක් පැවැත්වීමට ලහි ලහියේ සූදානම් වෙති.

එදින ප.ව. 7.00 ට දෙව්මැඳුර අබියස රැස්වී කොට්ඨාස මට්ටමින් කැරොල් බැති ගී ගායනා කරන අතර ඒ සඳහා බාල තරුණ මහලු බැතිමතුන් සහාභාගි වනු ඇත. සාදය අවසානයේ ග්‍රාමයේ සුහදශීලී එකමුතු බව තුළින් නත්තලේ ප්‍රීතිය බෙදාග ැනීම සඳහා භෝජන සංග්‍රහයක් පැවැත්වීමටද කටයුතු සූදානම් කර ඇත.

ගරු හේමන්ත ප්‍රනාන්දු සහායක පියතුමන්ගේ සංකල්පයක් අනුව ප්‍රථම වරට සංවිධානය කරන ලද මෙම නත්තල් හමුවට කඳාන දිසානායක වැලිග ම්පිටිය මීසම් සේවක ගරු ශ්‍රීලාල් පොන්සේකා පියතුමාද සහභාගි වේ.

**ඩල්සි මෙන්ඩිස්**

## ප්‍රැන්සිස්කන් තරුණ හා ළමා රැළියක්

ගිහි ප්‍රැන්සිස්කන් නිකායේ යුප්‍රා තරුණ හවුලේ හා ලිප්‍රා ළමා හවුලේ සාමාජික සාමාජිකාවන්ගේ සහභාගිත්වයේ රැළියක් බෝලවලාන ප්‍රැන්සිස්කන් ප්‍රාදේශාධිපති නිවසේදී ගිහි ප්‍රැන්සිස්කන් නිකායේ ආත්මික අධ්‍යක්ෂ ගරු බෙනට් සිල්වා පියතුමාගේ මෙහෙයවීමෙන් පවත්වන ලදී.

මේ රැළියට ප්‍රැන්සිස්කන් තෙවන නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු මාර්ක් ප්‍රනාන්දු පියතුමා හා ගරු නෙවිල් ප්‍රනාන්දු පියතුමා සහභාගි වූහ. විවිධ ක්‍රීඩා, විරිදු ගායනා, ගිතිකා, ගීත ගායනා හා නර්තනාංගයන් සාමාජිකා සාමාජිකාවන්ගේ විශේෂ දස්කම්ද මෙහිදී මතුවිය.

**සලිනි මානවී ඩයස්**

ආරම්භය: 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

2013 විශේෂ නත්තල් අතිරේකය - 2 කොටස



නත්තලේ සැබෑ අරුත 10 පිටුව



කැරොල් කරත්තේ 08 පිටුව

ක්‍රි.ව. 2013 ක් වූ දෙසැම්බර් 22 ඉරිදා 148 වෙළුම 30 කලබ සතිපතා පත්‍රය - පිටු 32 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදී.

## කිතු දහම නිසා දංගෙඩියට යන

# විසි එක් වන සියවසේ ප්‍රාණ පරිත්‍යාගිවරු



මුළු ලොවම නත්තල් අසිරියෙන් වැසී ගොසිනි. ඇතැම් තැනක හිම පතිත වන තරමට සීතලය. වෙළෙඳ ලෝකය නත්තල ස්වකීය ව්‍යාපාර සරුගන්වන්නට විවිධ උප්පරවැට්ටි යොදමින් සිටී. නත්තල් බෝනස්, අලුත් ඇඳුම් පැළඳුම්, තෑගිබෝග, නත්තල් ගස්, ගවලෙන් තැනීම ආදිය නිසා කුඩා දරුවාගේ පටන් මහල්ලා වන තෙක් නැවුම් බලාපොරොත්තු කර පින්නාගෙන බොහෝ කාර්යබහුල වී තිබේ. නත්තල ලෝකයට සිහි ගන්වන්නේ සාම කුමරුවාණන්ගේ උත්පත්තියයි. පාපයෙන් බිඳී ගිය දේව - මිනිස් ගිවිසුම යළි ස්ථාපිත කරන්නට දේව පුත්‍රයා සිය දෙව් බව හිස්කර මනු ලොවට මාංශගත වූ ඒ සුවිශේෂී දිනය නත්තලයි.

නත්තල පිළිබඳ ඒ අපූර්ව සිතිවිලි දනන් සිත් පහන් කරද්දී ලෝක ජනගහනයෙන් බිලියන 2.1 වන වැඩිම කතෝලිකයන් අතරින් කෝටි 10 ක් වන කිතුනුවන් ලොව පුරා විවිධ රටවල හිංසනයට ගොදුරු වී සිටී. ලෝකයේ මුළු ජනගහනයෙන් තුනෙන් එකක් කතෝලිකයෝ වෙති. එදා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ලොවට දෙසා වදාළ කතෝලික දහම උදෙසා ස්තේෆන් තුමාව ගල් ගසා මරා දැමීමෙන් ආරම්භ වූ කතෝලික ප්‍රාණපරිත්‍යාගිවරය සියවසෙන් සියවස විවිධ මුහුණුවරින් කළ එළි දුටුවේය.

දිනපතා කිතුනුවන් 400 ක් සිය දහම නිසා දිවි පුදන තරමට තෙවන සහස්‍රකයේ විසි එක් වන සියවසේ කිතුනු හිංසනය බරපතල වී ඇති අතර සෑම පැයකටම කතෝලිකයන් 16 දෙනෙක් ඝාතනයට ලක් වෙති. වසරකට ලොව වටා කතෝලිකයන් 170,000 ක් සිය දහම නිසා ජීවිතය පූජා කරන අතර ලෝකයේ රටවල් 193 ක් අතරින් රටවල් 131 කම කිතුනුවන්ට හිංසා පීඩා කිරීම දෛනික කටයුත්තක් වන තරමට බරපතල වී තිබේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රඥප්තියේ 18 වන වගන්තියට අනුව ආගමික නිදහස ස්ථාපිත කර ඇත. සෑම කෙනෙකුටම සිතීමේ, හෘදය සාක්ෂියට අනුව වැඩ කිරීමේ, ආගම් ඇදහීමේ සිය කැමැත්ත අනුව ආගම් ඇදහීම, විශ්වාසය වෙනස් කිරීමේ නිදහස ඇති අතර පෞද්ගලිකව එකිනෙකා හෝ සංඝයන් ලෙස පෞද්ගලිකව හා ප්‍රසිද්ධියේ සිය ආගම ඇදහීමේ, වත් පිළිවෙත් සිදුකිරීමේ, ඉගැන්වීමේ හා ප්‍රචලිත කිරීමේ නිදහස හා අයිතිය එමඟින් තහවුරු කර තිබේ. මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රඥප්තියේ 18 වැනි වගන්තියෙන් ආගමික නිදහස එසේ ස්ථාපිත කර තිබුණ ද ලොව පුරා බරපතළ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් සිදු කරමින් කිතුනුවන්ට එරෙහි ප්‍රචණ්ඩ හිංසනයක් මුදා හැර ඇත. කතෝලිකයෝ සිය දහම නිසා අප්‍රිකාව, ලතින් ඇමෙරිකාව, මැද පෙරදිග, චීනය පෙරටු කරගත් ආසියාව සහ දැන් දැන් යුරෝපා සංගමයේ ඊනියා නීති රීති නිසා යුරෝපයේ ද හිංසනයට ගොදුරු වෙමින් සිටී. ඉස්ලාම් ලෝකයේ රට රටවල්වල බල පැවැත්වෙන ෂාරියා නීතිය කිතු දහම අතුගා දැමීමේ මෙවලමක් බවට පත් කරගෙන ඇති අතර මේ නීතියට මුවා වී කිතුනුවන්ට ශාරීරික වධහිංසා පැමිණවීම බරපතළ පීඩාවන් පැමිණවීම හා මරණයට ලක් කිරීම සිදුවේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වතිකානයේ ස්ථිර නිරීක්ෂක අති උත්තම සිල්වානෝ ටොමාසි අගරදගුරු

**ශිරාන් මෛත්‍රී විසිනි**

හිමිපාණන් ද දිනෙන් දින උග්‍රවන කිතුනුවන්ට එරෙහිව දියත් කර ඇති බරපතළ හිංසනය පිළිබඳව මානව හිමිකම් කවුන්සිලයේදී වාර්ෂිකව ලොව පුරා විවිධ රටවල කිතුනුවන් 170,000 ක් සිය දහම නිසා දිවි පිදීම සදාචාරය අගයන ලෝකය තැතිගන්වන සුළු තත්ත්වයක් යැයි අවධාරණය කළහ.

ඇමරිකා එක්සත් ජනපදයේ *Open doors* (විවර වූ දොරටු) නම් සංවිධානය මඟින් ලෝකයේ කිතුනුවන්ට එරෙහිව හිංසනයේ පෙරමුණ ගත් රටවල් පනහක් ලැයිස්තු ගත කර ඇත. මේ සංවිධානය 1950 දී ආරම්භ වූයේ කොමියුනිස්ට් රට වලට බයිබලය හොරෙන් රැගෙන ගොස් බෙදා දීමට වන අතර දැන් රටවල් 60 ක එය ක්‍රියාත්මක වේ. මේ සංවිධානයේ තක්සේරුවට අනුව ලොව ඉහළම ආගමික හිංසනය කිතුනුවන්ට එරෙහිව දියත් කරනු ලබන රටවල් පනහ මෙසේ ශ්‍රේණිගත කර ඇත.

1. උතුරු කොරියාව 2. සෞදි අරාබිය 3. ඇෆ්ගනිස්ථානය 4. ඉරාකය 5. සෝමාලියාව 6. මාලදිවයින 7. මාලි 8. ඉරානය 9. යේමනය 10. එරිත්‍රියාව 11. සිරියාව 12. සූඩානය 13. උතුරු නයිජීරියාව 14. පාකිස්ථානය 15. ඉතියෝපියාව 16. උස්බෙකිස්තානය 17. ලිබියාව 18. ලාඕසය 19. ටර්ක්මෙනිස්තානය 20. කටාරය 21. වියට්නාමය 22. ඕමානය 23. මොරිටානියාව 24. ටැන්සානියාව 25. ඊජිප්තුව 26. අරාබි එක්සත් එමීර් රාජ්‍යය 27. බෲනායි 28. භූතානය 29. ඇල්ජීරියාව 30. ටියුනීසියාව 31. ඉන්දියාව 32. මියැන්මාරය (බුරුමය) 33. කුවේටය 34. ජෝර්දානය 35. බහරේනය 36. පලස්තීනය 37. චීනය 38. අසර්බයිජානය 39. මොරොක්කෝව 40. කෙන්යාව 41. කොමොරෝස් 42. මැලේසියාව 43. ජිබෞටි 44. ටජිකිස්ථානය 45. ඉන්දුනීසියාව 46. කොළොම්බියාව 47. උගන්ඩාව 48. කසකස්ථානය 49. කිර්ගිස්තානය 50. නයිගර්

2013 වසර සඳහා නිකුත් වූ මේ ශ්‍රේණිගත කිරීමේ ලැයිස්තුවේ කැපී පෙනෙන සිදුවීම් ගණනාවක් ඇත. සිරියාව 2012 ලැයිස්තුවේ 36 වැනි ස්ථානයේ සිට 2013 වසරේදී 11 වැනි ස්ථානය කරා පැමිණ ඇත. සිරියාවේ සිදුවෙමින් පවත්නා කිතුනු සමූල ඝාතනයන් අනුව 2012 වසරේදී හොම්ස් නගරයේ විසූ කිතුනුවන් අසූ දහසක් සිය ගම්බිම් හා ගෙවල් දොරවල් වලින් නෙරපා හැර කිතුනු සංහාරයක් දියත් කර තිබුණි. අසාද් රජයේ ද ආශිර්වාදය ඉස්ලාම් අන්තවාදීන්ට ලැබෙන බවට සැක පහල වන්නේ ඔවුන් නිදැල්ලේ හැසිරෙමින් කිතුනුවන් සමූල ඝාතනය කරන්නට කටයුතු කරන හෙයිනි.

ඉතියෝපියාවේ සමස්ත ජනගහණයෙන් තුනෙන් දෙකක් කතෝලිකයෝ වෙති. ඒ අනුව එරට බහුතරය කිතුනුවෝ වෙති. 2012 වසරේදී ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 38 වන ස්ථානයේ සිට 2013 වසරේදී 15 වැනි ස්ථානය දක්වා වේගයෙන් ඉදිරියට පැමිණ ඇත්තේ ඉස්ලාමීය අන්තවාදීන් සහ මූලධර්මවාදීන් කතෝලිකයන්ට එරෙහිව සිදුකරන ප්‍රහාර දිනෙන් දිනම තීව්‍ර කිරීම හේතුවෙනි.

2011 කිතුනු හිංසනය පිළිබඳ ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවට මාලි ඇතුළත්ව තිබුණේ නැත. එහෙත් එරට කිතුනුවන්ට එරෙහිව සිදුවන බරපතළ හිංසනයන්ගේ තත්ත්වය මේ

20 පිටුවට »



## මරිමව් තුළින් බිළිඳු සොයා යමු

# නත්තලේ සැබෑ අරුත

නත්තල් වසරක අවසානයට අපි ළඟා වී සිටින්නෙමු. දෙසැම්බර් මාසය ළංවන විට අපට නිතැතින්ම සිහිවන්නේ නත්තල් උත්සවයයි. මෙහිදී වැදගත් වන්නේ නත්තලේ සැබෑ අරුත ලොවට ප්‍රකාශ කිරීමයි. තමාට මෙන් තම අසල් වැසියාට ප්‍රේම කිරීම ඉතා වැදගත්ය.

අද කිතුනුවන් තම අසල්වැසියන් ගැන සිතන්නේ නැත. තමන් කාබී විනෝද වෙනවා හැර අන් අය ගැන සොයා බලන්නේ නැත. අප දේශය ගැන සිතන්න. හිසට සෙවනක් නොමැතිව බොහෝ දෙනෙක් කඩපිල්වල රාත්‍රිය ගත කරති. කුසට අහරක් සොයා ගැනීම සඳහා අන් අයට අත පාති.

නම ප්‍රසිද්ධ කර ගැනීම සඳහා දානපතියෝ බොහෝසේ පින් දහම් කරති. ජේසුස් වහන්සේ දේශනා කළේ "දකුණතින් දෙන දෙය වම් අත නොදනීවා කියාය." දිනෙන් දින මනුෂ්‍යයා ක්ෂණික දේවල් කරා ගමන් කරයි. මැවුම්කාර දෙවියන් වහන්සේ ධර්මිෂ්ඨයාටත්, අධර්මිෂ්ඨයාටත් ඉර උදා කරන සේක. වැසි වස්වන සේක. උන්වහන්සේ තම ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ප්‍රේම කළ සේක.

අපගේ මීසමේ සිටින දුප්පතුන් හට හැකි ආකාරයෙන් උදව් උපකාර කරන්න. අසරණ අයට පිහිට වන්න. දරුවන් නොසලකන දෙමව්පියන් වැඩිහිටි නිවාසවල කඳුළු බොමින් දරුවන් සිහිකරති. දෙමව්පියන් තම දරුවන් ගැන නොසිතන නිසා ළමා නිවාස වල දරුවෝ දෙමව්පියන් සිහි කරති. ඒ නිසා ප්‍රේමය, කරුණාව, ආදරය, ඉවසිලිවන්ත භාවය වැනි ගුණාංග අපගේ ජීවිත වල තිබිය යුතුයි. දෙවියන් වහන්සේ බොහෝ සේ මේ නත්තල තුළ ආශිර්වාද කරන සේක.

ජුසේ තුමාත්, මරියතුමියත් නවාතැන් ගැනීමට ස්ථානයක් සොයා යන අවස්ථාවේදී ඔවුන්ට වහලක් දීමට තරම් කාරුණික වූයේ එක් පවුලකි. එය සමාජයේ පහත් ස්ථානයකි. දේව සැලස්ම එසේ වූ සේක. දෙවියන් වහන්සේ අපව තෝරා ගෙන ඇත්තේ මව්කුස පිළිසිඳ ගැනීමට ප්‍රථමය. එදා ජේසු බාබාට සැතපීමට සුව පහසු යහනාවක් නොතිබිණි.

මරිය තුමිය ජේසුව බිහි කිරීමට සැරසෙන අවස්ථාවේ තනියට සිටියේද ජුසේ තුමා පමණයි. අහිංසක බැටළුවන් පසෙක විය. මේ අනුව අද අපගේ සමාජය දෙස බැලූ විට නෑදෑ හිතවතුන්, උදව් උපකාර, සෑම දෙයකින්ම සර්ව සම්පූර්ණව දරුවකුගේ ප්‍රසූතිය සිදු කරයි. අපි මෙම නත්තල තුළ අන් අයට සරණ වෙමින්, දුක, සතුට, වේදනාවට, සංවේදී වෙමින් කලකිරුණ ජීවිත තුළට සහනයක් වෙමින්. ලෙඩ රෝග නිසා මානසිකව වැටෙමින් දිවි ගෙවන අයට සරණ වෙමින් තම අසල්වැසියාට යම් ප්‍රශ්නයක් කරදරයක් වූ විට තමන්ට හැකි ආකාරයෙන් උදව් උපකාර කර සැම දෙනාවම යහපත් මාර්ගයට ගැනීමට උත්සාහ ගනිමු. මෙම ක්‍රියාවන් දෙවිඳුට ප්‍රසන්න ලෙස ඉටු කරමින් සැබෑ නත්තලේ අරුත සොයා යමින් සැමට සාමයෙන් පිරි සුබ නත්තලක් පතමි.

**කාමන් සකුන්තලා**



# මෙදා නත්තලේ සැබෑ අරුත වටහා ගනිමු



**නත්තල යන වදන නතාල් යන පෘතුගීසි භාෂාවෙන් බිහිවු වචනයකි. (ආභාෂය ලද වචනයකි) මෙය ලතින් භාෂාවෙන් නතාලිස් යනුවෙන් හැඳින්වේ. කෙසේ වෙතත් නත්තල යනු කිතු උපත සැමරීමේ මංගල්‍යයයි. කිතු උපත සමරන උඳුවප් මාසේ පරිසරයේ ඇති සිසිල් සුවය අපේ ගත සිත ප්‍රබෝධමත් කරයි. ගහ කොළ මහ පොළව කිතු උපත සඳහා සූදානම් වන ආකාරය සැබවින්ම චමත්කාරජනකය.**

දෙසැම්බර් මස පළමුවෙනිදායින් ඇරඹෙන නත්තල් සමය සංකේතවත් කිරීමට ලක්වාසි ජනතාව හුරුපුරුදු වී සිටින්නේ රතිඤ්ඤා හඬ දසත පතුරුවාලමිනි. නත්තලෙන් ඉහළම වාසි සහ ප්‍රයෝජන අත්කර ගැනීමට මාන බලන වෙළඳ ව්‍යාපාරික මහතුන් කඩවීදි වෛර්ණ බඩු භාණ්ඩ වලින් සැරසීමට ඉමහත් උනන්දුවක් උද්යෝගයක් දක්වයි. ළමා තරුණ වැඩිහිටි බාල මහළු සියලු දෙනා නව මාදිලියේ ඇඳුම් ආයිත්තම් වලින් සැරසි නත්තල් දේව මෙහෙයට සහභාගි වීමට සිහින දකිති. ලක ලැස්ති වෙති.

කුඩා ළමුන් නත්තල් සීයාගෙන් තෑගි ලබාගැනීමට පෙරුම් පුරති. නත්තල් ප්‍රීතිය නිමිත්තෙන් අඹු සැමියන් දරු දෙමාපියන්, ඥාතීන් අතර බෙදාහදා ගැනීමට තෑගි බෝග ලබා ගැනීමට යුහුසුළු වෙති. මේ නිසාම පුංචි රෝමයේ පමණක් නොව කතෝලිකයන් වැඩි වශයෙන් වාසය කරන මුහුදු බඩ පළාත් ආශ්‍රිත නගරබද ප්‍රදේශ දැඩි කලබලකාරී ස්වරූපයක් උසුලයි. එපමණක් නොව බොහෝ කඩ සාප්පු අතුරු සිදුරු නැතිව ජනයාගෙ න් පිරි ඉතිරී පවතියි. ගිහි පැවිදි පූජක සියලු දෙනාටම ඉතා කාර්ය බහුල කාල වකවානුවකි. ඔවුහු ජන වන්දනාවේ වත් පිළිවෙත් වලට මූලිකත්වය දෙමින් නත්තල් දේව මෙහෙයන් පැවැත්වීම සංවිධානය කිරීමට උත්සුක වෙති.

කිතු උපත සමරන්නට සූදානම් වන මෙදා නත්තල ළං වන විට බඩු මිළ අහස උසට නැගීම නිසා බොහෝ පිරිස් අසරණව ඇත. ඔවුන් හිඟා නොකා හිඟාකන තත්ත්වයකට පත්ව ඇත. නත්තලේ සිරි අසිරිය විඳ ගැනීමට තබා මූලික ආහාර වේල් තුන සපයා ගැනීමද ඔවුනට අද බලවත් ප්‍රශ්නයක් බවට පත්ව ඇත.

යුද්ධයෙන් බැට කෑ ඒ නිසා කඩා ඉහිරුණු පවුල්වල සාමාජිකයන් ඉන්න හිටින්න පැලක් නොමැතිව මාවතේ කඩපිලේ අසරණ වුවන් රෝගාබාධ වලට ගොදුරුව ගිලන්ව රෝහල් වල ඇඳන් මත තනි වූවන්ට මේ නත්තලේ සතුට අහිමිද?

කිතු තුමන්ගේ උපත සඳහා ඇති සුභාරංචියේ මූලික පණිවිඩය වන්නේ දේව රාජ්‍ය සඳහා සාක්ෂි දැරීමත් දේව රාජ්‍යයේ සැබෑ කොටස්කරුවන් වීමත්ය. මෙදා නත්තල සැබෑ නත්තලක් මෙන්ම අරුත්බර නත්තලක් කර ගත හැක්කේ අපි සැබෑ ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස දේව රාජ්‍ය සඳහා සාක්ෂි දරමින් දේව රාජ්‍යයේ සැබෑ කොටස්කරුවන් වුවහොත් පමණි.

දේව රාජ්‍යයේ කොටස් කරුවන් වීමට නම් මානව වටිනාකම් තුළින් අප පොහොසත් විය යුතුය. එනම්යුක්තිය සාධාරණත්වය සමානාත්මතාව දේව ප්‍රේමය, ඉවසීම, බෙදාගැනීම පරාර්ථකාමීත්වය යනාදි ශ්‍රේෂ්ඨ මානව ගුණධර්ම තුළින් අප ජීවිත සරසාගත යුතුය. මෙම ජීවිත ගුණ ධර්ම තුළින් අන් අයගේ ජීවිත බබළවන්නට වෙර වීරිය දැරිය යුතුය.

නත්තල් ගස් අලංකරණය ගවලෙන් සකස් කිරීම විචිත්‍රත්ව වූ දේව මන්දිරයන් තුළ දේව මෙහෙයන් වලට සහභාගි වීම නත්තලේ මිහිරියාව විඳ ගැනීමට ආධාරකයක් වන බව සැබෑවකි. එහෙත් නත්තලේ සැබෑ අසිරිය විඳ ගැනීමට නම් අප ජීවිත තුළ සැබෑ වෙනසක් ඇති කර ගත යුතුවේ. එනම් දෙවිඳුන්ට ළං වී දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිත ගත කිරිමට මෙදා නත්තල ආරම්භයක් කරගත යුතුය.

දුගී මගී, දුකින් පීඩිත වූවන් මගහැර අත හැර, ඇති හැකි අය සමග අපි කැමති අපේ යාළුමිත්‍රාදීන් සමග පමණක් මෙදා නත්තල් සතුට ප්‍රීතිය බෙදා හදා ගන්නට අවස්ථාවක් කර ගන්නේ නම් නත්තලේ ඇති අරුත කිමෙක්ද යන්න පිළිබඳව සිතා බලනු වටී.

එදා කිතු තුමා දෙව් මිනිස් බව ගෙන උපන්නේ සකල ලෝකවාසි ජනතාවට විමුක්තිය, සතුට, ප්‍රීතිය දිනා දෙන්නටයි. එසේ නම් අපි කිතු උපත සමරන මෙදා කිතු තුමන්ගේ ජීවිතය මෙනෙහි කරමු. සැබෑ කිතුනු අනුගාමිකයන් වෙමු. කිතුනු සාක්ෂිකරුවන් වෙමු. සැබෑ කිතුනු සාක්ෂිකරුවන් ලෙස දිවි ගෙවමු. එසේ නොවුවහොත් මෙදා නත්තල වත් පිළිවෙත් වලට සහ ප්‍රිය සම්භාෂණ උලෙළ වලට පමණක් සීමා වූ නාමික නත්තලක් වීම නොඅනුමානය.

**ආචාරිණී ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු**

# නත්තලේ අසිරිය

**ශ්‍රී සුබ නත්තලක් වේවා! 2013 ගෙවුනා. නත්තලක් උදාවුනා මොකද්ද මේ නත්තලේ අසිරිය කියන්නේ? පිටස්තර ආටෝපවලට පමණක්ද? මේ අසිරිය බලපාන්නේ? නෑ. ඊට වඩා උත්කෘෂ්ට ඇතුළාන්ත ජීවිතයටයි. එනම් සිතටයි. ඒ බව පළමු නත්තල් දින සුර දූතයන් ගැයු සුමිහිරි ගීතයෙන් පිළිබිඹු වේ. එනම් 'උත්කෘෂ්ට මණ්ඩලයේ දෙවියන් වහන්සේට මහිමයත්, මෙලොවෙහි සුසිත් ජනයාට සාමයත් අත්වේවා" (ශු. ලූක් 2:14).**

අපේ රටේ සාමය ඇතිකරන්නන්ට වඩා සාමය නැති කරන්නෝ බහුලය. ජාතිවාදි, අන්තවාදි, ආගම්වාදි යන කුණු කසල තම යටි සිත තුළ නිදන් කරගෙන ඊර්ෂ්‍යාව, නපුරුකම, වෛරය, රැවටිල්ල, උඩගුව, අහංකාරකම, තන්හාව, බලකාමීත්වය, කෑදරය මෙකී නොකී දුර්ගුණවලින් යටි සිත අරගෙනය. ඒ මදිවට සමාජය තුළ ඒවා වපුරවමින් සිංහාසනාරූඪව යෙහෙන් වැජඹෙනවා. අනවශ්‍ය වාද බේද ඇති කරමින් පවිටු මානසික වින්දනයක් ලබනවා.

එක එක පුද්ගලයා ගතහොත් ඔහු තුළ සැබෑ සාමය තිබේද? ඔහුගේ පවුල තුළ, ගම තුළ, රට තුළ සැබෑ සාමය තිබේද? උත්තරීතර ස්ථානයක් වශයෙන් මහජනයා සලකන පාර්ලිමේන්තුව තුළ සාමය තිබේද? සොහොයුර මදක් සිතන්න. තත්ත්වය එසේ නම් රට තුළ සැබෑ සාමයක් ඇතිකර ගත හැකිද?

අපි දැන් බලමු පළමු නත්තලේ සුබ වදන දෙස එනම් සුසිත් ජනයාට සාමය අත්වේවා! කවුද මේ සුසිත් ජනතාවෝ. සිතේ කිළුටක් නැතුව හැසිරෙන්නෝ, යුක්ති සහගත දෙයට සිත දෙන්නෝ, නොවක් සිතකින් ඇත්ත පවසන්නෝ, අනුන්ට අවමන් දිවෙන් නොකියන්නෝ, සොහොයුරන් හට නපුර නොපතන්නෝ, සියළු දුසිරිත් වලින් දුරුවී සිටින්නෝ සුසිතට නිතරම සිත දෙන්නෝ, මුදල් දී ගිනි පොලිනොකරන්නෝ අල්ලස් ගෙන නීතිය අවනීතියට පත්කර ජනතාව නොපෙලන්නෝ අහිසංකයන් තළා පෙළා නොදමන්නෝ, නිදොස් අය පිට වරද නොතබන්නෝ, කුරිරුවන් අදමිටුවන් දුරින් දුරලන්නො තමන් විශ්වාස කරන දහම කෙරෙහි විශ්වාසය තබා ඒ අනුව ජීවත්වන්නෝ,

කිතුනු, නොකිතුනු, ගිහි පැවිදි අප සැම දෙන දැන් මොහොතක් අප හද දෙසට හැරෙමු. අපේ ඥාන ඇස විවර කර අපේ යටි සිත ගැන ගැඹුරු සෝදිසියක යෙදෙමු. එවිට ඔබට දැනේවි ඔබගේ යටි සිතේ තිබෙන හා තිබුණු අවගුණ මොනවාද කියා. එය ඔබේම යහපතට හේතු සාධක වෙනවාට කිසිම සැකයක් නැත. මෙතන දී අපට ඉතාම අවශ්‍යම ගුණ ධර්මය තමයි අවංකකම. මෙසේ ඔබ ඔබේ සිත පවිත්‍ර කර ගතහොත් පමණයි නත්තලේ අසිරිය සැබෑවටම ඔබට භුක්ති විඳීමට හැකිවන්නේ.

හිතවත් සොහොයුරු, සොහොයුරියනි, අපි කොපමණ වාරයක් නත්තල සමරා ඇද්ද? නමුත් අපේ ඇතුලාන්ත සූදානම කොහොමද? අපේ සතුරන් කියන අයට, දයාව. කරුණාව දක්වලා තිබෙනවාද? ඔවුන්ට සමාව දීමට අපි සූදානම් ද? ඔවුන් විනාශ කිරීමට උගුල් අටවන්නේ නැද්ද? ඔවුන්ගේ විනාශයේදී අපි ජය සෝෂා කර නැද්ද? අන්‍යයන්ගේ දුක, වේදනාව, අසරණකම ඔබේ වගේ සිතුවාද? ඔබ කවුරුවුනත්, කොහේ සිටියත්, ඔබ මගේ සොහොයුරෙක් කියා මොහොතකටවත් සිතුවාද? නමුත් අපි ගායනා කරනවා ඔබ කවුරු වූනත් කොහේ සිටියත් ඔබ මගෙ සොහොයුරෙකි කියා.

නත්තල නිවැරදිව ශුද්ධව සමරන අය අප අතර සිටිනවා. නමුත් වැඩි දෙනෙක් එසේ නොවේ. නත්තලේ අසිරිය නත්තල් දිනවලට පමණක් සීමා නොකර අප ජීවිත පුරාම. සාමය, සතුට උදාකර අපේ ජීවිතයත්, අන්‍යයන්ගේ ජීවිතත් ආරක්ෂාකර සැබෑ සාම මාවතේ ගමන් කරන ලක් මවගේ සැබෑ කිතුනු දරු දැරියන් බවට සාක්ෂි දරමු. නත්තල් පණිවිඩයවූ ඇතුළාන්ත සාමය, බෙදා ගැනීමේ ත්‍යාගශීලි භාවය පිළිබිඹු වන්නා වූ සාම පණිවිඩය සැම අතින්ම සාර්ථක වේවා යනු මගේ පැතුමයි.

**ඔබ සැමට අසිරිමත් නත්තලක් වේවා!**

**ජෝෂෆා වෙදමුණිනිළමේ**
පැවිදි සොහොයුරිය S.D.S

# මේදා නත්තලෙත් සිහින ලොවක මා අතරමං වේවිද?

කුඩාකල උඳුවප් මාසය එළඹෙන විට ඒ බව මා දැනගත්තේ අවට පරිසරය දෙවනත් කරමින් අප කිතුනු ගම්මාන වල නැගෙන වෙඩි හඬත් සමගය. ගත සිත කිළිපොලා යන සීතල, පාට පාට සැරසිලි වලින් විරාජමාන වූ නත්තල් ගස්, ගවලෙන්, සුබපැතුම්පත් හා අලුත් ඇඳුම් පැළඳුම් නත්තලේ නැතිවම බැරි ලක්‍ෂණ යැයි මා සිතූ වාර අනන්තය.

ළමාවියේ සිටින්නන් එදා මෙන්ම අදත් එසේ සිතීම එතරම් වැරැද්දක් නොවේ යැයි මට සිතේ. ඉහත කී සියලු කාරණා මැද වුවද ජේසුස් වහන්සේ කුඩා බිලිඳකු ලෙස උපත ලබනවා යන්න හැම නත්තලකම අපට හොඳින් මතක තිබිණ. වර්තමානයේ නත්තල යනු කුමක්දැයි මා තුළම ප්‍රශ්න කරගනිමින් ආත්ම සෝදිසියක යෙදුනු මා හට යම්තාක් දුරකට අවබෝධ වූයේ ළමාවියේ මා සුන්දර සිහින ලොවක අතරමංවී සිටින්නට ඇත යන සැකයයි. අද මා වටහාගන්නා ලෙසට නත්තල මිනිස්කමට අභියෝග යකි. මා එසේ කියන්නේ ශුද්ධ වූ ත්‍රිත්වයේ දෙවන තැනැන්වහන්සේ නොහොත් පුත්‍රයාණන් වන දෙවියන් වහන්සේ දේවත්වයේ තේජසින් හිස්වී මිනිස් කයක් ලැබීම හිස්වීමට අකමැති අපට මහා අභියෝගාත්මක ආරාධනයක් වන නිසාය.

**යථාර්ථය බර වැඩි නේද?**

ළමාවියේ අහිංසක සතුටක් විඳින අප බොහෝ දෙනෙක් වයසින් මුහුකුරා ගොස් මිය යන තුරුම නත්තල සමරනුයේ ළදරු මානසිකත්වයෙන් යැයි සිතීමේ වරදක් නැත. අපේ තරුණ තරුණියන් හා වැඩිහිටියන් බොළඳ නත්තල් සැමරුම්වල හැමදාම එල්බ සිටින්නේ මන්දැයි මට මුණගැසෙන බොහෝ දෙනෙකුගෙන් මා ප්‍රශ්න කර ඇත්තෙමි. “ඇත්ත යථාර්ථය හුඟක් බර වැඩි, ඒක අපිට දිරවන්නෑ, ඒ හින්දා මායාවන් තුළ ඉන්න තරමට අපිට ලේසියි, අපි අතරමං වෙලා කියලා අපි දන්නවා. ඒත් ඒකට අපි හරි ආසයි” ආදී පිළිතුරු ඔවුන්ගෙන් ලැබුණි. තවත් සමහරුන්ගේ අදහස් මීට සමාන විය. “ඇත්ත දැනගත්තා කියලා කාටද ඕවා ජීවත් කරවන්ඩ පුළුවන්, නිකං බොරු වැඩ, හැමෝම කරන දේ කරපුවහම හොඳයි, වැඩි දේවල් කරන්න ගියාම අනාගන්න වෙනවා, අනික එහෙම ගිහිං වැරදුනාම අපිට කවුරුත් නෑ. අපි තනිවෙනවා.” මෙවැනි අදහස් අප බොහෝ දෙනෙකුගේ මනස තුළ හොල්මන් කරනුයේ හිස් වීමට අපට ඇති බය නිසා නේද?

**නත්තල උපතක්ද? විපතක ආරම්භයක්ද?**

මෙච්චර හොඳ දවසක නරක කතා කියන්න එපා යන්න අප හුඟ දෙනෙක් අහලා තියෙනවා. ඒ නිසා පුහු ආටෝප වලින් පිරුනු බොහෝ සැමරුම් උත්සව ගැන ඇත්ත යථාර්ථය කතා කිරීම ‘නරක කතා’ ලෙස බහුතරයක් පිළිගන්නවා. මේ නිසා ජීවිත කාලෙම අපි හුඟ දෙනෙක් ඇත්ත වහලා සතුටු වෙනවා. යුවළක් විවාහපත් වන දිනයේදී එම ජීවිතයේ අනාගත අවදානම, කැපවීම, වැයවීම, ජීවිත පූජා කිරීම ගැන කතා කිරීම හරි අමාරුයි. ඒවා ගැන හොඳ දවසක කතා නොකර ඉන්න අපි තීරණය කරලා තියෙනවා. මොකද ඇත්ත කතා කළොත් බොරුවට සතුටු වෙන අයට අමාරු හින්දා, නත්තල ගැනත් අපිට කියන්න තියෙන්නේ ඔය වගේම කතාවක්. මාංශගත වීමේ අභිරහස යනු මානව සංහතිය පාපයෙන් ගලවා ගැනීමට පියදෙවිඳුන් තම ඒක ජනිත පුත්‍රයාණන් පූජා කිරීමයි. යාග වීමට සැළැස්වීමයි. කල්වාරි කඳු මුදුනට යන ගමන ආරම්භ වන්නේ වල්ගා තරුවේ ආලෝකයත් සමගමයි. බෙත්ලෙහෙමෙ හා ගොල්ගොතාව වෙන්කළ නොහැකි සේ සදාත්මකව බැඳුණු එකම ගමනක ස්ථාන



දෙකක් යන්න අපි හොඳින් වටහාගන්න තරමට අපේ නත්තල ඇත්ත සැමරීමක් වෙනවා. මෙකී යථාර්ථය ශු. බයිබලය කිතු උපත හා බැඳුණු සිද්ධි මාලාව තුළ ඉස්මතු කර දක්වනවා. “ජුදෙව්වරුන්ට රජව උපන් උතුමාණෝ කොතැන්හිද? එපවත් ඇසූ හෙරෝද් රජ ද මුළු ජෙරුසෙලම් ජනතාවද කැළඹුණාහ. එකල හෙරෝද් දැවුරුදු වයස් වූ ද, ඊට බාල වු ද සියළු පිරිමි දරුවන් මරා දැමීමට අණ කළේය (ශු. මතෙව් 2:1-16). මෙලෙසින් සිතා බැලීමේදී ශු. බයිබලය මතුකර දක්වන දේවධාර්මික පසුබිම තුළ නත්තල යනු මරිමව් තුරුලේ නැළවෙන බිලිඳකුගේ සුරංගනා කතාවක් නොව අයුක්තියේ යදමින් බැඳි මිනිසියාව නිදහස් කරන විමුක්තියේ දෝංකාර නංවන ධර්ම යුද්ධයක ආරම්භයකි. ඔටු ලොම් වස්ත්‍ර ඇඟ ඉන වටා හම් පටියක් බැඳ, පළඟැටියන් හා වන මී ආහාරයට ගනිමින් “පසුතැවී සිත් හරවා ගන්න, මන්ද ස්වර්ග රාජ්‍යය අත ළඟ” යැයි (ශු. මතෙව් 3:2-6 ස්නාවක ජුවාම් තුමන් ඉඟිකළේ මෙම නව යුගයක උදාවක් ගැනය.

**නත්තල් දවසේ අපූරු අත්දැකීමක්**

ගිය අවුරුද්දේ දෙසැ. 25 දවල් වරුවේ මා සිටි දේවස්ථානය අසල ලක්‍ෂ 50 ඉක්මවා යන සුපිරි රථයක් නතර විය. ඉන් බැසගත් මැදිවියේ මව්පිය යුවළක් හා නවීන විලාසිතාවට (අඩ නිරුවත්ව) සැරසුනු දූවරුන් දෙදෙනෙකුද දේවස්ථානයට ඇතුළු වී ගවලෙන ලඟ බැතිබර යැදුමකට මුලපුරන ලදී. “ජේසු පිහිටයි. සුබ නත්තලක් ෆාද” කටපුරා සුබ පැතූ ඔවුන්ගේ මුහුණු පුරා නත්තල් සිරිය දෝරේ ගලමින් තිබිණි. අමතර වෙලාවක දෙව්මැඳුරට ඇතුළු වී පවුලක් ලෙස යදින්නට තරම් කොපමණ යහපත් පවුලක් දැයි මටම කියාගනිමින් ඔවුන් සමග දොඩමළු වීමි. “අපේ ලොකු දුවට බිස්නස් වැඩ ගොඩක් තිබුණා, ඇඳුම් ගන්න යන්න බැරිවුනා කියලා බලන්නකෝ ෆාද ඊයේ රෑ පූජාවට යන්න බැම කිව්වා. අපිත් ඉතින් අල්ලලා දාලා හිටියා. පල්ලියට ගොඩනොවී හොඳ නෑනේ, මේ ළඟ ගෙදරක පාටියකට යන ගමන් “එක දිගටම දීර්ඝ විස්තරයක් කළේ පිරිසේ මව විසින්ය. ඔවුන්ට සවන් දී සිටි මා ගැළවීමේ උපත සමරණ දින දිව්‍ය පූජාව පවා අතපසු කිරීමට ඔවුන් ඉදිරිපත් කළ සාධාරණ හේතු ගැන පුදුමයට පත්වීමි. ඉතිං අපි වැඩි දෙනෙක් නත්තල් දවසේත් අන්ධකාරයේ ඇවිදින අය බව වටහා ගන්නට අමුතුවෙන් පැහැදිලි කිරීම් අවශ්‍ය නොවනු ඇතැයි මම සිතමි. ඉහත කී පවුල මෙන්ම අපි බොහෝ දෙනෙකු විවිධ වාසිදායක සාධාරණ හේතු කියමින්, විලාසිතා රංගන වල යෙදෙමින්, පුහු වටිනාකම්, නොසංසිඳුණු ආශා පසුපස ලුහු බඳිමින් අපට ඕනෑ පිළිවෙලට නත්තල් කෑම සමාජ ප්‍රතිපදාවක් බවට පත්කරගෙන ඇත. නත්තල හිස්වීමේ මංගල්ලයක් යැයි කීම ඉහත සඳහන් පසුබිමක දිවගෙවන අයට බයිලා කීමක් නොවන්නේද?” අන්ධකාරයේ ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය”.” යෙසයා 9:2

**නත්තලේ ප්‍රීති වීම පාපයක්ද?**

අපෝ නෑ. මේ ලිපිය පටන් ගද්දිම මා සඳහන් කළ ළමාවියේ අත්දැකීම් අප කාටත් හරිම වැදගත්. ඕනෑම වැඩිහිටියකු තුළ දරුවකු සැඟවී සිටින බව පොත පත ඇසුරෙන් ඔබ දන්නා කරුණකි. ඒ නිසා ප්‍රීතිවීම, සැමරීම, රස මසුවුළු භුක්ති විඳීම, එකට එකතු වෙලා ජය සතුට ප්‍රකාශ කිරීම මිනිස් අපට සමාජීය සත්වයන් ලෙස අත්‍යවශ්‍ය දෙයක්. ඒ ඔස්සේ අපි හුඟක් සැහැල්ලු වෙනවා. අපේ සිත සුවපත් වෙනවා.



## මරිමව් තුළින් බිලිඳු සොයා යමු

දේව දූතයන් එඬේරුන්ට ඇරියුම් කළෙත් “සකල ජනයා හට ඉතා ආනන්ද ජනක මංගල පුවතක්” (ලූක් 2:8) පිළිගන්නටත් ගැලවීම අරභයා ප්‍රීති ප්‍රමෝද වන්නටත්ය. එසේනම් නත්තල ප්‍රීතිමත් උත්සවයක් යන්න අවිවාදයෙන් පිළිගත යුතුය. එහෙත් අපේ සතුට. ප්‍රීතිය ගැලවීම දායකද? අපි නත්තල සමරණ ආකාරය තුළ තව කී දෙනෙකුට ව කුසගින්න, පිපාසය, විලිබිය ඇති කරන්නේද? කී දෙනෙකුගේ ජීවත්වීමේ අයිතිය, උපත ලැබීමේ අයිතිය පාගා දමන්නේද?

සුවිසල් මැඳුරුවල පමණක් නොව දුගී පැල්පත් වලද සුරාවෙන් මත්වී පරුෂ වචනයෙන් අසල්වාසි දයාව බිඳ දමන්නාවූද, තම බඩ කට පුරා මස් මාංශ ගිල දමමින් ආත්මාර්ථය වපුරන්නාවූ ද පරිසරයක ගැලවීම දායක ප්‍රීතියක් කොයින්ද? ඇත්ත, යථාර්ථය බර වැඩි නිසා සිහින ලෝකයක අතරමං වී නත්තල සමරණ බොහෝ දෙනාට නත්තලේ ගැලවීම දායක පණිවුඩය විකාර දෙඩුමකි. ලෝකෙට ප්‍රකාසෙට නත්තල් සමරන බහුතරයක් මැද සිහින ලොවෙන් යථාර්ථයට ඇතුල්වීමට අවංක උත්සහයක් දරමින් සුබ නත්තලක් උදාකර ගන්නට අපි මේ නත්තලේදීවත් දේව පිහිට ඉල්ලමු.

**ගරු අනුර ගම්ලත් පියතුමා**
වන්නි මඩු දෙව්මැඳුර
අඟුණාවිල

# සිත් තුළ ඇති උඩඟුවේ අහංකාරයේ කිරුළ ගලවා ප÷ක තබන්න

ශ්‍රී ලංකාව විවිධ ජාතින්, විවිධ ආගම් අදහන්නන්, විවිධ කුලවර්ගයන්, විවිධ සංස්කෘතීන්ගෙන් සමන්විත වු ජන සමාජයක් සිටින රටකි. එම අය විවිධ භාෂාවන් කථා කරති. විවිධ ආගම් අදහති. ඒවායේ වත් පිළිවෙත් ඉටුකරති. විවිධ සංස්කෘතික ගති පැවතුම්. කුල සිරිත් අනුගමනය කරති. මෙම සියලුම දේ එකම මාතෘ භූමියක් තුළ අන්‍යොන්‍ය සහයෝගයෙන් සිදුකරති. පරම්පරා ගණනාවක සිට මෙය අප රට තුළ පැවත එන ඉතා හොඳ දෙයකි.

නමුත් මෑතක සිට අප රටේ තැනින් තැන ඇතැම් ස්ථානවල යම් යම් සුළු සුළු සිද්ධීන් ඇතිවුවත් සමස්තයක් වශයෙන් ගත් කල ඒ ඒ ජනකොටස් ජාති, ආගම්, කුල භේදයකින් තොරව තම තමන්ගේ කැමැත්ත අනුව නිදහසේ සිය කටයුතු කරගෙන යන අතර ඒ සඳහා අන් අයගේ සහයෝගයද ලැබෙන අතර සහයෝගයෙන් සහ එකමුතු කමින් කටයුතු කරති.

එහෙත් ඇතැම් අන්තවාදීන් සිතන සහ ආර්ථික වාසි සහ වරප්‍රසාද ලබන යම් යම් විෂම සිතුවිලි ඇති අය සහ ඒ අයගේ අනුබලය, උසිගැන්වීම. මඟපෙන්වීම අනුව ඇතැමුන් ඇතැම් ස්ථානවල විනාශ කිරීම්, හානි කිරීම්, නොයෙකුත් කලබල කිරීම් සිදුකරයි. එය සමස්තයක් වශයෙන් ගත් කල විශාල ලෙස බලපෑමක් සිදු නොවුවද, වගකිව යුතු අයවලුන් එම සිද්ධීන් නොසලකා හැර, ගණන් නොගෙන ඒ සඳහා ගත යුතු සුදුසු පියවර නොගෙන සිටීමද එතරම්ම ගුණදායක නොවේ.

2013 නත්තල සමරන මෙම අවස්ථාවේදී සියලුම ජාතින්, සියලුම ආගමිකයින්, දුප්පත් පොහොසත්, උගත් නූගත් සැම දෙනා අතර බෙදාගන්නා, එකිනෙකාට සමාව දෙන, විශේෂයෙන් එකිනෙකාව පිළිගන්නා, කිසිවෙකු කොන් නොකරන සමාජයක් ඇතිකර ගැනීමට කටයුතු කිරීමට අදිටන් කරගත යුතු වේ.

සියලු සම්පත්, සැප පහසුකම්, වරප්‍රසාද. තමන් පමණක් භුක්ති විඳින සමාජයක් නොව, සම්පත්, සැප පහසුකම්, වරප්‍රසාද යම් කිසි සාධාරණ ක්‍රමයකට එක් එක් සමාජයට, එකිනෙකාට සමස්තයක් වශයෙන් සියලුම දෙනාට බෙදීයන සමාජයක් බිහිකිරීමට දායක විය යුතුයි.

ශ්‍රී ලංකා භූමිය තුළ සැබෑ සාමයක් ඇතිවීමට නම් අප එකිනෙකා අතර මනා විශ්වාසයක් ඇතිවිය යුතුයි. ඒ විශ්වාසය තුළ එකිනෙකා පිළි ගැනීමක් තිබිය යුතුයි.

එසේ නොමැතිව පෙර කරන ලද වැරදි නැවත නැවත මතක් කරමින් ඒවාට එකට එක කරමින් නැවතත් එකිනෙකා ගැන සැක ඇතිකර ගෙන කටයුතු කළහොත් අප පතන ස්ථිර සැබෑ සාමයක් ඇති නොවේ. හුදෙක් මෙම ක්‍රියාවන් රූපවාහිණී තිරය මත රූප රාමුවක මුද්‍රිත පුවත් පත්වල හෝ ජාත්‍යන්තර සඟරාවක, එහෙමත් නැත්නම් මානව හිමිකම් වාර්තාවකට පලවන ඡායා රූපයකට වාර්තා චිත්‍රපටයක් සඳහා වූ දර්ශණයකට පමණක් සීමා නොවිය යුතුයි.

එකී අවංක හදවතකින් යුතුව ජාතින්, ආගම්, කුල සහ සංස්කෘතීන් අතර බැඳුන අවංක පිළි ගැනීමක්, සමාව දීමක්, එකිනෙකාට ආධාර උපකාර කිරීමක් විය යුතුය. එයද අනාථ කඳවුරක හෝ අනාථ නිවාසයක හෝ ආපදාවකට ලක්වී සිටින අයවෙත ගොස් කැමරාවක් ඉදිරියේ සිදුකරන ඡයාරූප ගැනීමේ දර්ශණයකට සීමාවු බෙදා ගැනීමක් හෝ ආධාර ලබාදීමක් හෝ නොවිය යුතුයි.

නත්තල යනු දෙවි පියාණන් වහන්සේ විසින් මිනිස් සමාජය පාපයෙන් ගලවා ගැනීමට සිය එකම පුත්‍රයාව මෙලොවට එවන ලද දිනය සැමරීමයි. එනම් ජේසුතුමාගේ උපන් දිනයයි.

ජේසුතුමා මිනිස් සමාජය පාපයෙන් ගලවා ගැනීමට මෙලොවට පැමිණි නත්තල් දින සිට ජේසුතුමාව කුරුසයේ ඇණගසා මරණයට පත්කරන ලද මහ සිකුරාදා දිනය දක්වා කාලය තුළ ජේසු තුමාගේ ජීවිතාදර්ශය බැලුවහොත් පරිත්‍යාගවීම, සමාවදීම, බෙදාහදා ගැනීම, අන් අය වෙනුවෙන් කැපවීම, අන් අයව පිළිගැනීම, පැරණි කරන ලද වැරදි අමතක කිරීම, කොන් නොකිරීම සහ සත්‍ය වෙනුවෙන් සමාජ අසාධාරණයන්ට එරෙහිව කථා කිරීම, ඒ වෙනුවෙන් පෙනී සිටීම යන අවස්ථාවන් කොපමණ අපට දැකිය හැකිද? අප යමක් බෙදාහදාගන්නේ අපට රිදීමක් ඇති නොවන ලෙස අපට ඇති වැඩිපුර දෙය බෙදා දීමෙනි.

එය උනත් අප බෙදාහදා ගන්නේ අපගේ නෑදෑයින් මිතුරන් අතරේය. එහෙමත් නැත්නම් අපට ප්‍රති උපකාරයන් ලැබෙන අයත් සමග පමණි.

එසේ නොව අපට හතුරුකම් කරන, ඊර්ෂ්‍යාකරන, කරදර කරන අයටද අපට ප්‍රතිඋපකාර ලබාදීමට නොහැකි අය වෙතද අපගේ මිතුරන් සහ නෑදෑයින් ලෙස සැලකිය යුතුයි. එසේ කිරීමට නොහැකි නම් අපට සැබෑ නත්තලක් සැමරිය නොහැක. 2013 නත්තලද එක්තරා උත්සවයක් සැමරීමක් පමණක් වනු ඇත.

එදා ජේසු බිළිඳුන් බෙත්ලෙහෙමේ ගවලෙනක උපන් බව වල්ගාතරුවකින් දුටු පෙරදිග රජවරුන් සිය නිරහංකාර කම පෙන්වමින් බැහැපත්ව දිළිඳු ගවහල වෙත පැමිණීමේ සිද්ධිය තුළ අපට කියාපාන පණිවිඩය අති ගැඹුරුයි. තම හිත්වල ඇති උඩගුකම, අහංකාරකම නැමති කිරුල ගලවා පසෙක තබා නිර්ව්‍යාජ බැහැපත් කමක් අප සිත් තුළ ඇතිවිය යුතුය.

සුළු ජාතිය - මහ ජාතිය, සුළු ආගම, මහ ආගම. අඩු කුලය, වැඩි කුලය යන්න මොහොතකට අමතක කර සියලුම ජාතින්ට, සියලුම ආගමිකයින්ට, සියලුම සංස්කෘතින්ට සහ සියලුම කුලවලට අයත් යැයි කියන අයට ගෞරව කරමින් එකිනෙකාගේ අයිතිවාසිකම්වලට හා නිදහසට අවහිර නොකරමින් ඒවාට ගෞරව කරමින් අප සතු දේ නැති බැරි, දිළිදු, අසරණ අය සමග බෙදා හදාගෙන කටයුතු කළහොත් එකිනෙකා අතර ඇති දුරස්ථ භාවය.

එකිනෙකා කෙරෙහි ඇති වෛරය සහ ඊර්ෂ්‍යාව නැතිකර ගත හොත් අප සැමට ශ්‍රී ලාංකීය ජනතාවක් වශයෙන් එකම මාතෘ භූමියක් තුළ සාමය, සතුට පිරි සැබෑ නත්තලක් වනු ඇත. එසේ වුවහොත් පමණක් අප සැමට කව්රුවූවත් ඔබ - කොතැන වූවත් - ඔබ - මගේ සහෝදරයා සිතුමට පැතුමට - පටහැනි වූවත් - ඔබ - මගේ සහෝදරයා ජාතිය පෙළපත - මොනව වුවත් - ඔබ - මගේ සහෝදරයා පටපිළි ඇන්දත් - වැරහැලි ඇන්දත් - ඔබ - මගේ සහෝදරයා යැයි කිව හැකිය.

**මොරිස් නානායක්කාර**
පමුණුගම

# දෙවිඳුන් තනි නොකරන නත්තල

නොවැම්බර් මාසය ගෙවී දෙසැම්බර් මාසය උදාවෙන කලට මුළු ගමම අලුත් වෙන්නට පටන් ගන්නේය. මහමුහුදේ රළු ස්වභාවය කෙමෙන් තුරන්වී යයි. වාරකන් සුළඟ නැතිනම් නිරිත දිග මෝසම නිමාවී ඊසාන දිග මෝසම හෙවත් උතුරුකන් සුළඟ ගම හරහා හමන්නට පටන් ගන්නේය. ඉල් පොහොය උදාවෙත්ම සඳඑළියෙන් මුළු ගමම එළිය වෙන්නට පටන් ගනී. සඳ එළියට වැඩියෙන්ම බබලන්නේ ගමේ දෙව්මැඳුරයි. මහ මුහුදට නුදුරින් තරමක් උස් බිමක දෙව්මැඳුර පිහිටා තිබේ. මහ මුහුදේ රළගෙඩි බිඳෙන හඬත් කලපුව දෙසින් හමා එන උතුරුකන් සුළඟේ ඝෝෂාවත් පරයමින් දෙව් මැඳුරේ සංඝාරයෙන් දිනකට තුන් හතර වතාවක් නැගෙන ගාම්භීර නාදය මුළු ගම්මානයම වසාගෙන පැතිරී යනවිට කතෝලික ගමක අසිරිය මොනවට පැහැදිලි වෙයි.

ගමේ ජනතාවට තමන්ගේ දෙව්මැඳුරට වඩා වෙනත් දෙයක් නැති තරම්ය. ඔවුන් දෙව්මැඳුර දෙවියන්ගේම ගෘහය ලෙසින් සලකන්නේ පිතා පුත්‍රයා හා ස්ප්‍රිතු යන තුන්දෙනා වහන්සේලාව එතැන්හි වැඩ සිටින බැවිනි. එපමණක් නොව බැතියෙන් වන්දනාමාන කරන මරිය මවුන් සහ ශුද්ධවන්තයින්ද දෙව්මැඳුරේම ජීවමාන ලෙසට දෙවියන් අසලින්ම වැඩසිටිනා බවත් ඔවුන් විශ්වාස කරති. දෙනෙතට නොපෙනුනත් දිව්‍ය සත්ප්‍රසාදය තුළත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජීවමානව වැඩ සිටිනා බවද තරයේම විශ්වාස කරති. දේව වචනය ලියා ඇති ශුද්ධ වූ ලියවිල්ල හෙවත් ශුද්ධ බයිබලය දේවස්ථානයේ ඇති තවත් අගනා වස්තුවකි. දිව්‍ය සත්ප්‍රසාදයේ සලකුණ හෙවත් රක්තවර්ණ තෙල් පහන අල්තාරය මත නිතරම වාගේ නොනිවී දැල්වෙයි. දෙව්මැඳුරේ ස්ථානගතකර ඇති ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාවන් දකිනවිට එතුමන්ලාව සිහියට නැගෙන අතර එතුමන්ලා කෙරෙහි තිබෙන භය භක්තියද ඉස්මතු වෙයි. එතුමන්ලාගේ ජීවිත ආදර්ශයට ගැනීමට සිත්වෙයි. බොහෝ වේලාවට ගරු පියතුමකු දේව සේවය වෙනුවෙන්ම ලැගුම් ගෙයි වැඩහිඳියි. එතුමාණෝ ජනතාව සමග ඉතාමත් සුහද ලෙසට කාලය ගත කරති.

අපගේ ගම්මානය පුරාණ කතෝලික ගමකි. ජීවත් වෙන්නෝ පාරම්පරික කතෝලිකයෝය. ගමට දෙව්මැඳුරත් දෙව්මැඳුරට ගමත් නැතිවම බැරිබව පෙනෙයි. ගමයි දෙව්මැඳුරයි, මුහුදයි, කලපුවයි ජනතාවගේ ජීවිත වලට සම්බන්ධ වෙන්නේ ගම ආරම්භවූදා පටන්ම යැයි කීවාට කිසි වරදක් නැත. ගමේ පැවැත්වෙන සෑම වැදගත් කාරියකටම නැතහොත් උත්සවයකට මුල් වෙන්නේ දෙව්මැඳුරයි. මූලිකයා වෙන්නේ පියතුමායි. ප්‍රදේශයේ සෑම ගමකම වාගේ දෙව්මැඳුරක් ඇත. මේ සෑම දෙව්මැඳුරක් ආශ්‍රිතව පාසලක්ද ඇත. ගැහැනු පාසල හා පිරිමි පාසල යනුවෙන් ඒවා දෙකට බෙදා ඇත. පාසලේ පාලනය සිදුවෙන්නේ දෙව්මැඳුරෙන්ය. මේ සෑම පාසලක්ම රෝමානු කතෝලික පාසල ලෙස නම් කර ඇත. කන්‍යාරාමයක්ද ගමේ ඇත. ගැහැනු පාසල පිහිටියේ මේ කන්‍යාරාමය අසලමයි. පාලනය කළේ කන්‍යා සහෝදරියන්ය.

ගමේ ජනතාව දෙව්මැඳුරේ පියතුමාට විශාල ගෞරවයක් හා භය භක්තියක් දක්වයි. ඔව්හු පියතුමා ආමන්ත්‍රණය කළේ පියාණෙනි කියාය. නැතහොත් ඔබවහන්සේ කියාය. කිසි විටෙක වත් ඔව් කියා තනි වචනයෙනුත් පිළිතුරු දුන්නේ නැත. කිව්වේ එහෙයි පියාණෙනි කියාය. මඟ තොටකදී පියතුමකු මුණ ගැසුනහොත් දණනමා "ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා" කියා උච්චාරණය කරති. පියතුමාද නැවතී දකුණතින් කුරුස සටහන ඇඳ ආශිර්වාදය දානය කරයි. බාල මහළු ගැහැනු පිරිමි භේදයකින් තොරව සියල්ලෝම එසේ කරති. කතෝලික පරිසරයකට පමණක් හුරුවූ වචන බොහෝමයක් ගමේ ජනතාව නිතර දෙවේලේම භාවිත කරයි. එය පුරුද්දට වාගේ කියවෙයි. භීතියක් ඇතිවූ විට නිසැකවම 'ජේසු මරිය ජුසේ' කියා මුවින් පිටවෙයි. කුතුහලය දනවන යමක් කව්රුන් හෝ කියුවිට එය කාටවත් බියවන්නේ නැත. සණ්ඩු සරුවල් වලට ප්‍රසිද්ධ ගමේ ඕනෑම චණ්ඩියකු වුවද එතුමාට කීකරුය. මිනිස්සු සුළු සුළු ආරවුල් වෙනුවෙන් පොලිසි උසාවි ගියේ නැත. සියල්ල විසඳා දුන්නේ පියතුමාය.

ගමත් පල්ලියත් අතර පවත්නා සම්බන්ධය වඩ වඩාත්



ඇසු කෙනාට 'ජපමාල අම්මා' කියා කිය වෙන්නේ ඉබේම වාගේය. යමක් සත්‍ය බව ඒත්තු ගැන්වීමට දිව්රනවා වෙනුවට 'සන්තානම් මෑණියන් පල්ල හෝ ජපමාල මෑණියන් පල්ල' යන වචනය පිට කරන්නේ භය භක්තියෙන්ය. ජපමාල මෑණියන් යයි කිව්වේ මරුද මඩු පල්ලියේ දේව මෑණියන්ටය. සන්තානම් මෑණියනි කිව්වේ තලවිල පල්ලියේ ශාන්ත ආනා මෑණියන්ටය.

ගමේ පළමු පුරවැසියා ලෙසට සලකන්නේ දෙව්මැඳුරේ පියතුමාණන්වය. ප්‍රදේශයේ ඒජන්ත උන්නාන්සේ සමග වුවද කෙලින් සිටගෙන කතා කළහැකි එකම පුද්ගලයා එතුමාණෝ පමණය. එතුමා හොඳින් පවත්වාගෙන යන පිණිස ගමේ දායක මණ්ඩලයක් සිටියි. ගමේ 'අන්නාවිරාල' නමින් හැඳින්වෙන පුද්ගලයකු සිටියි. මේ අන්නාවි රාල තනතුරට තරමක් උසස් තනතුරක්ද තව තිබේ. එය හැඳින්වූයේ "මුහුප්පු රාල" යන නමින්ය. මේ දෙදෙනාගෙ න්ම ගමේ ජනතාවට සිදුවෙන සේවය අපමණය. අන්නාවි රාලගේ එක් ප්‍රධාන කටයුත්තක් නම් විවාහ මඟුල් සඳහා පෙරනම් කීමය. බොහෝ විට මේ වෙනුවෙන් ඔහුට දෙපාර්ශවයෙන්ම ගතමනාවක් ලැබුණෝය. කෙනෙකුගේ මරණය අන්නාවි රාලත් පියතුමාත් එකතුවෙන තවත් සිරිතකි. මරණයක අවසාන කටයුත්ත සඳහා මේ දෙදෙනා සහභාගි විය යුතුමය. මළාවූ අය වෙනුවෙන් අවසාන යාච්ඤාව උච්චාරණය කරන්නේ අන්නවි රාලයි. ඉරිදා දිව්‍ය පූජාව පටන් ගැනීමට පෙර "ඔරසන් පාඩම් දීම" යනුවෙන් භක්ති අභ්‍යාසයක් ඇත. ඒ කර්තව්‍යයේ මූලිකයා අන්නවිරාලයි. ඔහු මහා හඬින් උච්චාරණය කරන යාච්ඤා වලට බැතිමතුන් හඬ නගාම පිළිතුරු දෙයි. දිව්‍ය පූජාවට පමණක් නොව ජපමාලය උච්චාරණයට, සවස නුවානයටද ඔහු එසේ කරයි. බොහෝ විට අන්නාවි තනතුරත්, මුහුප්පු තනතුරත් ලැබෙන්නේ පරම්පරාවෙන්ය. සම්ප්‍රදාය එසේවුවද ඒවා බිඳ වැටෙන අවස්ථාද තිබේ. 'සන්ක්‍රිස්තියන්' කියා තවත් කැපී පෙනෙන රාජකාරියක් කරන්නෙක්ද සිටී. පියතුමාගේ ප්‍රධාන සහයකයා ඔහුයි. ඔහු සඳහා වෙන්කරන ලද ස්ථානයක්ද දෙව්මැඳුරේ තිබේ. එය හැඳින්වුයේ සන්ක්‍රිස්තියන් කාමරය කියාය. දෙව්මැඳුරේ සිදුකෙරෙන සෑම භක්ති අභ්‍යාසයක් සඳහාම සියල්ල සූදානම් කළ යුත්තේ ඔහු විසිනි. සාන්ධාරය හැඬවීමේ අවසරය ඇති එකම තැනැත්තා ඔහු පමණකි. මෙයත් ගරු නම්බු ලැබෙන තවත් කාරියකි. බොහෝවිට ලැබෙන්නේ පරම්පරාවෙන්ය.

ගමේ ජනතාව සිය සාරධර්ම ඉගෙන ගන්නේ දෙව්මැඳුරෙන්ය. බයිබලය අනුසාරයෙන් කෙරෙන ධර්ම දේශනා තුළින් ඔවුන් යහපත් දෙයම උගත්තේය. වාර්ෂික මංගල්‍ය සතිය තුළ කෙරෙන දේශනා ඇසීමට ඔවුන් බොහෝ ආසා කරති. ඉතාමත් දක්ෂ දේශනාවාදි පියතුමන්ලා දේශනා පවත්වති. දෙව්මැඳුර ජනයාගෙන් පිරීයති. පාරම්පරික කතෝලික සංස්කෘතිය ගමේ දෙව්මැඳුර කේන්ද්‍ර කරගත් සංස්කෘතියක් වශයෙන් හැඳින්විය හැකිය. නීති විරෝධිවූ අශීලාචාර දූෂිත දේවල් කිසිම දෙයක් ගමේ කෙරුනේම නැත. මේ නිසා පොලිස් උසාවි වල ගමේ මිනිසුන්ගේ නම් කියවුනේම නැත. පත්තරවල පළවුනෙද නැත. ශුද්ධ වූ ත්‍රිත්වයට මුල් තැන දීම කාගේත් සිරිතකි. බොහෝ දෙනා බත් පිඟාන කෑමට පෙර කුරුසය ලකුණ අඳිති. වතුර බාල්දිය හිසට වත්කිරීමට ඉස්සර නළලේ කුරුසිය ලකුණු කරති. මුහුදට හෝ කලපුවට පය තැබීමට පෙරද පිතා පුත්‍රයා දමති. ඔවුන් එසේ කරන්නේ ඉතාමත් ප්‍රබෝධ සිතින්ය. දෙවියන් කෙරෙහි ඇති අචල විශ්වාසයෙන් බොහෝ ප්‍රාර්ථනා සිතේ තබාගෙනය.

ග්‍රාමයේ මේ පාරම්පරීක කතෝලීක සංස්කෘතිය භෞතීක වශයෙන් මහ මුහුදෙන්ද, කලපුවෙන්ද, ආධ්‍යාත්මීක වශයෙන් දෙව්මැඳුරෙන්ද, පියතුමාගෙ න්ද, වර්ධනය වෙමින් පරම්පරාවෙන් පරම්පරාවට ගලාගෙන එයි. ඒවාගේම පෝෂණයද වෙයි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගමේ කතෝලීකයා නියම ක්‍රිස්තියානි කාරයෙකි. මධුවිත ටිකක් ගත්තත් අසැබි වචනයක් දෙඩුවත් සුළු ආරවුලක් ඇතිකර ගත්තත් ඔවුන් තමන්ගේ එකම කතෝලීක විශ්වාසයේම සිටිති. මොන අන්දමේ ජීවිත ප්‍රශ්න පැමිණියත් ඔව්හු කිසිම දිනක දෙවියන් අත් හැරියේ නැත. වෙනත් ඇදහිලි පස්සේ වැටුනේ නැති අතර ආගම වෙනුවෙන් ඕනෑම කැපවීමකට ඔවුන් පසුබට වූයේද නැත.

**ආනන්ද රණවීර**
කැපුන්ගොඩ




# ඉපදුන නමුත් නොරැඳුන ජේසු බිලිඳු

## පින් පුරවමු අපි!

අහසට පැනලා තරු ඇහිඳිමු — අපි
වෙරළට දුවලා මුතු අමුනමු — අපි
කුඹුරට බැහැලා සහල් මනිමු — අපි
නත්තල දොරලඟ පින් පුරවමු — අපි

මී වද සොය සොය පැණි ගොටු — බඳිමු
අඹ දඹ රඹුටන් වෙරළුත් — කඩමු
මදු විත වෙනුවට ගී පොත — ගනිමු
නත්තල දොරලඟ අපි පින් — පුරමු

දකුණේ කිරි පැණි කද බැඳ — ගනිමු
යාපා පටුනෙන් තල් අල — ගෙනෙමු
තනිවුනු දරුවන් බිළිඳුන් — සොයමු
නත්තල දොරලඟ අපි පින් — පුරමු

නෙතේ කඳුළු බිඳු පිසදා — හරිමු
සිතේ සුසුම් පොදි ඉවතට — දමමු
වැරහැලි වෙනුවට රන්සළු — අඳිමු
නත්තල දොරලඟ අපි පින් — පුරමු

කුරුසිය අරගෙන දොර දොර — ඇවිදිමු
වෛරය වෙනුවට සාමය — පතුරමු
සමිඳුන් පා යුග වැඳ වැඳ — සිඹගමු
නත්තල දොරලඟ අපි පින් — පුරවමු

**ජෝයි මැල්කම් මහබදුගේ**

තවත් කෙටි පණිවිඩයක් (sms)
ඒත් සුවිශේෂ පණිවිඩයක්....
ගැලවුම්කරුවාණෝ ආයෙත් එනවා....
එය පුදුම, ඒත් සතුටු ආරංචියක්....
කඩිමුඩියෙ ලකලෑස්ති වෙනවා...
"පුතේ, මේ සැරේ ජේසු බිලිඳා ඉපදිලා ඉන්නෙ කොහේද?"
අම්මා එහෙම ඇහැව්වා.....
"තානායමේ වෙන්න ඇති....."
මෙදා සැරේවත් ඉඩක් ලැබෙන්න ඇති."
මම කිව්වා......
"එහෙනම්........ ඔයිට වඩා හොඳ ඇඳුමක් ඇඳගත්තනම්...
මම අලුත් ඇඳුමක් ඇදගත්තා.
call එකක් දීලා Taxi එකක් Hire කරගත්තා.
තානායමට යනවිට මගේ දුප්පත්කම වහගෙන යන්න එපායැ.
තානායම් Gate එක ලඟ හොඳ welcome එකක්.
Recaption එක fantastic
Welcome Drink එක රසට වඩා ලස්සනයි.
ඔක්කම Dance කරනවා.
Drinks ගන්නවා.
play කරනවා.
මම Rooms වල, Verandar එකේ
ජේසු බිළිඳුන් සෙව් නමුත් තානායම තුළ
එතුමාණෝ නොමැති බව වැටහිණි.
අවසානයේ මා නැවතුනේ තානායමේ මුළුතැන්ගෙයි දොරටුව ලඟමයි.
විනෝද වුණා. වියදම් කළා.
මගේ ඇඳුම් ද නැති වී සුපුරුදු තත්ත්වයට වැටුණා
පසු දොරින් එළියට ආ මගේ
නෙත ගැටුනේ ගවලෙනකි
අනිවාර්යයෙන්ම මෙවරද එතුමාගේ ගවලෙනද?
මම යුහුව ගවලෙන තුළට ගියද



එහි කිසිවෙක් නොවීය.
නමුත් තනිව දැවෙන පහනක්,
එහි ගව ඔරුවේ තිබෙනු දුටුවෙමි
මම ගවලෙනයෙන් එළියට ආවේ
පහනද අතැතිවය......
ගවලෙනෙන් එහා මා පුදුමකරවන
දසුනක් මා නෙත ගැටිණි...
එනම්.....
පැල්පත් සමුදායක්....
දිලිඳුන් පිරුණු තැනක්....
සරණය යදින ගමක්.....
ජේසුනී....... නත්තල එතැනද?
ඔබ ඉපදුනේ එතැන ද?
ඔබව මුණ ගැසෙන තුරු
මා ඔබ සොයන්නේ...
ගවලනයන් මා අත රැඳී
ඔබගේ ආලෝකයත් සමගය....

**ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු නිමනි පියතුමා**

# ...ත් යශෝරාවය!

...ත්තයෙන් නැගෙන
...ෝ කුර ගැටුමට
...න ගෙජ්ජි වැලේ
...මය වන්නාහාම ඇසී

...4 දින සවස
...යම් රෑ පූජාවෙන්

තනු රඟත් එදා කැරොල් ගායනා වැඩිම හරියක් දෙමළ බසින් මැ රචිත වු ඒවා ය. ජනප්‍රිය දකුණු ඉන්දියානු වීදි නාටකවලට නෑකම් කී, යාපන ප්‍රදේශයේ තෙරික්කුත්තු නාට්‍ය සම්ප්‍රදායේ ආභාෂය ලත් කිතුනු දෙමළ නාඩගම්වල 'සිංදු' එදා 'කැරොල් සිංදු' ලෙස ද ගැයිණි. නාට්‍යවලදී මෙන්

මෙම නාඩගම් හා සිංදු රාග තාල දෙමළ හා සිංහල බසින් ජනප්‍රිය වැ පැතිරෙමින් පැවැතිණි. ගේබ්‍රියෙල් ප්‍රනාන්දු, පිලිප්පු සිංඤෝ, සී. දොන් බැස්ටියන් ආදීන්ගේ නාඩගම් නූර්තිවල එන සිංදු හෝ ගී තනු රඟත් වෙනත් සිංදු දෙව් මවුන්, සාන්ත ආනා මවුන්, දස පනත, පරමෙණ්ඩලය,



> ...ත් දසත විහිදී යන මධුර මනෝහර කැරොල්
> ...ාදය රැව් පිළිරැව් දෙන්නේය. දැන් මේ බහු
> ...රඹන්නන්ට විනෝදය සපයන කෝලමාය.
> ...ැරොල් කරත්තයට පිටු පසින් ද ගමන් කරමින්
> ...මක් නටන්නේ ය. ඉහට ඉහළින් විහිදී ගිය දිග් වූ
> ...ඇඳුමකින් සැරසුණු හේ පය බැඳි ගෙජ්ජි වැල්
> ...යි.
> ...ත් 'කැරොල් කරත්තය' වු කලී ඇවිදින සුර
> ...ගෙන යන ගොනුන්ගේ උජාරුව ද පංකාදුය. ”

...න තුරා ගම පුරා
...රොල් ගිය මෙරට ගැමි
...විට ජනේරු අවුරුද්ද
... සිය කැරොල් සවාරි
...ර්ණ රසායන දෙමළ

මැ කැරොල් තුළින් ද එකී සිංදු පුන පුනා ඇසීමට කවුරුත් මහත් අභිරුචියක් දැක්වීම ඊට හේතුව විය. හලාවත, වෙන්නප්පුව, කම්මල, දූව, පිටිපන, මෝදර, කොළඹ ආදි කතෝලික ප්‍රදේශවල විශේෂයෙන්

කිතු සිරිත වෙනත් බයිබල් පුවත් තේමා කැරගෙන බැඳුණු සිංදු, කැරොල් ගායනා සඳහා ද ගලපා ගත්හ.

ගම් ප්‍රදේශවල සිටි සංගීත ලැදි - හුරු වැඩිහිටි අය ගැයුමට වැයුමට මනාප තරුණ හා ළමා වරුන් එක්කාසු කැරගෙන නත්තලට කල් යල් බලා කැරොල් කරත්ත සූදානම් කිරීම එකල සුලබ නත්තල් සිරිතක් විය. ගමේ සංගීත මාස්ටර් කැරොල් ගී පද බැන්දේ ය. ඒවාට රාග තාල මුහු කළේ ය. නැති නම් කර්ණ රසායන නූර්ති සිංදු ටිකක් තෝරා ගත්තේය. ළමා වරුන් හා තරුණ කල්ලි පුරුදු පුහුණු කළේය. ගෝලයෝ කැරොල් ගුරුන්ට කීකරු වූහ. එදා හැම කැරොල් නඩයක් මැ වැඩිහිටි ඇල්ම බැල්ම යටතේ මැ මෙහෙයවුණේ ය.

"ඒ කාලෙ ඔය සිංදුත් බොහෝම ආදුරුසමත් ඒවා ආගම දහමට පිටින් කිසිම දෙයක් ඒවායෙ නෑ. අද කාලෙ වාගෙ බොහොමයක් ඉලංදාරි කොල්ලො කුරුට්ටො කැරොල් යනව කියල වල්පල් බයිල බජව් කියා ගෙන, සල්ලි ගරන්න බලාගෙන කැරොල් යාමත් ඒ කාලෙ තිබුණෙ නෑ. කිසි කෙනෙක්ගෙන් එදා සල්ලි ගත්තෙත් නෑ. දින ගණන් රෑ තිස්සෙ කැරොල් ගියේ නොමිලේ කාටත් සාම පණිවිඩේ බෙදා දෙන්නයි.

අපේ කාලෙ කැරොල් එහැම පිටින් ම අද්දියාපනයක් කැරොල් කරත්තෙ ඇඳල තියෙන ආගම් කතන්දර, සිංදුවල තිබ්බ්ච ආදුරුස ගුණ! ඒ පරණ කැරොල් කාරයන්ගෙ සංවරකම, හික්මිච්ච ගතිය. හොඳහිත! බලපුවම එදා කැරොල් කරත්ත ගමන එක විදියක 'ආගම් පාඩමක්.' මේ රටේ පුරාණ කැරොල් කරත්ත යුගයේ හැටි සොබා මතු කරමින්, එදා මෙදා වෙනස පහදමින් අදත් ජීවතුන් අතර සිටින එදා පැරැන්නෙක් කියයි.

ලක්දිව සැපත් අග්‍රගණ්‍ය ධර්ම දූතයාණ කෙනෙකුන් වූ සංගීතඥ ජාකෝමේ ගොන්සාල්වෙස් හිමිපාණන් විසින් ඉන්දීය මිහිරි තනු වලට ගොතන ලද, නාට්‍ය ශෛලිය රැගත්, එමෙන් මැ මෙරට පළමු සිංහල කැරොල් ගී ලෙස සැලකෙන කිතුනු ගී මූදු කරයේ ගැමි කැරොල් කලාකරුවනට නැතිවම බැරි මහාර්ඝ කලා වස්තුන් විය. මුල් කැරොල් කරත්ත යුගයේ ඩෝලය හා රවිකිඤ්ඤයට පසු සර්පිනාව හා තබ්ලාව එක්වීමෙන් එකී සිංදු රස වඩාත් රස වී විචිත්‍ර වූවාට සැක නැත්තේය.

මෙරට ප්‍රතිකාල් සමයත් සමග සැපත් වූ ජේසු නිකායික, ප්‍රැන්සිස්කාන නිකායික පැවිදිවරුන් තම දහම් සේවා ප්‍රදේශවල ගීත නාටකාදි නත්තල් උපාංග ද රෝපණය කළ බව සසුන් තොරතුරු අතර පළවෙයි. එදා මිහිරි ලතින් කැරොල් ගීතිකා දනන් හද බැඳ ගන්නට ඇතුවා නිසැකය. ඔරතෝරියානු ධර්මධරයන් පැමිණීමත් සමග නත්තල් මිහිර වන්නිකරය දක්වාත් පැතිර ගිය බව ගරු එඩ්මන්ඩ් පිරිස් රදගුරු හිමිපාණෝ සාක්ෂ්‍ය ගෙන හැර පෑහ.

'කැන්ටා' නමින් ලතින් බසින් ගැයුනු කැරොල් ගී එදා බහුලව පැතිර ගිය අතර යුරෝපාදි භාෂා ඔස්සේ ද කැරොල් ගීය ජන ප්‍රසාදය දිනා ගනිමින් ව්‍යප්ත වන්නට විය. ප්‍රංශ භාෂාවෙන් 'කැරොලි' යනුවෙන් නම් ගත් බවක් ග්‍රීක් බසින් බිඳී ආ 'කැරොල්' යන්නෙන් වත්මන් නාමය තහවුරු වු බවත් කියැවේ. මෙකී වාද්‍ය මිශ්‍රිත ගීත විශේෂය පුරාණ යවන, රෝම ජන දිවියේ ජනප්‍රියව එංගලන්තය දක්වා ගොස් එතැනින් සෙසු රටවල් පුරා විහිද ගිය බව ද පතළය.

තවද ඇත පුරාණ දෙගම්මැදි දේශයේ හිරු දෙව් වන්දනා ස්තෝත්‍ර ගායනා විශේෂයකැයි සැලැකෙන 'කැරොල්' මුලින් මැ නත්තල් භක්ති ගීත සම්ප්‍රදායක් වූයේ පළමු නත්තල් ගව ලෙන තැනූ අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා පළමු 'කැරොල් ගිතය' ද නිර්මාණය කැර ගවලෙන අබිමුව ගැයීමෙන් පසුව බව කලින් කල ප්‍රචලිත පත පොත පවසයි.

කෙසේ වෙතත් කැරොල් කරත්තයට, කැරොල් සංදර්ශණයට අමතක නොවිය යුතු සදාතනික කැරොල් ගීයක් ඇත. ඒ 'පළමු නත්තල් දා' අහස්තලේ සුරදූතුන් ගැයූ "උත්කෘෂ්ඨ මණ්ඩලයේ දෙවිඳුන්ට මහිමයත් මිහිපිට සුසිත් දනන් හට සාමයත් වේවා!

යන අමිල සාම පණිවිඩය රැගත් 'පළමු නත්තල් කැරොල් ගීය' යි.

වචනයේ පරිසමාප්තාර්ථයෙන් මැ ඒ උත්කෘෂ්ඨ පණිවිඩයේ ගැබ් වු අරුත, වාදනයෙන්, ගීතයෙන්, සැරසිල්ලෙන්, හැසිරුමෙන්, සමගියෙන් පරිත්‍යාග යෙන් මතු කළ (ඊනියා නවීනත්වයෙන් නොකෙලෙසුණු) අපේ පුරාණ කැරොල් කරත්ත යුගයේ ගැමි කලාකරුවන්ගේ අව්‍යාජ සාම බැතිය ඇත ඇත ළඳු කැලෑ වැලි පාරවල් ඔස්සේ ඇදී ගිය කැරොල් කරත්තයේ ගෙජ්ජි හඬත් සමග නැසී මැකී වියකී ගියා සේය!

කිවිසුරු
**පුෂ්පානන්ද පීරිස්**
පල්ලන්සේන



# මරිමව් තුළින් බිළිඳු සොයා යමු

ඉටුකළ මේ මහා දේව දාසිය ගැලවීමේ ඉතිහාසයේ වනිතාවන් අතර උසස්ම තැන්හි ලා සලකන්නේ ඈ ඉටුකළ ඒ උදාර දූතකාර්ය නිසාමය.

නත්තල් කථාවේ සිටින තවත් කාන්තාවකි එලිසබෙත්තුමිය. ලූක් 1:5-7 "ජුදාහි රජ වූ හෙරෝද්ගේ කාලයෙහි අබියාගේ සේරුවට අයිති සෙකරියස් නම් එක් පූජක නමක් විය. ඔහුට ආරෝන්ගේ පෙළ පතෙන් බිරිඳක් වූවාය. ඇගේ නම එලිසබෙත්ය. මේ යුවල සමිඳාණන් වහන්සේගේ සියලු ආඥා හා නියෝග නිවැරදිව පිළිපදිමින් දෙවියන් වහන්සේ අබිමුවෙහි දැහැමින් විසූහ එලිසබෙත් වඳව සිටි බැවින් ඔවුන්ට දරු සම්පතක් නොවීය. ඇරත් ඒ දෙපළ වයස් ගතව සිටියහ. 'එලිසබෙත්' යන නම අරුත නම් "දෙවියන්ට වැඳුම් පිදුම් කරන්නා" ශු. ලූක්තුමාට අනුව එලිසබෙත්තුමිය ආරොන් තුමාගේ දූවරුන්ගෙන් කෙනෙකි. ඇය එම පූජක පරපුරෙන් පැවතේ. නික්මයාම 6:23 "ආරොන් අම්මිනාදබ්ගේ දුව වු නාෂොන්ගේ සහෝදරිවූ එලිෂෙබා බිරිඳ කොට සරණ පාවා ගත්තේය. ඇය ඔහුට දාව නාදාබ්, අබිහු, එලෙයාසර් සහ ඊතාමාර් ලැබුවා ය." එලිසබෙත් සකරියස් නැමති පූජකයාගේ බිරිඳයි. සකරියස් තුමාද දේව මන්දිරයේ පූජක කටයුතු වල පූජක පරපුරකින් එන්නෙකි. එදා පැවති පූජක ව්‍යවස්ථා අනුව භක්තිමත් ස්ත්‍රියක් සරණ පාවා ගැනීමට සකරියස්ට අවසර ලැබුණි. ඒ අනුව මේ යුවල දේව නීති අකුරටම පිළිපැද්ද ඉතා භක්තිමත්, ආදර්ශමත් ශුද්ධ වු පවුලක් විය. ඒ නිසා ශුද්ධ වු ස්නාවක ජුවාම්තුමාගේ මව සහ පියා වීමේ භාග්‍යයද ඔවුන්ට උදාවිය. ලිසබෙත්තුමිය ඉතා අසාමාන්‍ය ලෙස භක්තිවන්තවූද, ඇඩි විශ්වාසයක් තුළ ජීවත් වූවා වූද විවිධ අධ්‍යාත්මික ගුණයන්ගෙන් පොහොනි වූවාවූද කාන්තාවක් විය.

අයහපතින් යහපත උදාකරවන දෙවියන් වහන්සේ සියල්ලක් සතුටින් දරා දෙවියන් සමග භක්ති වන්තව ජීවිතය ගතකළ මේ යුවල තුළ ප්‍රබල හාස්කමක් සිදු කළේය. එනම් ඔවුන්ගේ මහළු වයසේදි දරුවකු දානය කිරීමයි. ලූක් 1:24 "මඳ කලකට පසුව ඔහුගේ බිරිඳ වන එළිසබෙත් ගැබ්ගෙන පස්මසක් රහසිගතව වෙසෙමින්, ලෝකයා අතර පැවති මාගේ නින්දාව පහ කරනු වස් සමිඳාණන් වහන්සේ මෙකල මා දෙස කරුණා වෙන් බලා මේ දේ කළ සේකැයි කීවාය." තවත් පැත්තකින් එළිසබෙත් තුමිය භාග්‍යවන්තියක් වූවාය. එනම් දේව මාතාවන්ගේ කුසේ පිළිසිඳගත් ජේසු සමිඳුන්ව ඒ හැටියෙන්ම හඳුනා ගැනීමට හැකි වූ ලොව ප්‍රථම කාන්තාව බවට ඇය පත්වූවාය. ලූක් 1:39-45 "දින ගණනකට පසු මරියතුමි නැගිට ජුදා කඳුකරයෙහි නුවරකට යුහුව ගොස් සෙකරියස්ගේ ගෙට ඇතුළු වී, එළිසබෙත් හට ආචාර කළාය. එළිසබෙත් මරියතුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට විය. එවිට එළිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව මහ හඬින්, උදම් අනමින් "ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දී ය. ඔබ කුස ඔත් දරු ඵලයද ආශිර්වාද ලද්දේ ය. මාගේ සමිඳාණන්වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් ඔබ කවරෙක්ද? මක්නිසාද ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ කෙණෙහිම මා කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලි ගියේ ය. සමිඳාණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේම යයි විශ්වාස කළ තැනැත්ති භාග්‍යවන්තය යි කීවාය."

ලොව ගැලවුම්කරුගේ උපත මුලින්ම දැනගත් කාන්තාවන් අතුරින් තව එක් කාන්තාවක් වන්නේ අන්නා දිවැස්වරිය යි. සිය සැමියාගේ වියෝවීමෙන් වසර 7 කට පසු ජීවිතයේ සැඳෑ සමය දෙව්මැඳුරේ ගත කළාය. ලූක් 2:36 "තවද ආෂෙර්ගේ පෙළපතින් ආ පානුවෙල්ගේ දුවක වන බොහෝ වයස්ගත අන්නා නම් දිවස්වරියක් වූවාය. විවාහයෙන් පසු සත්වසක් සැමියා සමග විසූ ඈ අසූහතර අවුරුද්දක් වයස් වනතුරු වැන්දඹුවක්ව සිටියා ය. ඈ දේව මාළිගාවෙන් අහක්ව නොගොස් දිවා රෑ දෙකෙහි උපවාස හා යාච්ඤා පවත්වමින් නමස්කාර කළා ය. ඈ ද ඒ මොහොතේම අවුත් දෙවියන් වහන්සේට තුති පුදා, ජෙරුසලමේ විමුක්තිය අපේක්ෂා කළ සියලු දෙනා උන්වහන්සේ ගැන කතා කළාය.

දේවමාතාවන්ගේ උකුලේ සිටි බිළිඳු ජේසු දෙස මහත් විමුක්තියෙන් විමසා බැලූ අන්නා දිවස්වරිය ඒ සැබෑ "මෙසියස්වහන්සේ" නැතහොත් ලෝක ගැලවුම්කරු බව හඬනගා ප්‍රකාශ කළාය. ගැලවීමේ ඉතිහාසයේ නව රාජාංකුරය මෙය බව ඇය හඳුනාගත්තාය. යෙසායා 11:1 "දාවිත්ගේ රජපෙළපත නැමති වෘක්ෂයෙන් රාජාංකුරයක් හටගත්තේය. එහි මුල් වලින් අලුත් පැළයක් නැගී එන්නේය." මිකා 5:2 "එම්බා බෙත්ලෙහෙමේ ඒදාතාතී ජුදාහි ගෝත්‍ර වලින් ඉතා අල්ප වන්නෙහිය. එහෙත්, ඊශ්‍රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැගී එන්නේය. එතුමන්ගේ පෙළපතේ මුල දුරාතීතයෙන් ද පැරණි යුගයෙන් ද එන්නකි."

වසර ගණනාවක් දේව මාලිගාවේ සේවය කරමින් වැන්දඹු ස්ත්‍රියක් ලෙස සේවය කළ අන්නා දිවැස්වරියගේ එකම පැතුම වූයේ තමන්ගේ මරණයට පෙර ජේසු සමිඳුන්ව දැක්ම ය. දැන් එය ඉටුව ඇත. දෙවියන්ට ප්‍රශංසා කරමින් දැන් සතුටු සිතින් තමන්ට දෙවියන් වෙත යා හැකි බව ඇය ප්‍රකාශ කළාය.

එදා ඒ ශ්‍රේෂ්ඨ කාන්තාවන් ජේසු සමිඳුන්ව පිළිගත්තා, රැකබලා ගත්තා පමණක් නොව එතුමා ලෝක ගැලවුම්කරු බව විශ්වාස කර එතුමන් සරණය ගියා. "තොටිල්ල පදවන දෑත රටක් පාලනය කරයි." කීවා සේ මෑණිවරුනි ඔබේ දූ පුතුන් හෙට දවසේ රට ජාතියට සහ ආගමට වැඩදායි යුග පුරුෂයින් කිරීමේ කර්තව්‍යය ඔබට බාරයි. ඔබගේ කුසේ වැඩෙන දරුවා මෙලොව බිහි වන්නත් කලින් ඔහු හා ඇය ගැන "දිවැසි කියන්නට හැක්කේ ඔබට හැර වෙන කාහට ද? මේ නත්තලේ ඔබගේ ඒ දිවැසි කාර්ය හරියාකාරව ඉටුකර ඒ උදාර නත්තල් කථාවේ කාන්තාවන්සේ කවදා හෝ ස්වාමින් වහන්සේ දැක ගැනීමේ භාග්‍යය උදා කරගන්න ඔබ සැමට සුබ නත්තලක් වේවා.

ගොඩැල්ල මීසම් සේවක
**මොරිස් ප්‍රියකාන්ත පියතුමා**